# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,554 — 1965 නොවැම්බර් 12 වැනි සිකුරාදා — 1965.11.12

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (II) ඡේදය — පළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 1477 | පොදුපල් රෙන්ද හා වෙනත් රෙන්ද විකිණීම ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1484 | ආණ්ඩුවේ ගොවාවන දැන්වීම ... ... ... | 1505 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 1486 | රථ බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... | 1501 | පවත්දෙයි කිරීම පිළිබඳ දැන්වීම් ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම ... ... ... | 1502 | විවිධ දැන්වීම් ... ... ... ... | — |


## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි

දීමනා.—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අනතුකාරයක් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. සේවා කොන්දේසි.—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිසන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

3. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස්පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය ගොනුවේ පරිදි තවත් සියයට 5ක් ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩදෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙවුවත් එක් එක් මුදල් වර්ෂය අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබිම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, යථා යෝග්‍ය පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරනු ලබන නව ප්‍රවේශකයන්ගේ ආධුනික/පරීක්ෂා කාලය අවුරුදු තුනක් වන්නේ ය.

(ii) ආණ්ඩුවේ සභා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහාත්, සිංහල භාෂාව 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහාත් දනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන් ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද අනුකූලව නව ප්‍රවේශකයන් ක්‍රියා කළ යුතුය.

(iii) (ඒ) ඔවුන් තම ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයයෙන් ප්‍රවීණතාවක් ලබා ගත යුතුය.

(බී) ආධුනික/පරීක්ෂා කාලය ගතවී අවසන් වූ විට සේවයෙහි ස්ථිර කරන්නේ වෙනත් කරුණු අතර කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ ප්‍රවීණතා තත්ත්වය දක්වා විධිමත් කර ඇති සිංහල ප්‍රවීණතා පරීක්ෂණවලින් ඔවුන් නියමිත කාලය ඇතුළත සමත් වීම ලබිය. නියමිත කාලසීමාව ඇතුළත මෙම ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත් වීමට අපොහොසත් වුවහොත් ඒවා සමත් වන තෙක්, ලැබිය යුතු පඩි වැඩිවීම් නොගෙවා තැබීම එහි ප්‍රතිඵලය වන්නේ ය. තම ආධුනික/පරීක්ෂා කාලය කෙළවර වන විට කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ ප්‍රවීණතා තත්ත්වයේ විභාගයෙන් සමත් නොවන යම් නිලධාරියෙක් වේ නම් ඔහුගේ සේවය කෙළවර කළ හැකි වන්නේ ය.

සංලක්ෂ්‍යය.—සිංහල විධිවිධානයෙන් සුදුසුකම් ලබා රාජ්‍ය සේවයට බැඳෙන අය සේවයෙහි ස්ථිර කිරීමට පෙර සිංහල ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත්වීමේ නියමයෙන් නිදහස් වෙති.

(iv) මෙම ධුරයෙහි සේවය ස්ථිර කරන දින සිට අවුරුදු දෙකක් ඇතුළත සිංහල භාෂාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ ප්‍රවීණතා තත්ත්වයේ කාර්යක්ෂමතා කඩඉම පරීක්ෂණයකින් සමත් වීමටද ඔවුන්ට නියම වනු ඇත.

5. අවශ්‍ය සුදුසුකම්.—(i) තමා ලාංකිකයෙකු වූ බවට සෑහෙන සාක්ෂ්‍ය සහ ඉල්ලුම්කරුවකු විසින් ඉදිරිපත් කළ යුතුය. "ලාංකික" යනුවෙන් සඳහන් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරගැනීමෙන් හෝ රටවැසියකු වූවෙකි.

(ii) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට උසස් විභාගයකින් සමත්ව සිටීම අඩුම අධ්‍යාපනික සුදුසුකම් ලෙස නියම්කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන්නකු සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලත් සිංහලයකු වෙතොත් ඔහු ජ්‍යෙෂ්ඨ

7. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටක ඉදිරිපත් කිරීමට හැම අපේක්ෂකයෙකුම සූදානම්විය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (සැ.යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකාන පාසැලක ප්‍රයෝජනය පිණිස ඉදිරිපත් කරන ලද සහතික හෝ බව්තීස්ම සහතික හෝ භාරගනු නොලැබේ.)

(ආ) උපාධි හෝ සමත්ව ඇති උසස්ම අධ්‍යාපන සහතිකය.

(ඇ) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂක ගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයෙකුගෙන් විය යුතුයි.

(ඈ) ලබා ඇති වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඉ) සිංහල භාෂාවෙන් සහ/හෝ දෙමළ භාෂාවෙන් සමත් උසස්ම අධ්‍යාපන සහතිකය.

සැලකිය යුතුයි.—

(i) අයදුම් පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපත් හෝ නො ඇමිණිය යුතුයි.

(ii) ඉල්ලූ අවස්ථාවේදී ලියකියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් අපේක්ෂකයින්ගේ අයදුම්පත් සලකා බලනු නො ලැබේ.

8. අයදුම්පත් සහ ඒ සම්බන්ධ වෙනත් ලියුම් ගනුදෙනු සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙතට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නො එවිය යුතුය.

9. මෙම ගැසට් පතේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ. අයදුම් පත් ලැබුන වග දන්වනු ලබන අතර එය, භාර ගන්නා අවසාන දින සිට තුන් දිනක් ඇතුලත තම අයදුම් පත ලැබුණු බව දන්වන ලිපියක් නොලත් අයදුම්කරුවකු වේනම් වහාම ඒ වග රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත දැනුම් දිය යුතුය. කිසියම් අයදුම්කරුවෙකු මෙම අවශ්‍යතාවය පැහැර හැරියහොත් තම අයදුම්පත සලකා බලනු වස් ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට අහිමිවනු ඇත.

බී. ආර්. එල්. බාලසූරිය,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

1965 නොවැම්බර් මස 6 වැනි දින,
කොළඹ, ගාලු මුවදොර, මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දීය.
තැ. පෙ. 500.

11-444/1—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය.

---

අංකය : ඒබී. 57/එක්ස්. 1604/65.

## සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුවේ ගුවන් තොටුපල කළමනාකරු තනතුර

සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුවේ ගුවන් තොටුපල කළමනාකරු තනතුර සඳහා ඉල්ලුම්පත් එවන ලෙස මෙසින් අරාධනය කරනු ලැබේ. මෙම කාර්යාලය මඟින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි වූ ඉල්ලුම් පත් පහත සඳහන් දිනයන්ට හෝ ඊට පෙර මවෙත ලැබෙන සේ එවිය යුතුයි.

(අ) මෙරට අයදුම් පත් : 1965 නොවැම්බර් මස 26 වැනිදා.

(ආ) විදේශ අයදුම් පත් : 1965 දෙසැම්බර් මස 3 වැනිදා.

සටහන්.—(i) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලියමනක් තැපැලේදී නැතිවූ බවට හෝ ප්‍රමාදවූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතුයි;

(ii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝරම විදේශයන්හි සිටින ලංකා නියෝජිතයින්ගේ කාර්යාලවලින් ලබාගත හැකිය. තම ඉල්ලුම් පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්නව හෝ රටේ පත්කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාලසීමාව ඇතුලතදී භාරදීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන;

(iii) වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයන්හි තෝරාගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත්, ලංකාවට පැමිණීම සඳහා, ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතුය.

2. සේවයේ නියුක්ත කරවීමට වගන්ති හා කොන්දේසි :

(අ) තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිත ය. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය. පත්වීම තුන් අවුරුදු ආධුනික කාලසීමාවකට යටත් ය. දැනට රජයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් හිමි තනතුරක් දරන නිලධාරියෙකු තෝරා ගනු ලැබුවහොත් ඔහු නියමිත කාලයක් වැඩ බැලීමේ පදනම මත පත් කරනු ලැබේ.

(ආ) පත්වීම වූකලී තෝරාගත් අයදුම්කරු සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබන ඇස් හා කන් පරීක්ෂාවක් ඇතුලුව වෛද්‍ය පරීක්ෂණයකින් සමත් වීමට යටත් වනු ඇත. අවශ්‍ය දෘෂ්ටික හා ශ්‍රාව්‍යතාවය පිළිබඳ තත්ත්වයක් වන්නේ ගුවන් ගමනා ගමන පාලක සඳහා ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා පිළිබඳ ගිවිසුමෙහි 1 වැනි අනුබද්ධයේ නියම කොට ඇති ඒවා ය.

(ඇ) තෝරාගනු ලැබූ අපේක්ෂකයා, දෙපාර්තමේන්තුව මඟින් පිළියෙල කරනු ලැබිය හැකි ගුවන් ගමනා ගමනය, සංඥා හා ගුවන් ගමන් සංවිධාන ඇතුලු ගුවන් තොටුපොල පාලනය පිළිබඳ පුහුණුවීමේ පාඨමාලාවක් හැදෑරිය යුතුය. අභ්‍යාස පාඨමාලාව හැදෑරීමට පෙර, එයට වැය වෙන මුදල අනුව නියම කෙරෙන යම් කාල පරිච්ඡේදයක් රජයට සේවය කරන බවට ඔහු විසින් ගිවිසුමකට එළඹීම අවශ්‍යය.

3. වැටුප් සහ දීමනා.—මෙම තනතුරට හිමි වැටුප් ක්‍රමය මෙසේය :

වර්ෂයකට රු. 4,080 න් පටන් ගෙන රු. 360 බැගින් වාර්ෂික වැටුප් වර්ධකයන් 12 කින්ද, රු. 480 බැගින් වැටුප් වර්ධකයන් 10 කින්ද, රු. 13,200 දක්වා නගින්නකි. රු. 8,400 ට හා රු. 11,760 ට පෙර කාර්යක්ෂමතා කඩඉමද, රු. 11,280 වේ වැටුප් ලක්ෂයේදී දෙවර්ෂයක නැවතීමක්ද සහිතය.

සටහන.—තෝරාගනු ලබන අයදුම්කරුවන්ගේ සුදුසුකම් හා පළපුරුද්ද අනුව, භාණ්ඩාගාරය සමග සාකච්ඡා කර, මෙම වැටුප් ක්‍රමයේ පියවරක් මත තබනු ලැබේ.

4. සුදුසුකම්.—සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සෑහෙනතරම් සාක්ෂි ඉදිරිපත් කළ යුතු යි :—

(අ) විශිෂ්ඨ චරිතයකින් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව ;

(ආ) 1965.11.26 වැනි දිනට තමාගේ වයස අවුරුදු 45 ට නොවැඩි බව ;

(ඇ) පහත සඳහන් සුදුසුකම් ඇති බව :

(i) රජයේ දෙපාර්තමේන්තුවක මාණ්ඩලික නිලධාරියෙකු වශයෙන් යටත් පිරිසෙයින් දස වර්ෂයක පළපුරුද්දක් හෝ වානිජ ව්‍යාපාරික ආයතනයක විධායකයකු වශයෙන් දස වර්ෂයක පළපුරුද්දක් හෝ සහිතව පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධාරියෙකු විය යුතු ය.

(ii) දෙපාර්තමේන්තු අයදුම්කරුවෝ : ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගයේදී සිංහල/දෙමළ භාෂාව සහ අංක ගණිතය/ගණිතය ඇතුලුව, දෙවතාවකට නොවැඩි වාර ගණනක දී, විෂයයන් 6 කින් ලබන ලද සාමාර්ථය හෝ උසස් අධ්‍යාපනික සුදුසුකම් සහිතව පහත සඳහන් කිසියම් ශ්‍රේණියක දස අවුරුද්දකට නොඅඩු පළපුරුද්දක් :—

1. ගුවන් තොටුපල පාලක.
2. සහකාර ගුවන් තොටුපල පාලක.
3. සහකාර ගුවන් විදුලි ඉංජිනේරු.
4. ගුවන් විදුලි පරීක්ෂක.
5. ජ්‍යෙෂ්ඨ ගුවන් ගමනාගමන පාලන නිලධාරී.
6. ගුවන් ගමනාගමන පාලන නිලධාරී.
7. සංඥා නිලධාරී.
8. ගගන නාවික පරීක්ෂක.
9. සහකාර ගගන නාවික පරීක්ෂක.

සටහන.—දැනටමත් රජයේ සේවයේ නියුක්ත නිලධාරීනට වයස් සීමාව අදාල නොවේ.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතු යි :—

(අ) උප්පැන්න සහතිකය (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකාන පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බව්තීස්ම සහතික භාර ගනු නොලැබේ).

(ඈ) උපාධිය හෝ උසස් ම අධ්‍යාපනික සහතිකය.

(ඇ) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂක තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයා ගෙන් හෝ විය යුතුයි.

(ඇ) වෘත්තිය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඉ) සිංහල විෂයයෙන් සමත් උසස් ම විභාගය පිළිබඳ සහතිකය.

සැ. යු.—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්වූ අවශ්‍යවාචික ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයන්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. රජයේ සේවයේ නියුක්ත නිලධාරීන් තම ඉල්ලුම් පත්‍ර දෙපාර්තමේන්තු ප්‍රධානයාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේකුදු වුවත්, ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දින හෝ ඊට පළමු ඔහු වෙත ලැබෙන උපදී ඉල්ලුම් පත්‍රයේ අනුපිටපතක් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත කෙලින් ම ඉදිරිපත් කළ යුතුය.

7. අයදුම්පත් හා ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් නාමට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුයි.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ, (II) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රජය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්පත් ලැබුනු බව දන්වනු ඇත. සත් දිනක් ඇතුළත තම අයදුම්පත ලැබුනු බව දන්වන ලිපියක් නොලත් අයදුම්කරුවකු වෙත් නම් විගම ඒ බව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත දැන්විය යුතුය. කිසියම් අයදුම්කරුවෙකු මේ අවශ්‍යතාවය පැහැර හැරියහොත් තම අයදුම්පත් සලකා බලනු වස් ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට අහිමි වනු ඇත.

බී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව ලේකම්.

1965.11.6 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දිය,
තැ. පෙ. 500.

11-444/2—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

---

## රජයේ දේශ සංචාරක කාර්යාංශය

### භෝජනාගාර පාසැලේ ඇබෑර්තු

රජයේ දේශ සංචාරක කාර්යාංශය යටතේ පාලනය වන කොළඹ, භෝජනාගාර පාසැලේ සේවය පිණිස පහත සඳහන් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ:—

(අ) සහකාර චෙෆ් තනතුරු 2යි.

(ආ) ප්‍රධාන භෝජනාගාර සේවක (හෙඩ් වේටර්) තනතුරු 2 යි.

(ඇ) මත්පැන් විකුණන්නා (බාර්මන්) තනතුරු 1 යි.

(ඈ) රෙදි පිරිසුදු කරන්නා (ලොන්ඩ්‍රි ඔපරේටර්) තනතුරු 1 යි.

(ඉ) සහකාර රෙදි පිරිසුදු කරන්නා (ඇසිස්ටන්ට් ලොන්ඩ්‍රි ඔපරේටර්) තනතුරු 1 යි.

(ඊ) හෝල් පෝටර් තනතුරු 1 යි.

2. එක් එක් තනතුර සඳහා අඩුම වශයෙන් පහත සඳහන් සුදුසුකම් අවශ්‍යවේ:—

(1) සහකාර චෙෆ් (තනතුරු 2)—වැටුප් : රු. 2,820—180—රු. 5,310.

වයස.—අවුරුදු 25 සිට 45 දක්වා.

පළපුරුද්ද.—ඉහළ පෙළේ හෝටලයක හෝ ආපන ශාලාවක සහකාර චෙෆ් කෙනෙකු හෝ මාස්ටර් කුක් කෙනෙකු ලෙස හෝ අඩුම ගණනේ අවුරුදු 5 ක පළපුරුද්දක් ඇතිව සිටිය යුතුයි. එක තනතුරක් පේස්ට්‍රි චෙෆ් කෙනෙකු හෝ පළපුරුදු පේස්ට්‍රි කුක් කෙනෙකු හෝ වෙනුවෙන් වෙන්කොට තබනු ලැබේ.

(2) ප්‍රධාන භෝජනාගාර සේවක (හෙඩ් වේටර් තනතුරු 2)—වැටුප් : රු. 660—30—රු. 924.

වයස.—අවුරුදු 30 සිට 45 දක්වා.

පළපුරුද්ද.—ඉහළ පෙළේ හෝටලයක, ආපන ශාලාවක හෝ සමාජ ශාලාවක හෝ හෙඩ් වේටර්, බට්ලර් හෝ සහකාර බට්ලර් කෙනෙකු ලෙස හෝ අඩුම ගණනේ අවුරුදු 10 ක පළපුරුද්දක් තිබිය යුතුවේ.

(3) මත්පැන් විකුණන්නා (බාර්මන් තනතුරු) 1—වැටුප් : රු. 660—30—රු. 924.

වයස.—අවුරුදු 30 සිට 45 දක්වා.

පළපුරුද්ද.—ඉහළ පෙළේ හෝටලයක, ආපන ශාලාවක හෝ සමාජ ශාලාවක "බාර්මන්" කෙනෙකු ලෙස අඩුම ගණනේ අවුරුදු 5 ක පළපුරුද්දක් තිබිය යුතුවේ. "මිශ්‍ර මත්පැන්" (කොක්ටේල්) සෑදීමේ සහ වයින් වර්ග ගබඩා කිරීමේ පළපුරුද්දක් ඇති අයට වැඩි සැලකිලි දක්වනු ලැබේ.

(4) රෙදි පිරිසුදු කරන්නා (ලොන්ඩ්‍රි ඔපරේටර්)—වැටුප් රු. 660—30—රු. 840.

වයස : අවුරුදු 25 සිට 45 දක්වා.

සුදුසුකම්.—(1) විදුලි බලයෙන් ක්‍රියා කරන රෙදි සේදීමේ යන්ත්‍රයක් ක්‍රියා කරවීමේ අවුරුදු 5 ක පළපුරුද්දක් ඇතිව සිටීම, (2) නිරෝගි ශක්තිමත් අයෙකු වීම.

(5) සහකාර රෙදි පිරිසුදු කරන්නා (ඇසිස්ටන්ට් ලොන්ඩ්‍රි ඔපරේටර්)—වැටුප් : රු. 540—30—රු. 804.

වයස.—අවුරුදු 25 සිට 40 දක්වා.

සුදුසුකම්.—1. විදුලි බලයෙන් ක්‍රියා කරන රෙදි සේදීමේ යන්ත්‍රයක් ක්‍රියාකරවීමේ (සහකාර ලොන්ඩ්‍රි ඔපරේටර් කෙනෙකු) ලෙස අඩුම ගණනේ අවුරුදු 5 ක පළපුරුද්දක් ඇතිව සිටීම. 2. එම යන්ත්‍ර නඩත්තු කිරීමේ වැඩ ගැන හොඳ දැනීමක් ඇතිව සිටීම.

(6) හෝල් පෝටර්—වැටුප් : රු. 660—30—රු. 924.

වයස.—අවුරුදු 25 සිට 40 දක්වා.

සුදුසුකම්.—1. නිරෝගිමත් හා ශක්තිමත් දේහයකින් යුත් කඩවසම් පෙනුමක් ඇති අයෙකු වීම.

2. ඉංග්‍රීසි සහ/හෝ වෙනත් විදේශීය භාෂාවන් චතුර ලෙස කතා කිරීමේ හැකියාවක් ඇතිව සිටීම.

යුද හමුදාවේ හෝ නාවුක හමුදාවේ හෝ පොලිස් හමුදාවේ හෝ අඩුම ගණනේ අවුරුදු 5 ක සේවා පළපුරුද්දක් ඇති අයට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

3. බඳවා ගැනීමේ කොන්දේසි සහ සේවා කොන්දේසි :

(i) මෙම පත්වීම් තාවකාලික පදනමක් මත වේ. රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදලට දායක මුදල් ගෙවිය යුතුයි.

(ii) තෝරාගනු ලබන අයදුම්කරුවන් කෙටි කාලීන දැනුම් දීමකින් පසු පත්වීම් භාර ගැනීමට සූදානමින් සිටිය යුතුයි.

(iii) තෝරාගත් අයදුම්කරුවන් ඉහත සඳහන් වැටුප් ක්‍රමයේ මූලික වැටුප මත පත්කරනු ඇත. ආණ්ඩුවේ ප්‍රමාණයන්ට එකඟව ජීවනාධාර දීමනා සහ විශේෂ ජීවනාධාර දීමනාදිය ගෙවනවා ඇත.

4. ඉල්ලුම්පත්‍ර දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොඑවිය යුතු වන අතර, "කොළඹ 1, චෛත්‍ය පාරේ, රජයේ දේශ සංචාරක කාර්යාංශයේ අධ්‍යක්ෂ" යන ලිපිනයට 1965 නොවැම්බර් 26 දිනට හෝ එයට ප්‍රථම ලැබෙන සේ එවිය යුතු යි.

5. අයදුම්කරුගේ චරිතය සහ පළපුරුද්ද පිළිබඳව මෑතකදී ලබාගත් සහතිකවල පිටපත් (මුල් පිටපත් නොවේ) අයදුම් පත්‍රයට අමුණා එවිය යුතුයි.

6. මේ සම්බන්ධයෙන් මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ පළවන රාජ්‍ය සේවා තනතුරුවලට කරනු ලබන පත්කිරීම්වලට අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරවනු ලැබේ.

ආර්. ඒ. එම්. සී. එස්. සේනාරත්න,
රජයේ දේශ සංචාරක කාර්යාංශයේ
වැඩබලන අධ්‍යක්ෂ.

1965 නොවැම්බර් 6 වැනි දින,
කොළඹ 1, රජයේ දේශ සංචාරක කාර්යාංශයේ දීය.

11-464—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

## රාජ්‍ය ලේඛන රක්ෂක දෙපාර්තමේන්තුව

### සහකාර රාජ්‍ය ලේඛනාරක්ෂක තනතුර

රාජ්‍ය ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ සහකාර රාජ්‍ය ලේඛනා රක්ෂක තනතුරක් සඳහා ඉල්ලුම් පත් 1965 දෙසැම්බර් 10 දින වනතෙක් නුගේගොඩ, ගංගොඩවිල රාජ්‍ය ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ රාජ්‍ය ලේඛනාරක්ෂක විසින් භාරගනු ලැබේ. මෙම දැන්වීම අවසානයෙහි දක්වෙන නිදර්ශන ආකෘති පත්‍රය අනුව ඉල්ලුම් පත් පිළියෙළකර එවිය යුතුවේ.

2. වැටුප් ක්‍රමය.—මෙම තනතුරට නියමිත වැටුප් ක්‍රමය වසරකට රු. 3,900 න් පටන්ගෙන වසරකට රු. 180 බැගින් 8 වාරයක් හා වසරකට රු. 240 බැගින් 6 වාරයක්ද වැඩිවී වසරකට රු. 6,780 තෙක් යයි. වසරකට රු. 4,800 හා රු. 5,580 පඩි පියවරවලට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉම් තිබේ.

3. පත්වීමේ කොන්දේසි.—(i) මෙම තනතුර ස්ථිර විශ්‍රාම වැටුප් සහිතය.

(ii) තෝරා පත්කරනු ලබන අයදුම්කරු විසින්, සුළු කාල සීමාවකදී කෙරෙනු ලබන දැන්වීමකින්ම වැඩ භාරගැනීමට හැ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක රාජකාරිය කිරීමට සූදානමින් සිටිය යුතුය.

4. අවශ්‍ය සුදුසුකම්.—සෑම අයදුම්කරුවෙකු විසින්ම තමා—

(අ) 1965 දෙසැම්බර් 10 වන දා වනවිට අවුරුදු 35 කට නොවැඩි බවටත්, (දැනට රජයේ සේවයේ නියුක්ත අයවළුන්ට මෙම වයස් සීමාව නොයෙදේ.)

(ආ) මනා චරිතයක් හා කායික ශක්තිය අත්තෙකු බවටත්,

(ඇ) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධරයකු බවටත් සෑහීම ඉදිරිපත් කළ යුතුවේ. රාජ්‍ය ලේඛන විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා උපාධිය අතිරේක සුදුසුකමක් හැටියට සලකනු ලැබේ.

5. අයදුම්කරු විසින් ඉල්ලුම් පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් පිටපත් නොවේ) අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය හෝ (උප්පැන්න ලියා පදිංචි නොකළ අපේක්ෂකයින් සම්බන්ධයෙන් වූ විට) රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරන ලද වයස පිළිබඳ විශේෂ සහතිකයක් (බව්තීස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලා සඳහා ඇති ව්‍යවස්ථා සංග්‍රහය අනුව නිකුත්කර ඇති උප්පැන්න සහතිකය භාරගනු නොලැබේ.)

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපනික හා වෘත්තීය සහතිකය.

(ඇ) අයදුම්කරුගේ චරිතය පිළිබඳව හා මෙම තනතුරට ඇති සුදුසුකම් විදහා දක්වෙන, මෑතදී ලබා ගන්නා ලද සහතික තුනක්. (දැනට රජයේ සේවයේ නියුක්ත වූවන්ට මෙම අවශ්‍යතාවය නොයෙදේ.)

සැලකිය යුතුයි.—

අමුණා එවනු ලබන සහතික පිටපත් ආපසු එවනු නොලැබේ.

6. දැනට රජයේ සේවයේ නියුක්ත අයවළුන්ගෙන් නියමිත දිනට පසුව ලැබෙන ඉල්ලුම් පත් භාරගනු ලබන්නේ, එම ඉල්ලුම් පත් ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානයන් වෙත නියමිත දිනට පෙර ලැබී, එම දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් ප්‍රමාදවීමට ඇතිවූ පිළිගත හැකි හේතූන් දක්වා ඉල්ලුම් පත භාරගැනීම නිර්දේශ කොට ඇත්නම් පමණි.

7. මෙම තනතුර සඳහා එවනු ලබන ඉල්ලුම් පත් හෝ ඊට අදාළ අනිකුත් ලියවිලි රාජ්‍ය ලේඛනාරක්ෂක නමට මිස මෙම දෙපාර්තමේන්තුවේ අනිකුත් කිසිම නිලධරයකුගේ පෞද්ගලික ලිපිනයට නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I කොටසේ (II) වැනි ඡේදයේ පටන් ගැන්වෙන පළකර ඇති රජයේ සේවයේ තනතුරු වලට පත්කිරීම සම්බන්ධයෙන් යෙදෙන සාමාන්‍ය කොන්දේසි ද බලනු මැනවි.

9. එවනු ලබන සෑම ඉල්ලුම් පතක්ම ලැබුණු බව දන්වනු ලැබේ. ඉල්ලුම් පත් භාරගැනීමේ අවසාන දිනට, පසු දින 7 ක් ඇතුළතදී යම් අයදුම්කරුවකුට තමාගේ ඉල්ලුම් පත ලැබුණු බව නො දන්වූව හොත්, ඒ බව වහාම නුගේගොඩ, ගංගොඩවිල රාජ්‍ය ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ රාජ්‍ය ලේඛනාරක්ෂකට දන්විය යුතුය. මේ අවශ්‍යතාව අනුව ක්‍රියා නොකරන අයදුම්කරුවනට තමන්ගේ ඉල්ලුම් පත් සම්බන්ධව සලකා බැලීමේ සියළුම හිමිකම් නැතිවෙනවා ඇත.

අමරවංශ දේවරාජ,
රාජ්‍ය ලේඛනාරක්ෂක.

1965 නොවැම්බර් 2 වෙනි දින,
නුගේගොඩ ගංගොඩවිල,
රාජ්‍ය ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ දීය.

### නිදර්ශන ආකෘති පත්‍රය

#### රාජ්‍ය ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ සහකාර රාජ්‍ය ලේඛනා රක්ෂක තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය

1. සම්පූර්ණ නම :————.

2. ලිපිනය :————.

3. (අ) උපන් දිනය :————.

(ආ) 1965 දෙසැම්බර 10 වෙනිදා වනවිට වයස :————.
(උප්පැන්න සහතිකයේ මුල් පිටපත නොව පිටපතක් ඈමිණිය යුතුය)

4. ජාතිය හා ලබා ගත් අගුරු :————.

5. අයදුම්කරුගේ පියාගේ සම්පූර්ණ නම :————.

6. අයදුම්කරුගේ :—
(අ) පියාගේ උපන් ස්ථානය :————.
(ආ) පිය පාර්ශවයේ ආතාගේ උපන් ස්ථානය :————.
(ඇ) පිය පාර්ශවයේ මුත්තාගේ උපන් ස්ථානය :————.

7. කසාද බැඳලාද? නැතිද? වැන්දඹු පුරුෂයෙක් ද? යනවග :————.

8. අධ්‍යාපනික සුදුසුකම් හා සමත්වූ ඉහළම විභාගය හා දිනය :————.

9. පාසලෙන් අස්වූවාට පසු රැකියාවක යෙදුනේ නම් ඒ පිළිබඳ විස්තර :————.

10. විශේෂ ඉල්ලීම් ඇත්නම් ඒ පිළිබඳ විස්තර :————.
(අත්‍යාස, සුදුසුකම්, පළපුරුද්ද යනාදිය ගැනයි)

11. ඉදිරිපත් කර ඇති චරිත සහතික ලබාගත් අයවළුන්ගේ නම් සහ ලිපිනය :————.

12. වෙනත් වැඩි තොරතුරු ඇත්නම් :————.

මා විසින් මෙම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කරන්නට යෙදුන විස්තර සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. මේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය හෝ වැරදි දෙයක් සඳහන් කර තිබෙන බව තනතුරට තෝරා ගැනීමට කලින් අනාවරණය වුවහොත් මා එයින් නුසුදුසු බවට පැමිණෙනමි. පමණක් නොව, තෝරා ගැනීමෙන් පසුව, ඒ බව අනාවරණය වුවහොත්, කිසිම වන්දි ගෙවීමක් නොමැතිව, මා රාජකාරියෙන් පහකර ඇරීමට හැකි බවද දනිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

11-371—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

## රබර් සමීක්ෂකයන් (තාවකාලික) ලියාපදිංචි කිරීම

විදේශවලට පටවන රබර් පරීක්ෂාකිරීම සඳහා, වෙළඳ ද්‍රව්‍ය මිලට ගැනීමේ දෙපාර්තමේන්තුවේ රබර් සමීක්ෂකයන් වශයෙන් වික දෙනකු ලියා පදිංචි කිරීම පිණිස ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. මෙම තනතුරු තාවකාලිකය. ආණ්ඩුව යටතේ ස්ථාවර රැකියාවකට හිමිකම් ඉල්ලීමේ අයිතිවාසිකමක් මෙම ලියාපදිංචි කිරීමෙන් ඇති වන්නේ නැත. මගේ කාර්යාලයේ දී ලබා ගත හැකි නියමිත ආකෘති පත්‍රයන්හි කළයුතු ඉල්ලුම් පත්‍ර "වෙළඳ ද්‍රව්‍ය මිලට ගැනීමේ කොමසාරිස්, සිවිල්නි මහල, මිලර්ස් ගොඩනැගිල්ල, කොළඹ 1" යන ලිපිනයට 1965 නොවැම්බර් 30 වැනි දින හෝ ඊට ප්‍රථම හෝ ලැබෙන සේ ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුය.

ඒ. ආර්. නවරත්නරාජා,
වෙළඳ ද්‍රව්‍ය මිලට ගැනීමේ කොමසාරිස්.

1965 නොවැම්බර් 5 දා,
කොළඹ දීය.

11-420—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

## මහනුවර දිස්ත්‍රික්කයේ අඹගමුව කෝරළේ හැටන් ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය

මහනුවර දිස්ත්‍රික්කයේ අඹගමුව කෝරළේ හැටන් ප්‍රදේශය තුළ හදිසි මරණ පරීක්ෂක තනතුර සඳහා අයදුම්පත් එවන ලෙස සුදුස්සන්ට මෙයින් ආරාධනය කරමි. පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රයේ අන්දමට පිළියෙල කරන ලද අයදුම්පත් වර්ෂ 1965 දෙසැම්බර් මස 3 වැනි දිනට හෝ ඊට ප්‍රථම මා වෙත ලැබෙන්නට එවිය යුතුයි.

2. මෙම තනතුර සඳහා ස්ථිර වැටුපක් නොමැත. මරණ පරීක්ෂණ සඳහා එකකට රු. 7.50 බැගින් ගෙවනු ලැබේ.

3. අවශ්‍ය සුදුසුකම්.—

(අ) ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනට අවුරුදු 30කට නොඅඩු බවට,

(ආ) විශිෂ්ඨ චරිතයක් හා මනා සෞඛ්‍ය තත්වයෙන් යුක්ත බවට,

(ඇ) මහනුවර දිස්ත්‍රික්කයේ අඹගමුව කෝරළේ හැටන් ප්‍රදේශ සීමාව තුළ ස්ථිර පදිංචියක් තිබෙන බවට,

(ඈ) (i) 1925 සහ 1944 අතර කාලයෙහි ස්වභාෂා පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ සිංහල භාෂාව සහිත ඉංග්‍රීසි පාඨශාලා හැර යාමේ සහතික පත්‍ර විභාගය හෝ සිංහල භාෂාව සහිත අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය,

(ii) සිංහල භාෂාව සහිත ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ ඒ සමාන හෝ ඊට උසස් විභාගයකින් සමර්ථ වී ඇති බවට, සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි.

4. අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ ඉල්ලුම් පත්‍ර සමග පහත සඳහන් සහතිකවල පිටපත් එවිය යුතුය:—

(අ) උප්පැන්න සහතිකය.

(අ) ලබා ඇති උසස්ම අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඈ) චරිතය පිළිබඳ මෑතකදී ලබා ගත් සහතික දෙකක්.

5. ඉල්ලුම් පත් ලැබුණ බව දන්වනු නොලැබේ.

ඊ. ඇම්. විජේනායක,
මහනුවර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

1965 නොවැම්බර් මස 3 වන දින,
මහනුවර දිසාපති කාර්යාලයේදී ය.

### ආදර්ශ ඉල්ලුම් පත්‍රය

1. අයදුම්කරුගේ නම සහ ලිපිනය :———.

(පැහැදිලි අකුරෙන්)

(අ) අගට යෙදෙන නම :———.

(ආ) අනික් නම් :———.

2. ස්ථිර පදිංචි ස්ථානය හා එහි පදිංචි කාලය :———.

3. (අ) වර්ෂ 1965. 12. 3 වැනි දිනට සම්පූර්ණ වයස :—
අවුරුදු :——, මාස :——, දවස් :——.

(ආ) උපන් දිනය හා ස්ථානය :———.

4. විවාහක හෝ අවිවාහක ද යන වග :———.

5. අධ්‍යාපන සුදුසුකම් :———.

6. දැනට කරන රක්ෂාව :———.

7. ණය කරදර තිබේද ? එසේ නම් ඒ පිළිබඳ විස්තර :———.

8. තමා සතු දේපලවල වටිනාකම හා ප්‍රමාණය :———.

9. ඉල්ලුම්කරු කිසියම් චෝදනාවකට වරදකරුවී අධිකරණයක් මගින් දඬුවම් ලබා තිබේද ? එසේ නම් ඒ පිළිබඳ විස්තර :———.

10 මෙම තනතුර සඳහා වෙනත් හිමිකම් පිළිබඳ විස්තර :———.

ඉහත සඳහන් තොරතුරු සත්‍ය බවත් නිවැරදි බවත් මෙයින් සහතික කරමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

11-385—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

---

## ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලය

### සහකාර නීති නිලධාරි ඇබෑර්තුව (VI වැනි විධායක ශ්‍රේණිය)

අයදුම්කරුවන් ලංකා සුප්‍රිම් උසාවියේ අද්විකාත් කෙනෙකු හෝ පෙරකදෝරුවකු විය යුතුය. වයස අවුරුදු 30 ට අඩුවීම වැඩි කැමැත්තක් දක්වීමට හේතු වේ. වාණිජ හා කාර්මික නීතිය පිළිබඳ වෘත්තීය පළපුරුද්දක් තිබීම වැඩි සුදුසුකමක් සේ සලකනු ලැබේ.

මූලික වාර්ෂික වැටුප් ක්‍රමය රු. 4,800—360—රු. 8,400 ක් වේ. ජීවනාධාර, විශේෂ ජීවනාධාර සහ ගෙවල් කුලී දීමනා ගෙවනු ලැබේ.

වැඩි විස්තර සහ අයදුම් පත් පහත සඳහන් ස්ථානයෙන් ලබා ගත හැක :—

ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලය,
තැ. පෙ. 1382,
287, ගාලු පාර,
කොළඹ 3.

අයදුම් පත් බාර ගන්නා අවසාන දිනය 1965 නොවැම්බර් 30 වේ.

11-448—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

---

## ජාතික පෝෂකර්ම සංස්ථාව

වර්ෂ 1965ක් වූ නොවැම්බර් මස 25 වෙනි දින පස්වරු 4.30 දක්වා පහත සඳහන් තනතුර සඳහා අයදුම් පත් භාරගනු ලැබේ.

**බොයිලේරු ක්‍රියා කරවන්නා තනතුර:**

සුදුසුකම්.—

(අ) ජ්‍යෙෂ්ඨ සහතිකය ඇත්තන් විශේෂයෙන් සලකනු ලැබේ.

(ආ) අධික බලවේගයක් ඇති බොයිලේරු සඳහා පළමුවෙනි ශ්‍රේණියේ බොයිලේරු සේවකයෙකුගේ සහතිකයක්.

(ඇ) අධික බලවේග බොයිලේරු සේවකයෙකු හැටියට හෝ ටර්බයින් සේවකයෙකු හැටියට අඩු වශයෙන් අවුරුදු පහක පළපුරුද්දක්.

(ඈ) වැඩ කිරීමට සෑහෙන ඉංග්‍රීසි දැනුමක්.

වැටුප් ක්‍රමය.—සියලු දීමනා ඇතුළුව, මසකට රු. 300—රු. 360.

අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ වයස, අධ්‍යාපනික සුදුසුකම් සහ වෙනත් සුදුසුකම්ද පාසැලෙන් අස්වූ පසු කළ රැකියාවන් සම්බන්ධව සම්පූර්ණ විස්තරද සඳහන් කළ යුතු අතර, අධ්‍යාපනික සහ චරිත සහතිකයන්හි පිටපත්ද (මුල් පිටපත් නොව), ඉදිරිපත් කළ යුතුය.

ආධාර ලබාගැනීමට හෝ අසත්‍ය තොරතුරු සැපයීමට හෝ තැත් කිරීම නුසුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

සභාපති.

ජාතික පෝෂකර්ම සංස්ථාව,
56, හෝර්ටන් පෙදෙස,
කොළඹ 7.

11-377—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

### ලංකා ගමනාගමන මණ්ඩලය

මණ්ඩලීය සේවාවේ ඩ:වන කොට්ඨාශයේ IV වන ශ්‍රේණියේ සංඛ්‍යා ලේඛණ විමර්ශක තනතුරු සඳහා ලංකාවේ පුරවැසියන්ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

2. පඩි ක්‍රමය.—(සියළු දීමනාවන් ඇතුළුව) මසකට රු. 300—රු. 15×15 රු. 525. රුපියල් 390 වන් රු. 465 වත් පෙර කාර්යක්ෂමතා කඩඉම් සහිතව.

(තෝරාගනු ලබන අපේක්ෂකයින් ඔවුන්ට ඇති සුදුසුකම් හා පළපුරුද්ද අනුව යථෝක්ත පඩි ක්‍රමයේ සුදුසු පියවරවල තැබිය හැක).

3. සුදුසුකම්.—

(i) වයස: 1965 නොවැම්බර් මස 1 වන දින වන විට අවුරුදු 25ත් 35ත් අතර වීම.

(ii) අධ්‍යයන සුදුසුකම් හා පළපුරුද්ද:

(ඒ) ශුද්ධ ගණිතයට සම්මාන සාමර්ථයක් සමග ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් සමත්වී සිටීම. ඊට උසස් විභාගයකින් සමත්වී සිටින අය ශුද්ධ ගණිතය විෂයයක් වශයෙන් තිබීම,

හා

(බී) රජයේ හෝ පළාත් පාලන සේවයේ හෝ විශාල වෙළඳ ආයතනයක සංඛ්‍යාලේඛණ වැඩ පිළිබඳව යටත් පිරිසෙයින් අවුරුදු 3 ක පළපුරුද්දක් තිබීම.

4. සේවා කොන්දේසි.—තේරුණ අපේක්ෂකයින් පළමුවෙනි වතාවේදී තුන් අවුරුදු පරිවාසන කාලයක් පිට පත්කරනු ලැබේ. ඔවුන්ට පහත පෙනෙන දේ කිරීමට නියම කරනු ලැබේ:—

(1) පත්වීමට කලින් ශාරීරික යෝග්‍යතාව සම්බන්ධයෙන් වෛද්‍ය පරීක්ෂණයකින් සමත්වීම.

(2) දැනටමත් පනවා ඇත්තාවූද, කලින් කල පනවන්නාවූද, මණ්ඩලීය ව්‍යවස්ථාවන් හා රෙගුලාසි පිළිපැදීම.

(3) ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම වස් පරිවාසන කාලය තුලදී මණ්ඩලය විසින් නියම කරන ලද ප්‍රමිණයට සිංහලෙන් ප්‍රවීණත්වයක් ලබා ගැනීම.

(4) මණ්ඩලීය අර්ථසාධක අරමුදල සඳහා පඩියෙන් 10 % ක් දායක මුදල් ගෙවීම. ඔවුන් වෙනුවෙන් ගෙවන මණ්ඩලීය දායක මුදල් 15 % කි.

(5) ලංකාවේ කොයි පෙදෙසෙහිත් මණ්ඩලීය සංවිධානයේ කොයි කොට්ඨාශයෙහිත් සේවය කිරීම.

5. පහත දී ඇති පෝරමය අනුව සකස් කරගත් ඉල්ලුම් පත්‍ර කොළඹ 5, නාරාහේන්පිට, කිරුළ පාරේ, අංක 200 වෙනි ස්ථානයේ පිහිටි ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවක මණ්ඩල කළමනාකාර තැන වෙත 1965 ගේ නොවැම්බර් මස 27 වෙනිදාට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ එවිය යුතුයි.

ලංකා ගමනාගමන මණ්ඩලයේ
සේවක මණ්ඩල කළමනාකාර තැන.

200, කිරුළ පාර,
කොළඹ 5.

### ලංකා ගමනාගමන මණ්ඩලය

### අයදුම් පතෙහි ආදර්ශ ආකෘතිය

1. ඉල්ලන තනතුර :————.
2. අපේක්ෂකයාගේ සම්පූර්ණ නම :————.
3. තැපැල් ලිපිනය :————.
4. උපන් දිනය :————.
   (උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණා එවිය යුතුයි.)
5. 1965.11.1 වෙනිදට වයස : අවුරුදු :——, මාස :——, දවස් :——.
6. අයදුම්කරු ලාංකිකත්වය ලැබුවේ පරම්පරාවෙන්ද, ලියාපදිංචි කරවා ගැනීමෙන්ද යන වග :————.
7. අයදුම්කරු විවාහකද අවිවාහකද යන වග :————.
   (විවාහ වූ දිනයද දරුවන් ගණනද ඔවුන්ගේ වයස් ප්‍රමාණ යන්ද සඳහන් කළ යුතුයි.)
8. සාමාන්‍ය අධ්‍යයනය :————.
   (සාමාන්‍ය අධ්‍යයනය ලැබූ පාඨශාලා හා සමර්ථවූ විභාග දින යන්ද සමග සඳහන් කළ යුතුයි.)
9. උසස් අධ්‍යයනය :————.
   (උසස් අධ්‍යයනය ලැබූ ආයතන පිළිබඳ සම්පූර්ණ විස්තරද, සමර්ථවූ විභාගද, වෘත්තීය සුදුසුකම්ද දිනයන් සමග සඳහන් කළ යුතුයි. එවිය යුත්තේ සහතික පත්‍රවල පිටපත් පමණකි.)
10. අයදුම්කරු කළ රක්ෂා :————.
    (පාසැලෙන් අස්වීමෙන් පසු කළ රක්ෂා පිළිබඳ සම්පූර්ණ විස්තර ඉදිරිපත් කළ යුතුයි. රක්ෂාව කළ ස්ථානයන්ද, දරු තනතුරුවල නම් ද, ඒ තනතුරු ලැබූ දිනයන්ද ඒවායින් අස්වූ දිනයන්ද, අස්වීමට හේතුන්ද එකී විස්තරවලට අඩංගු විය යුතුය.)
11. කිසියම් වෘත්තියක් සම්බන්ධයෙන් අයදුම්කරුට තිබී පළපුරුද්ද හෝ රාජ්‍ය සේවය, පළාත් පාලන සේවය, වෙළඳ ආයතන යන මේවායේ විධායක තනතුරුවල සිට ලබා ඇති පළපුරුද්ද හෝ ඒ පිළිබඳ විස්තර :————.
    (දරු තනතුරුවල නම් ද, කළ කාර්ය්‍යවල ස්වභාවය ද සියලු දීමනාවන් සහිත පඩි ද, දිනයන් ද සමග සඳහන් කළ යුතුය.)
12. ඉල්ලා සිටින තනතුර සම්බන්ධයෙන් අයදුම්කරුට තිබී විශේෂ සුදුසුකම් පිළිබඳ විස්තර :————.
    (පූර්වෝක්ත කිසියම් තනතුරක් දරමින් සිටි කාලයේදී ඔබ කළ වැඩ දැන් ඉල්ලා සිටින තනතුර ලැබීමට විශේෂ සුදුසුකම් වශයෙන් දක්විය හැකි නම් ඒ පිළිබඳ විස්තර.)
13. සිංහලය පිළිබඳ ලබා තිබෙන ප්‍රවීණත්වය :————.
14. වෙනත් තොරතුරු :————.
15. අයදුම්කරු මීට පෙර ලංකා ගමනාගමන මණ්ඩලයේ කිසියම් තනතුරක් සඳහා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළේද, එසේ නම් ඊට කුමක් වූයේද යන වග :————.
16. අයදුම්කරු උසාවියක් මගින් ක්‍රිමිනල් අපරාධයක් සම්බන්ධයෙන් වරදකරුවෙකු යයි නිශ්චය කර තිබේද යන වග. එසේ කර තිබේ නම් ඒ පිළිබඳ විස්තර සඳහන් කළ යුතුයි :————.
17. අයදුම්කරු පිළිබඳ තොරතුරු අසා දැනගත හැකි දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් :—
    (1) ————.
    (2) ————.

මේ අයදුම් පතෙහි මා සඳහන් කර තිබෙන විස්තර නිවැරදි බවද, සත්‍ය බවද, මෙහි සඳහන් කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව ඔප්පු වුවහොත්, එසේ ඔප්පු වූයේ මා තනතුරට තෝරාගැනීමට ප්‍රථමයෙන් නම් ඒ කරණකොටගෙන මා නුසුදුසු කෙනෙකු වන බවත්, තෝරාගැනීමෙන් පසුව ඔප්පු වුවහොත් කිසිම වන්දියක් නොගෙවා මා සේවයෙන් පහකර දමනු ලැබීමට හේතුවන බවත් මම දන්නා බව මෙයින් ප්‍රකාශ කරමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

11-446—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

---

### ගුවන් විදුලි හා ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

**වැඩසටහන් සහායක තනතුර—ස්වදේශීය සේවය (ඉංග්‍රීසි)**

ගුවන් විදුලි හා ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ස්වදේශීය සේවයේ (ඉංග්‍රීසි) වැඩ සටහන් සහායක තනතුරක් සඳහා ඉල්ලුම් පත් බාරගනු ලැබේ. මෙම දැන්වීමේ අග දැක්වෙන ආදර්ශ ආකෘතියේ ආකාරයට සැපයිය යුතු ඉල්ලුම් පත් 1965 නොවැම්බර් මස 27 වැනි දින නොඉක්මවා ලැබෙන සේ ලියාපදිංචි කළ තැපෑලෙන් කොළඹ, ගුවන් විදුලි හා ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් වෙත එවිය යුතුය. ආකෘති පත්‍ර සපයනු නොලැබේ. ලිපි කවරයේ ඉහළ වම් කෙළවර "වැඩසටහන් සහායක—ස්වදේශීය සේවය (ඉංග්‍රීසි)" යන්න පැහැදිලි අකුරින් ලිවිය යුතුය.

2. වැටුප් ක්‍රමය.—මෙම තනතුරට නියමිත වාර්ෂික වැටුප් ක්‍රමය රු. 2,820—9×120, 8×180 හා 4×240—රු. 6,300 කි.

සැ. යු.—සුදුසුකම් ඇති ඉල්ලුම්කරුවකු ඔහුගේ දැනුම හා පළපුරුද්ද අනුව, වැටුප් ක්‍රමයේ සුදුසු තැනක පිහිටුවනවා ඇත.

3. සේවයට බඳවා ගැනීමේ කොන්දේසි.—මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ආරම්භයෙන් පත්වීම දෙනු ලබන්නේ තුන් මසක ආධුනික කාලයකටය.

4. අවශ්‍ය සුදුසුකම්.—සෑම අයදුම්කරුවකුම පහත දැක්වෙන කරුණු ඔප්පු කෙරෙන සැහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි:—

(අ) 1965 නොවැම්බර් 27 දිනට වයසින් අවුරුදු 21 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි බව (දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට මෙම වයස් ප්‍රමාණයන් බලපාන්නේ නැත).

(ආ) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධරයකු හෝ ගුවන් විදුලි සේවය සඳහා විශේෂ වටිනාකමක් ඇති නාට්‍ය, සංගීතය හෝ කථනය පිළිබඳ වෘත්තීය උපාධියක් හෝ ඩිප්ලෝමා උපාධියක් හෝ සහතිකයක් ඇති බව (ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගයෙන් සාමාර්ථය ලැබූ, ගුවන් විදුලි සේවා පිළිබඳව පස් අවුරුදු පළපුරුද්දක් ඇති ගුවන් විදුලි දෙපාර්තමේන්තුවේ ගුවන් විදුලි කටයුතු පිළිබඳ නිරතව සිටින සේවකයින්ගෙන් මෙම සුදුසුකම් ඉල්ලා සිටිනු නොලැබේ).

(ඇ) මනා චරිතයකින්ද කායික සෞඛ්‍යයෙන්ද යුක්ත බව.

5. පහත දැක්වෙන ලියවිලිවල පිටපත් (මුල් ලියවිලි නොවේ) ඉල්ලුම් පත්‍රවලට අමුණා එවිය යුතුයි:—

(i) උප්පැන්නය ලියා පදිංචි කිරීමේ සහතිකය (බෞතිස්ම සහතිකය හෝ අධ්‍යාපන ව්‍යවස්ථා සංග්‍රහයේ අවශ්‍යතා සඳහා නිකුත් කරන ලද උප්පැන්න සහතික පිළිගනු නොලැබේ.)

(ii) ඉහළම අධ්‍යාපන සුදුසුකම් දක්වන සහතික සහ

(iii) අයදුම්කරුගේ සුදුසුකම්, චරිතය, හැකියාව සහ මෙම තනතුරට යෝග්‍ය බව සඳහන් මෑතකදී ලබාගත් සහතික දෙකක් (දැනටමත් රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවන්ගෙන් මෙම අනුඡේදය යටතේ නියමිත සහතික අනවශ්‍යය).

සැ. යු.—මෙම සහතික පිටපත් අයදුම්කරුවන් වෙත ආපසු එවනු නොලැබේ. සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුත්තේ අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට කැඳවුවහොත් හා එසේ කැඳවූ අවස්ථාවකය.

6. රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් එවන ඉල්ලුම් පත් නියමිත දිනය ඉක්මවා ලැබුණ හොත් ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට ඒවා ලැබී ඇත්තේ නියමිත කාල සීමාව තුළ නම් හා ප්‍රමාදයට ඒත්තු වන හේතු දක්වන්නේ නම් මිස ඒවා පිළිගනු නොලැබේ.

7. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) ඡේදයේ මුල පළ වන රජයේ සේවයේ තනතුරුවලට පත් කිරීම හා අදාළ පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

8. ඉල්ලුම්පත් හා ඒ සම්බන්ධ සෑම ලියවිල්ලක්ම එවිය යුත්තේ ගුවන් විදුලි හා ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරල් වෙතට මිස දෙපාර්තමේන්තුවේ අන් කිසි නිලධාරියකුගේ පෞද්ගලික ලිපිනයට නොවේ.

9. ඉල්ලුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

වින්සන්ට් පණ්ඩිත,
ගුවන් විදුලි හා ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්.

1965 නොවැම්බර් මස 4 දින,
කොළඹ 7,
ගුවන් විදුලි හා ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව.

### ඉල්ලුම් පත්‍රයේ ආදර්ශ ආකෘතිය

**වැඩසටහන් සහායක තනතුර—ස්වදේශීය සේවය (ඉංග්‍රීසි)**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන් ලියන්න) :————.
   (අ) වාසගම හෙවත් අගට යෙදෙන නම :————.
   (ආ) සෙසු නම් :————.

2. ස්ථිර ලිපිනය :————.

3. (අ) 1965 නොවැම්බර් 27 දිනට නියම වයස :————.
   අවුරුදු :—— මාස :—— දින :——.
   (ආ) උපන් දිනය :————.
   (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිනිය යුතුයි).

4. ජාතිය :————.

(i) ලාංකිකත්වය ලියා පදිංචි කිරීමෙන්ද, පෙළපතින්ද යන වග :————.

(ii) ලාංකිකත්වය පෙළපතින් නම් පහත දැක්වෙන අය උපන් තැන දක්වන්න :————.
   (අ) අයදුම්කරු :————.
   (ආ) අයදුම්කරුගේ පියා :————.
   (ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.
   (ඈ) අයදුම්කරුගේ පියාගේ පියාගේ පියා :————.

5. අධ්‍යාපනික සුදුසුකම් :————.
   (සාක්ෂි වශයෙන් කුමන ලියවිලි අමුණන්නේද ?)

6. ඉංග්‍රීසි භාෂා විෂයයෙහි සහ බටහිර සංගීත විෂයයෙහි ලබා ඇති දැනුම පිළිබඳ විස්තර :————.

7. ගුවන් විදුලි ප්‍රචාරක කටයුතු සම්බන්ධයෙන් ලබා ඇති පළපුරුද්ද :————.

8. අමුණා ඇති චරිත සහතික ලබාගත් අයගේ නම් සහ ලිපිනයන් :————.

9. සේවා මුක්ත හටසින් උදෙසා පිරිනැමෙන අනුග්‍රහයෙන් ප්‍රයෝජන ගන්නේද යන වග :————.

10. රජය යටතේ කිසියම් අවස්ථාවක සේවය කොට ඇත්නම් ඒ කවදා කොතැනද යන්න :————.
   (ඒ ඒ දෙපාර්තමේන්තුවේ කරන ලද සේවා කාලය දක්වන්න).

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

11-396—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

---

## විභාග, විභාග ප්‍රතිඵල ආදිය

### රජයේ දේශ සංචාරක කාර්යාංශයේ භෝජනාගාර සහ ආපනශාලා පාසැල

භෝජනාගාර සහ ආපනශාලා පාසැලේ වෘත්තීය පාඨමාලා පුහුණුකිරීම සඳහා සුදුසුකම් ඇති අයගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

පුහුණුකිරීමේ පාඨමාලා මෙසේ පිරිනමනු ලැබේ :—

| | | කාලය |
|---|---|---|
| අ. | හෝටල් පාලනය—විශේෂ ඩිප්ලෝමා පාඨමාලාව ... ... ... ... | අවුරුදු 4 යි |
| | (i) සේවය (ii) කෑම පිසීමේ ක්‍රම (iii) ලේඛන කටයුතු | |
| | (ස්විස් භෝජනාගාර භාරකරුවන්ගේ සංගමයේ ලොසැන් භෝජනාගාර පාසැලේ හා භෝජනාගාර සහ කෑම සැපයීමේ ආයතනයේ ඒ. ඇම්. එච්. සී. අයි. ඩිප්ලෝමාවේ තත්ත්වයට මෙම පාඨමාලාව සමානය.) | |
| ආ. | ආපනශාලා පාලනය ... ... ... ... ... | අවුරුදු 3 යි |
| ඇ. | කෑම සැපයීම, කෑම සැපයීම පිළිබඳ කාර්මික විද්‍යාව, ආහාර ස්වාස්ථ්‍යය සහ ජාත්‍යන්තර කෑම පිසීම— | |
| | වේටර්වරයෙකුගේ පාඨමාලාව ... ... ... ... | අවුරුදු 3 යි |
| | අරක්කැමිගේ පාඨමාලාව ... ... ... ... | අවුරුදු 2 යි |
| ඈ. | භෝජනාගාර ලේඛන කටයුතු හෝ කණිෂ්ඨ සහකාර කළමනාකරුගේ පාඨමාලාව ... ... | අවුරුදු 3 යි |
| ඉ. | භෝජනාගාර කර්මාන්ත ශිල්පී පාඨමාලාව (කෙටි කාර පාඨමාලා)— | |
| | (i) භෝජනාගාර පිළිගැනීම සහ පෙරටු කාර්යාල වැඩ ... ... ... | මාස 6 යි |
| | (ii) බේකරි වැඩ, රසකැවිලි සෑදීම සහ මූලික කෑම පිසීම ... ... | අවුරුදු 1 යි |
| | (iii) ආපනශාලා, කවුන්ටරයේ සේවය, වේටිං වැඩ, නිදන කාමර කටයුතු සහ බාර් සේවය ... | අවුරුදු 1 යි |

2. පාඨමාලා අ. ආ. ඇ. සහ ඉ(ii) හා (iii) විවෘතව ඇත්තේ භෝජනාගාර පාසැලේ නේවාසික අයදුම්කරුවන්ට පමණය. පාඨමාලා ඈ සහ ඉ(i) අනුමත කර ඇති භෝජනාගාර සහ ආපනශාලාවල දැනට සේවයේ නියුක්තව ඇති බාහිර ශිෂ්‍යයින්ට විවෘතව ඇත.

3. එක් එක් පාඨමාලාවට ඇතුල්වීමට අයදුම්කරුවන්ට අවශ්‍ය මූලික සුදුසුකම් මෙසේය :—

| | | වයස |
|---|---|---|
| පාඨමාලා අ. ආ. සහ ඇ : | අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස්) හෝ ඊට සමාන, සාමාන්‍ය විද්‍යාව හෝ රසායන විද්‍යාව ගණිතය සහ ඉංග්‍රීසි යන විෂයන්ගෙන් සම්මාන සහිතව ... ... ... | අවුරුදු 20–35 |
| | සංචාරක හෝටල්වල අවුරුදු 3 ක පළපුරුද්දක් ඇති අයදුම්කරුවන්ද ආ. පාඨමාලාවට සලකා බලනු ලැබේ. | |
| පාඨමාලා ඈ : | අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) ඉංග්‍රීසි භාෂාවෙන් සම්මානයක් සහිත ... | අවුරුදු 20–40 |
| | 7 වැනි පන්තිය සමර්ථව ඇති, කෑම සැපයීම පිළිබඳව අවුරුදු 5 කට නොඅඩු සුදුසු පළපුරුද්දක් ඇති සහ ඉංග්‍රීසියෙන් වැඩ කිරීමට දැනුමක් ඇති අයදුම්කරුවන්ද සළකා බලනු ලැබේ. | |
| පාඨමාලා ඉ : | (i) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) ඉංග්‍රීසි භාෂාවෙන් සම්මානයක් සහිත හෝ ඊට සමාන | අවුරුදු 20–35 |
| | (ii) 7 වැනි පන්තිය සමර්ථව ඇති ඉංග්‍රීසියෙන් වැඩ කිරීමට දැනුමක් ඇති සහ භෝජනාගාරයක, තානායමක හෝ කෑම සපයන ආයතනයක අවුරුදු 5 පළපුරුද්දක් ඇති ... ... | අවුරුදු 20–35 |
| | (iii) එම ... ... ... ... ... ... | අවුරුදු 20–40 |

4. පාඨමාලා වලට තෝරාගනු ලබන අයදුම්කරුවන්ට නොමිලේ අධ්‍යාපනය හා ප්‍රායෝගික පුහුණුව ලබාදෙනු ඇත. සියළුම නේවාසික අයදුම්කරුවන් විසින් නිදනශාලා ගාස්තු වශයෙන් මසකට රු. 50/-ක් ගෙවිය යුතුය. බාහිර අයදුම්කරුවන්ට තම කෑම ආදියට මසකට රු. 25/-ක් ගෙවීමට සිදුවනු ඇත.

තෝරාගනු ලබන සියළුම අයදුම්කරුවන් ඇතුළත්වීමේදී රු. 25/- බැගින් ලියාපදිංචි කිරීමේ ගාස්තුවක් සහ වාරයකට රු. 15/-ක ශිෂ්‍ය කටයුතු ගාස්තුවක්ද ගෙවිය යුතුය.

5. භෝජනාගාර පාසැලේ ආපනශාලාවල සහ රජයේ ආගන්තුක නිවසෙහි අභ්‍යන්තර සේවා පුහුණුවන්නන් වශයෙන් අයදුම්කරුවන් වැඩ කළයුතු අතර ඒ සඳහා කිසිම දීමනාවක් නොදෙනු ඇත.

6. පාසැල මගින් නියම කරනු ලබන පරිදි තමන්ගේ ඇඳුම් කට්ටල සහ ආවරණ ඇඳුම් ශිෂ්‍යයන් විසින් මිළදී ගත යුතුය.

7. භෝජනාගාර පාලනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා අධ්‍යාපනය සාර්ථකව සම්පූර්ණ කරනු ලබන සුදුසු අයදුම්කරුවන් පිටරට පුහුණුවක් ලැබීමට සුදුස්සෝ වෙති.

8. අයදුම්කරුවන් පුහුණුවීමෙන් පසුව අඩු වශයෙන් අවුරුදු 7ක් තානායම්වල හෝ රජය මගින් අනුමත කරනු ලබන භෝජනාගාරවල සේවය කළයුතුය.

9. සියළුම ශිෂ්‍යයන් පාසැලේ නීතිරීති වලට එකඟ විය යුතු අතර ඔවුන්ගේ ඉගෙනීම සහ පුහුණුවීම උනන්දුවෙන් කළයුතුය.

10. මේ සඳහා එවනු ලබන ඉල්ලුම් පත් අධ්‍යක්ෂ, රජයේ දේශ සංචාරක කාර්යාංශය, චෛත්‍ය පාර, කොළඹ 1 යන ලිපිනයට එවිය යුතුය.

11. ඉල්ලුම් පත් භාරගැනීම 1965 නොවැම්බර් මස 26 වැනිදයින් අවසන් වෙයි.

12. ඉල්ලුම්පත් මීට සම්බන්ධ කර ඇති ආදර්ශ ආකෘති පත්‍රයේ ආකාරයට විය යුතුය.

ආර්. ඒ. ඇම්. සී. ඇස්. සේනාරත්න,
අධ්‍යක්ෂ,
රජයේ දේශ සංචාරක කාර්යාංශය.

රජයේ දේශ සංචාරක කාර්යාංශය,
චෛත්‍ය පාර,
කොළඹ 1.

## රජයේ දේශ සංචාරක කාර්යාංශයේ භෝජනාගාර සහ ආපනශාලා පාසැල

## ඇතුළත්වීමේ අයදුම්පත

අධ්‍යක්ෂ,
රජයේ දේශ සංචාරක කාර්යාංශය,
චෛත්‍ය පාර,
කොළඹ 1.

| කාර්යාල පාවිච්චියට පමණක් පමණක් |
|---|

1. අගට යෙදෙන නම :————
2. සෙසු නම් :————
3. උපන් දිනය :————
උපන් තැන :————
පියාගේ නම සහ රක්ෂාව :————
(උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණන්න)
4. සිවිල් තත්ත්වය : විවාහක/අවිවාහක. ස්ත්‍රී/පුරුෂ
5. ජාතිය :————
6. ස්ථිර ලිපිනය :————
7. වයස 21 ට අඩු ඉල්ලුම්කරුවන්ට—මවුපිය කැමැත්ත :————

————
මවගේ/පියාගේ අත්සන.

8. අධ්‍යාපන ලේඛනය :————

(i) ඉගෙන ගත් පාසැල් :

| | පාසැලේ නම | නගරය | 19......සිට | 19......දක්වා |
|---|---|---|---|---|
| 1. | ———— | ———— | ———— | ———— |
| 2. | ———— | ———— | ———— | ———— |
| 3. | ———— | ———— | ———— | ———— |
| 4. | ———— | ———— | ———— | ———— |
| 5. | ———— | ———— | ———— | ———— |

(ප්‍රධානාචාර්ය වරයාගෙන් ලබාගත් පාසැලෙන් අස්වීමේ සහතිකවල පිටපත අමුණන්න)

(ii) සමත්වූ විභාග සහ ගත් විෂයයන් :————
(විභාග සහතිකවල සහතික කරන ලද පිටපත් අමුණන්න)

9. ශාරීරික යෝග්‍යත්වය ගැන වෛද්‍ය සහතිකයක් අමුණන්න.
වෛද්‍යවරයාගේ නම සහ ලිපිනය :————

10. භෝජනාගාරවල, තානායම්වල ආගන්තුක නිවාසවල සේවය කළ ආධුනිකත්වය :————
ස්වාමියාගේ නම සහ ලිපිනය :————
වැඩවල ස්වභාවය :————
කාලය :————සිට————දක්වා
ස්වාමියාගේ සහතිකය (පිටපතක් අමුනන්න)

11. යුද්ධ හමුද සේවය, යමක් ඇත්නම්————සිට————අංකය————
ශිෂ්‍ය භට සේවය ————සිට————පාසැල————
බාලදක්ෂ සේවය ————සිට————කණ්ඩායම————
බාලදක්ෂිකා සේවය ————සිට————සමාගම

12. භාෂා ප්‍රවීනතාවය :

| | කියවීම | ලිවීම | කථාකිරීම | සමර්ථවූ විභාගය |
|---|---|---|---|---|
| සිංහල ... ... ... | ——— | ——— | ——— | ——— |
| දෙමළ ... ... ... | ——— | ——— | ——— | ——— |
| ඉංග්‍රීසි ... ... ... | ——— | ——— | ——— | ——— |
| ප්‍රන්ස ... ... ... | ——— | ——— | ——— | ——— |

(දුර්වලයි/සාමාන්‍ය/හොඳයි/බොහොම හොඳයි)

ඉල්ලුම්කරු කොපමණ කලක් ඉංග්‍රීසි ඉගෙන ගෙන තිබේද ?————.

ඉල්ලුම්කරු කොපමණ කලක් ප්‍රන්ස භාෂාව ඉගෙන ගෙන තිබේද ?————.

13. ඇතුළත්වීමට කැමැති පාඨමාලාව දක්වන්න :—

(අ) හෝටල් පාලනය

(ආ) ආපනශාලා පාලනය

(ඇ) කෑම සැපයීම

(ඈ) ලේඛන කටයුතු/සහකාර කළමනාකරු

(ඉ) (i) පිළිගැනීම

(ii) බේකරි වැඩ සහ කෑම පිසීම

(iii) ආපනශාලා වේටිං වැඩ සහ බාර් සේවය
(පාඨමාලා ආරම්භ වන දින පසුව දන්වනු ලැබේ.)

14. තෝරා පත්කරගතහොත්—

(අ) පාසැලේ නීතිරීති වලට එකඟවීමට හා පුහුණුවීමේ පාඨමාලාවට මගේ සම්පූර්ණ උනන්දුව දැක්වීමට ;

(ආ) මගේ පුහුණුවීමේ පාඨමාලාව අවසන්වූවාට පසු තානායම්වල හෝ රජය මගින් අනුමත කරනු ලබන භෝජනාගාරවල, ආපනශාලාවල හෝ කෑම සපයන ආයතනවල අවුරුදු 7ක් සේවය කිරීමට;

(ඇ) ලියාපදිංචි කිරීමේ ගාස්තු, ශිෂ්‍යයින්ගේ කටයුතු හා නිදනශාලා, කෑම ගාස්තු නියමිත දිනවලට ගෙවීමට ;

(ඈ) මගේ පුහුණුවීමේ කාලය තුළ හොඳට සිටීමට සහ ආදර්ශමත් සදචාරයෙන් හැසිරීමට ;

මම භාරගනිමි.

ඉල්ලුම්කරුගේ අත්සන :————

මවුපිය විසින් අනු අත්සන් තබා ඇත :————

ස්වාමියා විසින් අනු අත්සන් තබා ඇත :————
(භෝජනාගාරවල හා ආපනශාලාවල සේවයේ යෙදී ඇති අයට)

දිනය :————

11–452—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

## ලංකා සමාජ සේවා විද්‍යාලය

### 1966—සමාජ සේවා වැඩ පිළිබඳ ඩිප්ලෝමාව

සමාජ සේවා වැඩ පිළිබඳ ඩිප්ලෝමා උපාධියකින් අවසන් වන පූර්ණ කාල අධ්‍යයන වැඩ සටහනක් 1966 ජනවාරි මාසයේදී ආරම්භ වේ.

**ඇතුලත් වීමට අවශ්‍ය සුදුසුකම්.—**

(1) පලාත් පාලනය ඇතුළු රජයේ සේවයේ සමාජ සේවා වැඩ පිළිබඳ අනුබද්ධ තනතුරු නොදරණ අයදුම් කරුවන් සඳහා අඩුම අධ්‍යයන සුදුසුකම උසස් පාඨශාලා සහතික පත්‍රය හෝ (විෂයයන් තුනක් සහිතව) අධ්‍යයන පොදු සහතික පත්‍රය (උසස් පෙළ) හෝ ඊට සමාන සහතික පත්‍රයක් හෝ වේ. පහත සඳහන් විෂයයන්, එනම් සිංහල, දෙමල, ඉංග්‍රීසි, ආර්ථික විද්‍යාව, ආණ්ඩු ක්‍රමය, ඉතිහාසය සහ අනෙක් අනුබද්ධ විෂයයන්ගෙන් සම්මාන සාමාර්ථය ලත් අපේක්ෂකයන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

(2) පලාත් පාලනය ඇතුළු රජයේ සේවයේ සමාජ සේවා වැඩ පිළිබඳ නිත්‍ය තනතුරු දරන්නන් සඳහා නම්, එවැනි දෙපාර්තමේන්තුවල පස් අවුරුද්දක පළපුරුද්දක් තිබීම අඩුම සුදුසුකම වන අතර, සමාජ සේවා කටයුතුවල යෙදීමට යෝග්‍ය වන්නාවූ දක්ෂතාවයන් හා ආවේනික ගුණාංගයක් දරන බවටත්, මෙවැනි අභ්‍යාසයක් ලැබීමෙන් අපේක්ෂකයාට ලාභයක් වන බවටත් දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් නිර්දේශ කරනු ලැබිය යුතුය.

**ඉල්ලුම් පත්‍ර පෝර්ම.—**

නිර්දේශ පත්‍රිකා සහ ඉල්ලුම් පත්‍ර පෝර්ම කාර්‍යාලයෙන් හෝ ලේකම්ගෙන් තැපැල් මගින් හෝ ලබාගත හැකිය.

ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසන් දිනය 1965 නොවැම්බර් 30 වැනිදාය.

ලංකා සමාජ සේවා විද්‍යාලය,
82, 5 වැනි පටුමග,
කොළඹ 3.

11–454—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

# ටැන්ඩර් කැඳවීමේ දැන්වීම

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ මහා භාණ්ඩාගාරයේ 218 වැනි කාමරයෙහි වූ මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය: 500 වැනි තැපැල් පෙට්ටිය, කොළඹ 1) පහත සඳහන් සැපයීම සඳහා 1966 පෙබරවාරි 15 වෙනි අඟහරුවාදා පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ:—

(1) කපු කැන්වස් සැපයීම.

(2) මදුරු දැල් සැපයීම.

ටෙන්ඩර් පත්‍ර විවෘත කරණ ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ, පාර්සන්ස් පාරේ ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරි තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක්ද සහිතව එවිය යුතුයි.

ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ එක් එක් සේවය සඳහා රුපියල් 100 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් බැඳ, ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ඉහත සඳහන් දිනවලට කලින් දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම කොළ දෙනු ලැබේ.

විදේශිය ටෙන්ඩර්කරුවන් සඳහා විශේෂ ටෙන්ඩර් පෝර්ම සකස් කර තිබේ. රුපියල් 100 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට බලය ලත් නියෝජිතයින්ට පමණක් එකී පෝර්ම කොළ දෙනු ලැබේ. ටෙන්ඩර්කරුවන් විසින් තමන්ට වුවමනා කවර අන්දමේ ටෙන්ඩර් පෝර්ම කොළ දැයි සඳහන් කළ යුතුයි.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

ආය්. ඒ. පී. රූපසිංහ,
ගබඩා අධිකාරී.

1965 නොවැම්බර් 12 වැනි දින,
කොළඹ දීය.

11–428—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

## රට අඹ ලෑලි (බේල් එන්ඩ්ස්) යනාදිය මිළයට ගැනීම සහ ඉවත් කර ගැනීම

බොරැල්ලේ, ආණ්ඩුවේ මුද්‍රණාලයේ තිබෙන, සාමාන්‍යයෙන් එකක් අඟල් 27 × 34 ප්‍රමාණයේ පමණ වන, රට අඹ ලෑලි (බේල් එන්ඩ්ස්) 7,000 ක්, ලෑලි ගොඩක් සහ හිස් පෙට්ටි ගොඩක් මිළයට ගැනීම සහ ඉවත් කර ගැනීම සඳහා, කවරයෙහි උඩ වම් කොනෙහි "රට අඹ ලෑලි මිළයට ගැනීම සඳහා ටෙන්ඩරය" යන්න ලියා රෙජිස්ටර් තැපෑලෙන් එවනු ලබන සීල් කරන ලද ටෙන්ඩර් 1965 නොවැම්බර් 30 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 වන තුරු කොළඹ බොරැල්ලේ ආණ්ඩුවේ මුද්‍රණාලයේ, ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් භාරගනු ලැබේ. රෙජිස්ටර් තැපෑලෙන් නොඑවන ටෙන්ඩර්, ආණ්ඩුවේ මුද්‍රණාලයේ ප්‍රධාන කාර්යාලයෙහි ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමිය යුතුය.

2. බොරැල්ලේ ආණ්ඩුවේ මුද්‍රණාලයේ දී භාරගැනීම සඳහා රට අඹ ලෑලි (බේල් එන්ඩ්ස්) සම්බන්ධයෙන් එක් ලෑල්ලක් සඳහා මිලද, ලෑලි ගොඩ සහ හිස් පෙට්ටි ගොඩ සම්බන්ධයෙන් තොග ගණනේ ද මිල ගණන් ඉදිරිපත් කළ යුතුය.

3. බොරැල්ලේ, ආණ්ඩුවේ මුද්‍රණාලයෙහි රුපියල් පණහක් තැන්පත් කර ලබා ගන්නා ලද කුවිතාන්සියක්, ටෙන්ඩර් පෝරම ලබාගැනීමේදී ඉදිරිපත් කළ යුතුය.

4. 1965 නොවැම්බර් 29 වැනි දින දවල් 12 වන තුරු ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලැබේ.

5. සෙනසුරාදා දිනවල හැර, සතියේ ඕනෑම දිනක පෙ. ව. 9 සිට ප. ව. 4 දක්වා මෙම දෙපාර්තමේන්තුවේදී මේ ද්‍රව්‍ය බැලිය හැක.

6. ටෙන්ඩර් කරුවන්ට ඕනෑම එක තොගයක් හෝ කැමති නම් තොග තුනටම හෝ ඉල්ලිය හැක. නමුත් එක් එක් තොගයට වෙන වෙනම මිල ගණන් සඳහන් කළ යුතුය.

7. කොළඹ, බොරැල්ලේ ආණ්ඩුවේ මුද්‍රණාලයේ ප්‍රධාන කාර්යාලයේදී 1965 නොවැම්බර් 30 වැනි දින පෙරවරු 9.30 ට ටෙන්ඩර් විවෘත කරනු ලබන විට ටෙන්ඩර් කරුවන්ට පැමිණ සිටීමට ඉඩ දෙනු ලැබේ.

8. නො පිළිගනු ලබන ටෙන්ඩරයක් වුවොත් ඒ සඳහා වූ තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ.

9. ටෙන්ඩරය පිළිගනු ලැබූ බව දැන්වූ දින සිට දින හතක් ඇතුළත සම්පූර්ණ වටිනාකම ගෙවා ද්‍රව්‍ය ඉවත් කර ගැනීමට ටෙන්ඩරය ලබාගත් අය අපොහොසත් වුවහොත්, කිසිම අයිතිවාසිකමක්වත් නොමැතිව ටෙන්ඩරය සඳහා වූ තැන්පත් මුදල රාජසන්තක කරනු ලැබේ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1965 නොවැම්බර් 9 දින,
කොළඹ, ආණ්ඩුවේ මුද්‍රණාලයේ දී ය.

11-636—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

## රාජකීය ලංකා ගුවන් හමුදාව

කොළඹ 2, පාර්සන්ස් පාරේ පිහිටි ගුවන් හමුදා මූලස්ථානයේ, ගුවන් හමුදාධිපති විසින් කටුනායක රාජකීය ලංකා ගුවන් හමුදාවේ, සැපයීමේ සහ නඩත්තු කිරීමේ ප්‍රධාන කඳවුරේ තිබෙන පාවිච්චියට නුසුදුසු ගෘහ භාණ්ඩ සහ බැරැක්ක උපකරණ විකිණීම සඳහා 1965 දෙසැම්බර් මස 3 වෙනි දින පෙරවරු 10 දක්වා ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍රයක් ලබාගැනීම පිණිස කොළඹ, පාර්සන්ස් පාරේ පිහිටි ගුවන් හමුදා මූලස්ථානයේ සිවිල් අංශයේ පාලක නිලධාරී හා ගණකාධිකාරිතුමා වෙත රුපියල් සියයක (රු. 100ක) මුදලක් තැන්පත් කර රිසිට් පතක් ලබාගත යුතුයි. 1965 දෙසැම්බර් මස 2 වෙනි දින දහවල් 12 වනතෙක් ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ.

සියළුම ටෙන්ඩර් පත් පිටපතක් සමග මුද්‍රා තබන ලද කවරයක බහා එහි වම්පැත්තේ උඩ කෙළවරේ "රාජකීය ලංකා ගුවන් හමුදාවේ තිබෙන පාවිච්චියට නුසුදුසු ගෘහ භාණ්ඩ සහ බැරැක්ක උපකරණ විකිණීම සඳහා ටෙන්ඩර්" යයි සඳහන් කර කොළඹ 2, පාර්සන්ස් පාරේ පිහිටි ගුවන් හමුදා මූලස්ථානයේ ගුවන් හමුදාධිපති වෙත එවිය යුතුය.

පළමුවෙනි ඡේදයේ සඳහන් කර ඇති ස්ථානයේදී, දිනයේදී හා වේලාවේදී ටෙන්ඩර් පත් විවෘත කරන විට ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ සියළු දෙනාටම පෙනී සිටීමට ඉඩ දෙනවා ඇත. ටෙන්ඩර් පතක් ඉදිරිපත් කරන ලද කෙනෙකුට ටෙන්ඩර් පතක් පරීක්‍ෂා කිරීමට කැමැත්තක් තිබේ නම් ගුවන් හමුදාධිපතිට දන්වූ විට ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩර් පතක පිටපතක් පරීක්‍ෂා කිරීමට ඉඩ දෙනු ලැබේ.

ඊ. ආර්. අමරසේකර,
කොමදෝරු,
ගුවන් හමුදාධිපති.

11-393—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—පුත්තලම

අංක 14,519 හා 1965.10.1 වෙනි දින නිකුත්වූ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ ටෙන්ඩර් කැඳවීම් දැන්වීමේ අංක (1) දරණ අලිබනිත මත්කඩුව ව්‍යාපාරය—නිර්මාණයන් ඉදිකිරීම සඳහා ටෙන්ඩර් අයදුම් පත්‍ර භාරගන්නා දිනය 1965 නොවැම්බර් මස 23 වෙනි අඟහරුවාදා පෙරවරු 10 දක්වා නැවතත් දීර්ඝ කරන ලදී.

2. 1965.11.19 වෙනි දින පස්වරු 4.30 දක්වා ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

මු. මෝ. සිවපෙරගාසම්,
වාරිමාර්ග ඉංජිනේරු තැන, පුත්තලම උ. කො.

වාරිමාර්ග කාර්යාලය, පුත්තලම.
1965.11.2.

11-332—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—පොළොන්නරුව උප කොටස

පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර්, පොළොන්නරුවේ ඊශාන කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු විසින් 1965.12.7වෙනි ද පෙ.ව. 10 වන තෙක් භාර ගනු ලැබේ.

| වැඩ විස්තරය | ලියාපදිංචි වී සිටිය යුතු මුදල රු. ශ. | ටෙන්ඩර් තැන්පත් මුදල රු. ශ. |
|---|---|---|
| 1. පරාක්‍රම සමුද්‍ර ව්‍යාපාරයේ වැකණ්ඩියේ රළ පනාවක සෑදීම ... | 24,000 0 ... | 50 0 |
| 2. උනාවිල වැව ප්‍රතිසංස්කරණය කිරීම... | 25,000 0 ... | 50 0 |

2. පළවෙනි ඡේදයේ සඳහන් වැඩ වලට කෙළින් දක්වා ඇති ප්‍රමාණයට හෝ වැඩි ගණනකට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කොන්ත්‍රාත් කරුවන්ට, විවිධසේවා සමුපකාර සමිති සහ වෙනත් පිළිගත් සමිති වලට පමණක් මෙම වැඩ සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කළ හැකිය.

3. 1965 දෙසැම්බර් මස 3 වෙනි ද පස්වරු 4.30 දක්වා පොළොන්නරුව, මින්නේරිය හෝ කවුඩුල්ල වාරිමාර්ග ඉංජිනේරුවරුන්ගෙන් ලබාගන්නා ලදපෝරම වල දෙපිටපතක් සහිතව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පෝරම ඉල්ලීමේ දී කොන්ත්‍රාත්කරුගේ ලියාපදිංචි වාර්තා පොත දනට කරගෙන යනු ලබන වැඩවල විස්තරයක් හා ඒ වැඩ භාර නිලධාරීන්ගෙන් වැඩවල ප්‍රගතිය පිළිබඳව සහතිකයක් ද ඉදිරිපත් කළ යුතුය. මෙම ලිපි ලැබීමෙන් පසු ටෙන්ඩර් පෝරම නිකුත් කළ යුතුද නැතිද යන්න වාරිමාර්ග ඉංජිනේරු තීරණය කරනු ඇත.

4. මෙම වැඩ සඳහා අවශ්‍ය ටෙන්ඩර් තැන්පත් මුදල්, වාරිමාර්ග අධ්‍යක්ෂතුමා නමින් ලබාගත් මුදල් ඇණවුමකින් ගෙවිය හැකිය. නොඑසේ නම් කොළඹ හැර වෙන ඕනෑම කච්චේරියක තැන්පත් කොට ලබාගත් කුවිතාන්සිය වාරිමාර්ග ඉංජිනේරුතැනට ඉදිරිපත් කළ හැකිය.

5. වැඩි විස්තර පොළොන්නරුව උප කොටසේ වාරිමාර්ග ඉංජිනේරු ගෙන් කාර්යාල වේලාවන්හිදී ටෙන්ඩර් අවසාන වන දිනය දක්වා ලබාගත හැකිය.

පී. සන්මුගනාදන්,
වාරිමාර්ග ඉංජිනේරු,
පොළොන්නරුව උප කොටස.

වාරිමාර්ග කාර්යාලය,
පොළොන්නරුව.

11-356—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—මහකනදරාව උ. කො.

මහකනදරාව උප කොට්ඨාසය යටතේ පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් ඉල්ලුම් පත් 1965 දෙසැම්බර් මස 7 වෙනි දින පෙරවරු 11 වන තෙක් අනුරාධපුර උතුරු මැද කොට්ඨාසයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු විසින් භාර ගෙන එවේලේම විවෘත කරනු ලැබේ.

"වාරිමාර්ග පහසුකම් සැපයීම හුරුළුවැව ව්‍යාපාරයේ දකුණු ඉවුරේ 13 (ඒ) සැය යටතේ"

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 20,000 කට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට, සමූපකාර සමිතිවලට සහ ග්‍රාම සංවර්ධන සමිතිවලට පමණක් මෙම වැඩ සඳහා ටෙන්ඩර් අයදුම් පත් ඉදිරිපත් කළ හැක.

3. 1965 දෙසැම්බර් මස 3 වෙනි සිකුරාදා සවස 4.30 දක්වා කාර්යාලීය වේලාවන් තුළදී මහකනදරාව උප කොට්ඨාසයේ, අනුරාධපුර සහ පදවිය උප කොට්ඨාසවල වාරිමාර්ග ඉංජිනේරුවරුන්ගේ කාර්යාලවලින් ටෙන්ඩර් ඉල්ලුම්පත් ලබා ගත හැක. ටෙන්ඩර් ඉල්ලුම්පත් ලබා ගැනීමේදී ඒ සඳහා ඉදිරිපත් වන කොන්ත්‍රාත්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ දැනට ඔවුන් රජය යටතේ කරන වැඩ සහ ඒවායේ වටිනාකම් දක්වෙන ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුයි. ආකෘති පත්‍ර නිකුත් කිරීමට පෙර රු. 25 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් වාරිමාර්ග ඉංජිනේරුතැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි.

4. මේ ටෙන්ඩරය ගැන සියළුම විස්තර කාර්යාලීය වේලාවන් තුළදී මහකනදරාව උප කොට්ඨාසයේ වාරිමාර්ග ඉංජිනේරුතැනගේ කාර්යාලයෙන් ලබාගත හැක.

ක. කනගසුන්දරම්,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
මහකනදරාව, උ. කො.

1965 නොවැම්බර් මස 4 වැනි දින,
මිහින්තලේ දී ය.,

11-372—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—වගුරු බිම් සංවර්ධන අංශ උප කොටස

පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත් 1965 දෙසැම්බර් මස 7 වෙනි දින පෙරවරු 11 දක්වා කොළඹ 7, බුලර්ස් පාරේ, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ 2 වෙනි මහලේ නො. 8 දරන කාමරයෙහි ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන "වගුරු බිම් සංවර්ධන අංශය" විසින් භාරගනු ලැබීමෙන් පසු වහා විවෘත කරනු ඇත:—

| වැඩයේ නම | කොන්ත්‍රාත් කරු ලියා පදිංචි විය යුතු මුදල | ටෙන්ඩර් තැන්පත් මුදල |
|---|---|---|
| | රු. ශ. | රු. ශ. |
| 1. මුතුරාජවෙල පිහිටි බලගල්ල කුඹුරුවලට දියපවහන සැපයීමේ පහසුකම් ... | 29,500 0... | 50 0 |
| 2. වැලි අමුන කුඹුරුවලට දියපවහන සැපයීමේ පහසුකම් ... | 29,000 0... | 50 0 |

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වූ, රු. 30,000 ට හෝ ඊට වැඩි කොන්ත්‍රාත් කරුවන්ට පමණක් මෙම වැඩ සඳහා ටෙන්ඩර් අයදුම්පත් ඉදිරිපත් කළ හැක.

1965 දෙසැම්බර් මස 3 වෙනි සිකුරාද පස්වරු 3 වන තෙක් කාර්‍යාලයීය වේලාවන්හිදී "වගුරු බිම් සංවර්ධන අංශයේ" වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්‍යාලයෙන් ලබාගත හැකි ටෙන්ඩර් පෝරමවල ටෙන්ඩර් අයදුම් පත් සකස් කළ යුතුය. ටෙන්ඩර් පෝරම සඳහා ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ ලියා පදිංචි පොත්, දනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ හා ඒවායේ වටිනාකම් දක්වෙන ප්‍රකාශනයක්, ඔවුනට ටෙන්ඩර් භාර දීමට සුදුසු ද, නුසුදුසු යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. පෝරම නිකුත් කිරීමට ප්‍රථම ටෙන්ඩර් තැන්පත් මුදල වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්‍යාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි.

මේ ටෙන්ඩර් ගැන සියළුම විස්තර, කාර්‍යාලයීය වේලාවන් තුළදී වාරිමාර්ග ඉංජිනේරු තැනගේ "වගුරු බිම් සංවර්ධන අංශ උප කොටසින්" ලබා ගත හැක.

ජේ. ඩී. පී. පෙරේරා,
වාරිමාර්ග ඉංජිනේරු,
වගුරු බිම් සංවර්ධන උ. කො.

1965 නොවැම්බර් මස 5 දින,
කාමර අංක 8, 2 වෙනි මහල,
වාරිමාර්ග දෙපාර්තමේන්තුව, බුලර්ස් පාර,
කොළඹ 7.

11-393—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—නිකවැරටිය උප කොටස

නිකවැරටිය උප කොටසේ පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත් 1965 නොවැම්බර් මස 30 වෙනි අඟහරුවාද පෙරවරු 10 දක්වා කුරුණෑගල වයඹ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාරගනු ලැබේ:—

| සේවා විස්තර | අවශ්‍ය ලියා පදිංචි ප්‍රමාණය | ටෙන්ඩර් තැන්පත් මුදල |
|---|---|---|
| | රු. ශ. | රු. ශ. |
| 1. පාලුකඩවල සිට ගල්ගොමුවට ප්‍රවිශ්ඨවීමේ පාරට ගල් සහ තාර දැමීම— | | |
| විෂය අංක 1 පළමුවන—සැතපුම පාලුකඩවල සිට ... | ... 35,000 0... | 50 0 |
| විෂය අංක 2—දෙවන සැතපුම පාලුකඩවල සිට ... | ... 35,000 0... | 50 0 |
| විෂය අංක 3—තෙවන සැතපුම පාලුකඩවල සිට ... | ... 35,000 0... | 50 0 |
| විෂය අංක 4—සිවවැනි සැතපුම (අඩි 1750) ... | ... 17,000 0... | 25 0 |

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉහත සඳහන් ගණන්වලට හෝ ඊට වැඩියෙන් ලියා පදිංචිවූ කොන්ත්‍රාත්කරුවන්ට, සමූපකාර සමිතිවලට හෝ ග්‍රාම සංවර්ධන සමිතිවලටපමණක් මෙම වැඩ සඳහා ටෙන්ඩර් අයදුම් පත් ඉදිරිපත් කළ හැක.

3. 1965 නොවැම්බර් මස 26 වැනි සිකුරාද වන තෙක්, එදින ඇතුලුව කාර්යාල වේලාවන් තුලදී පමණක්, නිකවැරටිය, කුරුණෑගල හා රාජාංගනේ වම් කොටසේ වාරිමාර්ග කාර්යාලවලින් ලබා ගත් පෝරමවල අයදුම් පත් ඉදිරිපත් කළ හැක. ටෙන්ඩර් පෝරම ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත් වන ඉල්ලුම් කරුවන් ඔවුන්ගේ ලියා පදිංචි පොත් සහ දනට ඔවුන් කරන වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ වැඩ සහ ඒවායේ වටිනාකම් දක්වෙන ප්‍රකාශයක් ඔවුනට ටෙන්ඩර් කිරීමට සුදුසු නැද්ද යන්න සලකා බැලීමට වාරිමාර්ග ඉංජිනේරු වෙත ඉදිරිපත් කළ යුතුයි. පෝරම නිකුත් කිරීමට පෙර ඉහත සඳහන් පරිදි ටෙන්ඩර් තැන්පත් මුදල් ඒ ඒ වැඩය සඳහා වෙන් වෙන් වශයෙන් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයේදී හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි.

4. මේ සම්බන්ධයෙන් අවශ්‍ය සියලු විස්තර කාර්යාල වේලාවන් තුලදී වාරිමාර්ග ඉංජිනේරු තැන වෙතින් ලබා ගත හැක.

ඊ. සුන්දරම්,
වාරිමාර්ග ඉංජිනේරු, නිකවැරටිය උ.කො.

1965.11.3,
නිකවැරටියේදිය.

11-426—65.11.12 දින අංක 14,554 දරණ ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

පොළොන්නරුවේ ඊශාන කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින්, පහත සඳහන් වැඩ සඳහා ලියාපදිංචි විවිධ සේවා සමූපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති සහ මෙම දෙපාර්තමේන්තුවේ, අංක (1) ටෙන්ඩර් අංක කේ. ඇල්. 4 සඳහා රු. 25,000 කට හෝ ඊට වැඩියෙන් සහ අංක (2) ටෙන්ඩර් අංක කේ. ඇල්. 5 සඳහා රු. 30,000කට හෝ ඊට වැඩියෙන් ලියාපදිංචි කොන්ත්‍රාත් කරුවන්ගෙන් 1965 දෙසැම්බර් මස 7 වැනි දින පෙරවරු 10 දක්වා වෙන් වශයෙන් ටෙන්ඩර් භාරගනු ලැබේ.

(1) ටෙන්ඩර් අංක කේ. ඇල්. 4—හල්මිල්ල ඔය හරහා අමුන සහ හල්මිල්ලවැවේ පෝෂණ ඇලේ ප්‍රධාන සොරොව්ව හා පැන්නුම ඉදිකිරීම.

(2) ටෙන්ඩර් අංක කේ. ඇල්. 5—හල්මිල්ලවැවේ පෝෂණ ඇල ඉදිකිරීම.

2. ටෙන්ඩර් පෝරම පිටපත් දෙකකින් යුතුව සම්පූර්ණ කොට එවිය යුතුයි. මේ සම්බන්ධයෙන් සියලුම විස්තර කවුඩුල්ල ව්‍යාපාරයේ වාරිමාර්ග ඉංජිනේරුතැනගෙන් සාමාන්‍ය කාර්යාලීය වේලාවන් තුල ලබා ගත හැක.

3. 1965.11.13 වෙනි දින සිට 1965.12.3 වෙනි දින දක්වා කවුඩුල්ල, මින්නේරිය හා පොළොන්නරුව උප කොටස් භාර වාරිමාර්ග ඉංජිනේරු වරුන්ගෙන් ටෙන්ඩර් පෝරම ලබා ගත හැක. ඉහත සඳහන් ටෙන්ඩර් අංක (1) සඳහා රු. 25 ක් සහ අංක (2) සඳහා රු. 50 ක් ටෙන්ඩර් ලබාගන්නා උප කොට්ඨාස භාර වාරිමාර්ග ඉංජිනේරු වෙත හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කොට පෝරම ලබා ගත යුතුයි.

4. මොනයම් කරුණක් සඳහා හෝ කොන්ත්‍රාත් කරුවන්ට රජයේ ආවුධ හා උපකරණ සපයනු නොලැබේ. සිමෙන්ති සහ යකඩ පමණක් මින්නේරියේ පිහිටි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගබඩා වෙන් නිකුත් කරනු ලැබේ. ප්‍රධාන ගබඩාවෙන් නිකුත් කරනු ලබන ද්‍රව්‍ය වැඩපල වෙත ප්‍රවාහනය කිරීම කොන්ත්‍රාත්කරු විසින් කල යුතුයි. ප්‍රවාහනය සඳහා අමතර ගෙවීමක් දෙපාර්තමේන්තුව විසින් නොගෙවන අතර, කොන්ත්‍රාත්කරු විසින් එකී වියදම් දැරිය යුතුයි.

කො. සී. තී. ප්‍රනාන්දු,
වාරිමාර්ග ඉංජිනේරු, කවුඩුල්ල ව්‍යාපාරය.

1965.11.3 වෙනි දින,
මින්නේරියේ දීය.

11-416—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### පේරාදෙණියේ, රාජකීය උද්‍යානයට ගොම පොහොර, රබල් සහ මැටල් සැපයීම

පේරාදෙණියේ, රාජකීය උද්‍යානයේ, උද්‍යාන අධිකාරි කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් පේරාදෙණියේ රාජකීය උද්‍යානයට මෙහි පහත සඳහන් ප්‍රමාණයන් ගොම පොහොර, රබල් සහ මැටල් සැපයීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර පහත සඳහන් කොන්දේසි අනුව 1965 නොවැම්බර් මස 29 වැනි දින පස්වරු 2.30 වන තෙක් භාර ගනු ලැබේ.

| | | |
|---|---|---|
| ගොම පොහොර කියුබ් | ... | 150 |
| අඟල් 9 රබල් | ... | 10,000 |
| අඟල් 3/4 මැටල් කියුබ් | ... | 6 |

මෙම එක් එක් ද්‍රව්‍යයන් සඳහා වෙන වෙනම ටෙන්ඩර් ඉල්ලුම් පත් ඉදිරිපත් කළ යුතු බව විශේෂයෙන් සැලකිය යුතුය. ගොම පොහොර උද්‍යාන අධිකාරි තැනගේ අවශ්‍යතාවයන් අනුව ඔහු විසින් ඉල්ලුම් කරනු ලබන පරිදි වරින් වර කීප විතාවකදී සැපයිය යුතු වෙයි.

රබල් සහ මැටල් එකවරම සැපයිය යුතු වෙයි.

2. පේරාදෙණියේ, රාජකීය උද්‍යානයේ උද්‍යාන අධිකාරි කාර්යාලයෙන් ලබාගත හැකි ලද පෝර්මවල ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතුය.

සෑම ටෙන්ඩර් පත්‍රයක්ම දෙපිටපතකින් යුක්ත විය යුතු අතර නිසිලෙස අත්සන් කොට මුද්‍රා තැබූ කවරවල බහා "පේරාදෙණියේ, රාජකීය උද්‍යානයේ, උද්‍යාන අධිකාරි කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති' නමට ඉදිරිපත් කළ යුතුයි. කවරයෙහි ඉහළ වම් කෙළවරේ "පේරාදෙණියේ, රාජකීය උද්‍යානයට ගොම පොහොර සැපයීම" හෝ "පේරාදෙණියේ, රාජකීය උද්‍යානයට රබල් සැපයීම" හෝ "පේරාදෙණියේ, රාජකීය උද්‍යානයට මැටල් සැපයීම" කියා හෝ යථායෝග්‍ය පරිදි සඳහන් කළ යුතුය.

3. එක් එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රුපියල් 10ක් තැන්පත් කළ බවට රිසිට් පත් ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් පෝර්ම ලබා ගත හැකිය. 1965 නොවැම්බර් මස 28 වැනි දින දවල් 11.30 වන තෙක් ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ඕනෑම දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති කාර්යාලයක හෝ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයයේ හෝ මෙම ටෙන්ඩර් ගාස්තු තැන්පත් කළ හැකියි. ගිවිසුම් පත්‍ර අත්සන් කිරීමෙන් පසු තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ. තෝරාගත් ටෙන්ඩර්කරු වෙත ටෙන්ඩරය භාරගත් බව දන්වා දින 10ක් ඇතුළත අවශ්‍ය ඇප තැන්පත් කිරීමට හෝ ගිවිසුම පත්‍රය අත්සන් කිරීමට හෝ නොහැකි වී නම් ඔහු විසින් තැන්පත් කරන ලද ටෙන්ඩර් ගාස්තුව රාජසන්තක කරනවාත් හැර ඔහුගේ නම රජයේ කොන්ත්‍රාත්තු පැහැර හැරියවුන්ගේ නාම ලේඛනයට ඇතුළත් කරනු ලැබේ. එහෙත් මේ නිසා ඔහුගෙන් රජයට අයවිය යුතු යම් මුදලක් ඇතොත් එය අය කරගැනීමට බාධාවක් නොවේ.

4. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුය. නැත හොත් මුද්‍රා තැබූ කවරවල බහාලන ලද ටෙන්ඩර් පත්‍ර ඉහත සඳහන් පරිදි සපයනු ලබන ද්‍රව්‍යයේ නමද ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයද කවරයේ සඳහන් කොට පේරාදෙණියේ, රාජකීය උද්‍යානයේ උද්‍යාන අධිකාරි කාර්යාලයයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන වෙත ටෙන්ඩර්කරු විසින් හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් හෝ පෞද්ගලිකව භාර දිය යුතුය. ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලබන දිනම ලියාපදිංචි තැපැලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දින සිට දින හතරක් ඇතුළත යම් ටෙන්ඩර් කරුවෙකුට එවැනි දැන්වීමක් නොලැබුණු නම් ඒ බව පේරාදෙණියේ, රාජකීය උද්‍යානයේ, උද්‍යාන අධිකාරි කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත ඔහු විසින්ම වහාම දැන්විය යුතුයි.

5. කැමති නම් ටෙන්ඩර් විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට ටෙන්ඩර්කරුවන්ට අවසර ඇත. ටෙන්ඩර් පත්‍ර භාරගනු ලබන අවසාන දින එකී වේලාවට පේරාදෙණියේ, රාජකීය උද්‍යානයේ උද්‍යාන අධිකාරි කාර්යාලයයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ.

6. පිළිගත් පෝර්මයෙහි ඉදිරිපත් නොකරන ලද හෝ එහි සඳහන් කොන්දේසිවලට එකගෙලා අනුකූල නොවන කිසිම ටෙන්ඩරයක් පිළිගනු නොලැබේ.

7. ටෙන්ඩර්කරුවන් විසින් ඔවුන්ගේ ලිපිනයෙන් ටෙන්ඩර් පත්‍රිකාවේ පැහැදිලි ලෙස සඳහන් කළ යුතුයි.

8. ටෙන්ඩර් පත්‍රිකා විවෘත කර සති තුනක් ගතවනතුරු ටෙන්ඩර් පත්‍රිකා පිළිගැනීම සඳහා ඉඩ ඇති බව ටෙන්ඩර්කරුවන් විසින් සැලකිය යුතුය.

9. කිසියම් ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ පත්‍රිකා සියල්ලම හෝ ප්‍රතික්ෂේප කිරීමෙත් කිසියම් ටෙන්ඩරයක කොටසක් පමණක් පිළිගැනීමෙහිත් අයිතිය කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා සතුය.

10. පෞද්ගලිකව ටෙන්ඩර්කරු වෙත භාර දෙන ලද හෝ ටෙන්ඩර් පත්‍රයේ සඳහන් ලිපිනයට ලියාපදිංචි කළ හෝ ටෙන්ඩරයට අදාළ සෑම දැන්වීමක්ම ටෙන්ඩර්කරු අතට පත්කළ සේ සළකනු ලැබේ.

11. 1931 වර්ෂයේ අංක 19 දරණ කම්කරු ආඥාපනතේ (117 වැනි අධිකාරය) යටතේ සේවයෙහි යොදන ලද කම්කරුවෙකු විසින් හෝ කම්කරුවෙකු වෙනුවෙන් ඉල්ලනු ලබන වන්දියකින් කොන්ත්‍රාත් කරු විසින් රජය නිදහස් කළ යුතුය.

12. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ රජය මඟින් තබා ඇති ලේඛනයේ තනි තනිව හෝ ලේඛනයේ නම් සඳහන් වෙනත් අයෙකුගේ නම සමග හෝ ඇතුළුවී සිටින යම් පුද්ගලයෙකු සමග හෝ කෘෂිකර්ම අධ්‍යක්ෂවරයාට හැඟී යන හේතු නිසා හෝ කොන්ත්‍රාත්තුව භාරදීම නුසුදුස්සකු ලෙස සළකා ඔහු විසින් විරෝධය දක්වන කිසිවෙකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

13. මෙ පිළිබඳ වැඩි විස්තර පේරාදෙණියේ, රාජකීය උද්‍යානයේ උද්‍යාන අධිකාරි කාර්යාලයෙන් දැනගත හැකිය.

ඩී. සී. එල්. අමරසිංහ,
කෘෂිකර්ම අධ්‍යක්ෂ;

11-328—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

ලෙස වැඩය නිම කරන වගට ඇපයක් වශයෙන් ටෙන්ඩරයේ සඳහන් මුදලින් 10%ක් ටෙන්ඩර්කරු විසින් තැන්පත් කළ යුතුය. ගිවිසුම අත්සන් කළ පසු සියළුම ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු ඇත.

6. පිළිගත් ටෙන්ඩරය අනුව ගිවිසුමකට ඇතුලත් වන ලෙස තෝරා ගත් ටෙන්ඩර්කරුට දැනවීමෙන් පසුව ද, එසේ කිරීමට ඔහු අසමත් වුවහොත් ඔහුගේ ටෙන්ඩර් ඇප මුදල රාජසන්තක කොට ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ නාමලේඛනයට ඇතුලත් කිරීමට ක්‍රියා කරනු ඇත.

7. කිසිම හේතුවක් නොදක්වා, ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් හෝ ප්‍රතික්ෂේප කිරීමේ හෝ ඕනෑම ටෙන්ඩර් පත්‍රයක ඕනෑම කොටසක් පිළිගැනීමේ හෝ බලය රජයට ඇත.

8. හලාවත ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ හෝ ඔහු විසින් බලය පවරන ලද නියෝජිතයාගේ හෝ අවසරයක් නොමැතිව කොන්ත්‍රාත්තුව අන් කෙනෙකුට නොපැවරිය යුතුය.

9. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ නාම ලේඛනයට තනිව හෝ වෙනත් පුද්ගලයෙකුගේ නමක් සමග නම ඇතුලත් වී ඇති කිසිවකු සමග හෝ තමාට ප්‍රමාණවත් යයි හැගෙන හේතුන් උඩ, හලාවත ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විරුද්ධ වන කවරෙකු සමග හෝ ගිවිසුමකට නොබැඳෙනු ඇත.

10. ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය දක්වා ඕනෑම දිනයක කාර්යාලීය වේලාවන් තුලදී සැලසුම් පරීක්ෂා කර බැලීමට හලාවත ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් ටෙන්ඩර් කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් වැඩ විස්තර පත්‍රිකාවෙහි ඇතුලත් කළයුතු විස්තර ප්‍රමාණවත් ලෙස සඳහන් නොකිරීම නිසා ටෙන්ඩර් පත්‍රිකාවල ඇතිවන වැරදි ගැන දෙපාර්තමේන්තුව වග නොකියනු ඇත. යෝජිත ස්ථානයත්, සැලසුම් ආදියත් පරීක්ෂා කර බැලීමෙන් ද, වෙනත් අවශ්‍ය වැඩි විස්තර ගැන කාර්යාලීය වේලාවන් තුලදී හලාවත ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් විමසීමෙන් ද, ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අය, අවශ්‍ය සේවය කුමක්දැයි හොඳින් වටහා ගත යුතුය.

11. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් පමණය. "ලාංකික" යනුවෙන් අදහස් වන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ලංකාවේ පුරවැසියන් වූ අය යි.

12 තෝරා ගනු ලැබූ කොන්ත්‍රාත් කරු ලංකාණ්ඩුව සඳහා හෝ ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින හලාවත ගොවිජන සේවා සහකාර කොමසාරිස් සමග ගිවිසුමකට ඇතුලත් විය යුතුය. "ගොවිජන සේවා සහකාර කොමසාරිස්" යනුවෙන් හැඳින් වෙන්නේ දැනට ලංකාණ්ඩුව යටතේ එම තනතුරු දරණ නිලධාරී තැනය. ගිවිසුම් පත්‍රයේ අඩංගු විය යුත් මුද්දර කොන්ත්‍රාත් කරු විසින් සැපයිය යුතුය.

13. හලාවත ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන වෙනත් නිලධාරියකු විසින් 1965 නොවැම්බර් මස 24 දින පෙ. ව. 9.30 ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ. පැමිණ සිටින ටෙන්ඩර් කරුවන්ගේ දැන ගැනීම සඳහා, ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් හා ඒවායේ සම්පූර්ණ මිළ ගණන් කියවනු ලැබේ. වැඩි විස්තර කියවීමක් හෝ දැන්වීමක් නොකරනු ඇත. ඕනෑම ටෙන්ඩර් කරුවකුට මුළු ගණන් පරීක්ෂා කිරීමට වුවමනා නම් මුල් ටෙන්ඩර් පත්‍රවල අවසාන පිටුව බැලීමෙන් එසේ කළ හැක.

14. ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ සියළුම මිළ ගණන් ටෙන්ඩර් විවෘත කළ දින පටන් මසක් ගතවන තුරු වලංගුව තැබිය යුතුය.

ගොවිජන සේවා සහකාර කොමසාරිස්,
පුත්තලම දිස්ත්‍රික්කය.

හලාවත,
ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන ගේ කාර්යාලය,
1965 නොවැම්බර් මස 3 දින දීය.

11–394—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

---

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් කොළඹ, මරදානේ ට්‍රිපෝලි වෙළඳ සැලෙහි පිහිටි රෝහල් සැපයීමේ අංශයේ මූලස්ථානයට 1966.9.30 දිනින් අවසාන වන කාල පරිච්ඡේදය තුළ දී විනාකිරි සැපයීම පිණිස ටෙන්ඩර 1965 දෙසැම්බර් මස 3 වැනි සිකුරාදා දවල් 1.30 දක්වා කොළඹ කොටුවේ චැතැම් වීදියේ අංක 62 දරණ ස්ථානයේ සිටින අලෙවි කිරීමේ කොමසාරිස් විසින් භාර ගනු ලැබේ.

කොළඹ කොටුවේ චැතැම් වීදියේ අංක 62 දරණ ස්ථානයේ පිහිටි අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයෙන් 1965 දෙසැම්බර් මස තුන් වෙනි දින දවල් 12 වන තුරු ලබා ගත හැකි පෝරම්වල ටෙන්ඩර් මිළ ලියා එහි අනුපිටපතක් ද සමග එවිය යුතුයි.

වැඩි විස්තර ඉහත සඳහන් අලෙවි කිරීමේ කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් දැන ගන්නට පුළුවන.

පී. ජී. ජී. ධර්මසිරි,
වැ. බ. අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1965 නොවැම්බර් 6 වැනි දින,
කොළඹ 1,
අංක 62, චැතැම් වීදියේ,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ දී ය.

11–435—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය .

---

## කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

### ජලකර වායුව පිළියෙල කිරීමට වුවමනා ඇලුමිනියම් කැබලි සැපයීම සඳහා මිල ගණන් ඉදිරිපත් කිරීම

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට හොණ්ඩර 40 පමණ ඇලුමිනියම් (කැබලි වශයෙන්) වුවමනා කර තිබේ. (එසේ වුවමනා කරන්නේ ලියන පට්ටලයෙන් කැපී යන කැබලි, යම් වැඩකට ඇලුමිනියම් පාවිච්චි කිරීමේ දී ඉතිරිවන කැබලි, තුනීකොළ ආදී වශයෙනි) මෙම කැබලි සාමාන්‍ය බෙලෙක් වැඩ කරුවෙකුගේ කතුරෙන් කැපිය හැකි තුනී ඒවා විය යුතුයි. තුනී කොළ හෝ කැබලි වශයෙන් සපයන්නේ නම්, තින්ත, කඩදාසි ආදී අපිරිසිදු දේ ඉවත් කොට සැපයිය යුතුයි.

1965 දෙසැම්බර් මස 27 වෙනි දින හෝ ඊට පෙර මෙම ඇලුමිනියම් සැපයිය යුතුය.

මෙම ද්‍රව්‍ය සැපයීමට බලාපොරොත්තු වන්නන් මිල ගණන් හා සැම්පල් සීල් යෙදූ කවරවල බහා, 1965 නොවැම්බර් මස 25 වෙනි දින දවල් 12 ට පෙර මා වෙත ලැබෙන්නට සැලැස්විය යුතුයි. මිල ගණන් දක්විය යුත්තේ, හෝනිවල දමා හොණ්ඩරයක් කීය. බැගින් මෙම කාර්යාලයට සැපයිය හැකි ද යනුයි.

එල්. ඒ. ඩී. අයි. ඒකනායක,
අධ්‍යක්ෂ,
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව.

1965. 10. 30,
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව,
බුලර්ස් පාර, කොළඹ 7.

11–235—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

---

## ලුණු දෙපාර්තමේන්තුව

වර්ෂ 1966 ජනවාරි මස 1 වැනි දින සිට 1966 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා අලිමන්කඩ ලුණු ලේවායට (ඉරු දෙකේ) පොල් අතු 4,00,000ක් පමණ සැපයීම සහ ගෙනවිත් භාරදීම සඳහා ටෙන්ඩර් පත්‍ර කොළඹ, අංක 48 ශ්‍රී ජිනරතන පාරේ, කර්මාන්ත හා ධීවර අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1965 දෙසැම්බර් මස 3 වැනි දින පස්වරු 3 වනතුරු භාරගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර සැපයිය යුත්තේ 1965 දෙසැම්බර් මස 2 වෙනිදා පස්වරු 3 වනතෙක් නිකුත් කරනු ලබන අනු පිටපත සමග ලුණු කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් හෝ අලිමන්කඩ ප්‍රධාන ලුණු අධිකාරි තැනගෙන් ලබාගත හැකි ටෙන්ඩර් ආකෘති පත්‍රවලය. ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රු. 50ක් ඕනෑම කච්චේරියක හෝ ලුණු කොමසාරිස් කාර්යාලයෙහි බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

වැඩි විස්තර ලුණු කොමසාරිස් කාර්යාලයෙන් හෝ අලිමන්කඩ ප්‍රධාන ලුණු අධිකාරි කාර්යාලයෙන් ලබාගත හැකිය.

ජේ. ජේ. ජී. අමිර්තනායගම්,
වැඩ බලන ලුණු කොමසාරිස්.

සීජී. 292
1965 නොවැම්බර් මස 4 වැනි දින,
කොළඹ 2.

11–400—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

මගේ අංකය : එප්ටීසී/6/65 සබඳි.

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### සැහැල්ලු ගිලන් රථ සහ සැහැල්ලු වෑන් සැපයීම

පහත ලේඛනයේ නාම වශයෙන් නියම කර ඇති ආකාරයට කොළඹ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත සැහැල්ලු ගිලන් රථ සහ සැහැල්ලු වෑන්ස් සැපයීම සඳහා 1965 දක්වා සෞඛ්‍ය අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩල සභාපති විසින් ටෙන්ඩර භාර ගනු ලැබේ.

2. ටෙන්ඩර් ඉදිරිපත් කිරීමේදී ටෙන්ඩර්කරුවන් විසින් පහත සඳහන් අවශ්‍යතාවයන් සපුරා ලිය යුතු වෙයි :—

(i) උපලේඛනයේ සඳහන් අයුරින් සීමාවක් තබා ඕනෑම ප්‍රමාණයක් සඳහා මිල සඳහන් කිරීම කළ හැකිය. ටෙන්ඩරයේ ඉදිරිපත් කළ ප්‍රමාණය සඳහන් කළ යුතුය.

(ii) වරාය ගාස්තුවලින් පමණක් තොරව, අඩු වශයෙන් ටෙන්ඩර් අවසන් කළ දින සිට දෙමසක කාල පරිච්ඡේදයකට බලපාන සේ මිල ලංකා මුදලින් සඳහන් විය යුතුය.

(iii) (ඒ) ඉදිරිපත් කරනු ලබන සැපයුම් .—මෙහි පහත උපලේඛන කොට ඇති විස්තරයනට අනුකූල විය යුතුය. කෙසේ හෝ මිල ගණන් පත්‍රිකා සංශෝධිත විශේෂ විස්තරයක් අනුව ඒවා සවිස්තරව දක්වමින් ඉදිරිපත් කිරීම කළ හැකිය.

(බී) පහත උපලේඛනය කොට දක්වා ඇති භාරදීම් කොන්දේසි වලට අනුකූලව සැපයීම බාරදීම විය යුතුය.

(iv) පහත දක්වෙන කරුණු ටෙන්ඩරයේ සඳහන් විය යුතු වන්නේ ය :—

(ඒ) නිෂ්පාදකයාගේ නම සහ ලිපිනය,

(බී) නිෂ්පාදිත රට,

(සී) නිෂ්පාදිත දිනය,

(ඩී) ඉදිරිපත් කරන ලද භාණ්ඩයේ නිෂ්පාදන වර්ගය හා ආකාරය,

(ඊ) බාරදීමේ කොන්දේසි.

3. ටෙන්ඩර්කරුවන් තමන් විසින් පිළියෙල කර ගත් ටෙන්ඩර් ආකෘති පත්‍ර පිටපත් දෙකකින් යුත් සිල් තබන ලද කවරයක බහා ඉදිරිපත් කළ යුතු වෙයි. එසේ සිල් තබන ලද කවරයේ වම පස උඩ කෙළවර, " සැහැල්ලු ගිලන් රථ, බර ගිලන් රථ, සැහැල්ලු වෑන්ස් සහ ලොරි චෙයිස් සැපයීම සඳහා ටෙන්ඩර්, 1965.4.27 දින උදය 10ට නියමිත " යනුවෙන් සඳහන්කර, සභාපති, ටෙන්ඩර් මණ්ඩලය, සෞඛ්‍ය අමාත්‍යාංශය, තැ.පෙ. 500, පළමු වන මහල, ගාලු මුවදොර මහා ලේකම් ගොඩනැගිල්ල, කොළඹ, යන ලිපිනයට ඇමතිය යුතු වෙයි.

4. ටෙන්ඩර්, කොළඹ, ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ, සෞඛ්‍ය අමාත්‍යාංශ කාර්යාලයේ අංක 155 වැනි කාමරයේ ඇති තැපැල් පෙට්ටියට දැමීම හෝ ලියා පදිංචි කළ තැපෑලෙන් හෝ කළ යුතු වෙයි. එසේ තැපෑලෙන් එවීමට අකමැති ටෙන්ඩර්කරුවන්, තමන් හෝ තමන්ගේ නියෝජිතයන් මගින් මෙහි 3 වන ඡෙදයේ ලිපිනයේ ඇති, එවැනි ටෙන්ඩර් පත් බාර ගැනීමේ බලය ලත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහකාර ලේකම් තැනට පුද්ගලිකව අතින් බාර දිය හැක. එසේ බාර දෙන සිල් තබන ලද කවරයේ පසෙක එම සැපයීම සම්බන්ධ විස්තර හා ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය ද, පැහැදිලිව සඳහන් කළ යුතු වෙයි. ටෙන්ඩර් බාර ගත් බවට කුවිතාන්සියක් එම නිලධාරි තැන විසින් සිල් තබන ලද ටෙන්ඩරය බාර දුන් අයට නිකුත් කරනු ඇත.

5. මුදලින් රු. 100 (රුපියල් සියයක්) පිට පළාතක කච්චේරියක හෝ කොළඹ යෝක් වීදියේ පිහිටි ලංකා බැංකුවේ මගේ ගිණුමේ අංක 20 තැන්පත් කළ යුතු වෙයි. එසේ මුදල් තැන්පත් කළ බවට ලබාගත් කුවිතාන්සියක් ද ටෙන්ඩරයට අමුණා එවිය යුතුය. ලංකා බැංකුවේ මුදල් තැන්පත් කිරීම සඳහා අවශ්‍ය ආකෘති පත්‍ර, කොළඹ 10, ඩීන්ස් පාරේ අංක 355 දරණ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ තැනගේ (සැපයුම්) කාර්යාලයෙන් ලබා ගත හැක.

6. ඉදිරිපත් කරන ලද ටෙන්ඩර ඉල්ලා අස්කර ගැනීමට ටෙන්ඩර් කරුවන්ට අවසර දෙනු නොලැබේ.

7. ටෙන්ඩරයක් හෝ ටෙන්ඩර් සියල්ලම හෝ කිසිදු ප්‍රශ්න කිරීමක් නොමැතිව ප්‍රතික්ෂේප කිරීමේ බලය ටෙන්ඩර් මණ්ඩලය වෙත සතුව ඇත. මෙම ප්‍රකාශණයේ සඳහන් සියළුම කොන්දේසි තදින් අනුගමනය කළ යුතු අතර, එසේ නොවන ටෙන්ඩර් සැලකිල්ලට භාජනය කරනු නොලැබේ.

8. සාර්ථක ටෙන්ඩර්කරු නියමිත කාල සීමාව තුළදී මෙම සැහැල්ලු ගිලන් රථ සහ සැහැල්ලු වෑන් සැපයීමට අපොහොසත් වුවහොත් එවිට ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රජය සතු වනවා පමණක් නොව තව දුරටත් අවශ්‍ය කටයුතු කිරීම සඳහා මෙම කරුණ නිසි බලධාරීන් වෙත දන්වනු ලැබේ.

9. මෙහි ඉහත 1 වන ඡෙදයේ සඳහන් ස්ථානයේ, නියමිත දිනයේ නියමිත වේලාවට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවනට එහි සිටීමට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් කරුවන්ගේ නම් සහ ඉදිරිපත් කරන ලද මිල ගණන් පැමිණ සිටි ටෙන්ඩර්කරුවන් ඉදිරියේ කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවකුට ටෙන්ඩරයක් පරීක්ෂා කිරීමට අවශ්‍ය නම් ඒ සඳහා ටෙන්ඩර් මණ්ඩල සභාපති සමග කටයුතු පිළියෙළ කර ගැනීමෙන් පසු ලැබී ඇති ඕනෑම ටෙන්ඩරයක දෙවන පිටපත පරීක්ෂා කර බැලීමට ඉඩ දෙනු ලැබේ.

10. මේ සම්බන්ධව වැඩි විස්තර ටෙම දන්වීමේ 5 වන ඡෙදයේ සඳහන් ලිපිනයේ ඇති සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ තැනගෙන් ලබා ගත හැක.

එස්. බාලක්‍රිෂ්නන්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

කොළඹ,
නොවැම්බර් 4 වන දින.

### උපලේඛනය "ඒ"

| විස්තරය | | අවශ්‍ය ප්‍රමාණය |
|---|---|---|
| සැහැල්ලු මෝටර් ගිලන් රථ | | සම්පූර්ණ විස්තරය |
| 1. | භාර බර | ... හොණ්ඩර 20–25. |
| 2. | රෝද සැලැස්ම | ... 90" හෝ ඊට වැඩි. |
| 3. | බී. එච්. පී. | ... 30–45 මිනිත්තුවකට රවුම් 4200 කට වඩා නොකරකැවෙන වේගයකින්. |
| 4. | සිලින්ඩර ගණන | ... 4 (2 රෝද ධාවනය–දකුණු පස ස්ටියරිනය). |
| 5. | ශරීරය ගොඩගැනීම | ... සියල්ල ලෝහ හෝ ෆයිබර් ග්ලාස් හෝ දෙවර්ගයේම සම්මිශ්‍රණයෙන් හෝ ; සර්ම කලාපීය දේශගුණයට සුදුසු විය යුතුය. |
| 6. | ගෙනයාමේ ඉඩකඩ | ... රෝගීන් ගෙනයාමේ මැසි කොප්පු 2ක් හා, හිඳ ගැනීමේ කොප්පු 1ක් ; මැසි කොප්පුවක් බවට පරිවර්තනය කළ හැකි සහ හිඳ ගැනීමේ කොප්පු 3ක්. |
| 7. | අවශ්‍ය බඩු මුට්ටු | ... තද පාවිච්චියට හා සේදීමට ඔරොත්තු දෙන ද්‍රව්‍ය සමග යට වැතිරීම පිණිස ෆෝර්ම් රබර්. |
| 8. | වාතාශ්‍ර ක්‍රමය | ... සම්පූර්ණ (කොම්ප්‍රිහෙන්සිව්) වාතාශ්‍ර ක්‍රමය. සර්ම කලාපීය දේශගුණය සඳහා විදිලිය පංකා (ෆෑන්) ආධාරකයෙන් හෝ අන් සමාන ලෙසකින්. |
| 9. | අතිරේක ආයුධ | ... ආලෝක කළ රතු කුරුසය. ඉදිරි සහ පසු පස යොමු කරන ආලෝක, සාමාන්‍ය සංඥාවට (හෝර්න්) අතිරේකව සිනුවක්. |
| 10. | පොදු | ... ගිලන් රථය, අමතර රෝදයකින්, ටයරය කින්, විදුලිබයකින් හා ආයුධ හා අතිකුත් උපකරණවලින්ද, කැමැති පරිදි ප්ලාස්ටික් හෝ ෆයිබර් ග්ලාස්වලින් සෑදූ සේදීමේ බේසමක් හා ගැලුම් 4ක ප්‍රමාණයක වතුර ටැංකියකින් සම්පූර්ණ විය යුතුය. |
| | | ප්‍රථමාධාර පෙට්ටිය—12" × 8" × 4" ගැඹුරු විය යුතු අතර, ලෝහමය නිපැයුමක් නොවිය යුතුය. |
| | | රථය පටි පැත්තෙහි සවි කොට ඇති සියළුම කොටස් පාරෙහි මතු පිට සිට 6" ක පරතරයක් සේ සාද තිබිය යුතුය. |
| 11. | පින්තාරු වැඩ | ... පිටත සම්පූර්ණ සුදු. ඇතුළත ලා අලු පාට. ඇතුළත කිරවලින් යුතු පැහැදිලි ආරක්ෂිත විදුරුවලින් ද සෑදුන දෙපස ජනේල. එන්ජින් කොටස සම්පූර්ණයෙන් ම ශබ්ද තොර කොට තැබිය යුතුය. 15" රෝද සුදුසු වෙයි. |

### උපලේඛනය "බී"

| විස්තරය | | අවශ්‍ය ප්‍රමාණය |
|---|---|---|
| සැහැල්ලු වෑන්ස් | | සම්පූර්ණ විස්තරය |
| 1. | භාර බර | ... හොණ්ඩර 20–25 |
| 2. | රෝද සැලැස්ම | ... 80" සිට 100". |
| 3. | බී. එච්. පී. | ... 40 සිට 50. මිනිත්තුවකට රවුම් 4200 කට වඩා නොකරකැවෙන වේගයකින්. |
| 4. | සිලින්ඩර ගණන | ... හතරයි. (රෝද දෙකේ ධාවනය—දකුණු අත ස්ටියරිනය) |
| 5. | ශරීරය ගොඩගැනීම | ... සියල්ල ලෝහ හෝ ෆයිබර් ග්ලාස් හෝ දෙවර්ගයේම සම්මිශ්‍රණයෙන් හෝ ; සර්ම කලාපීය දේශ ගුණයට සුදුසු විය යුතුය. |
| 6. | ගෙන යාමේ ඉඩකඩ | ... 7 සිට 10 දක්වා පුද්ගලයින්. |
| 7. | අවශ්‍ය බඩු මුට්ටු | ... තද පාවිච්චියට ඔරොත්තු දෙන ද්‍රව්‍ය (මැටීරියල්) සමග යට වැතිරීම පිණිස ෆෝම් රබර්. |

| විස්තරය සැහැල්ලු වෑන්ස් | | අවශ්‍ය ප්‍රමාණය සම්පූර්ණ විස්තරය |
|---|---|---|
| 8. වාතාශ්‍ර ක්‍රමය | ... | සම්පූර්ණ (කොම්ප්‍රිහෙන්සිව්) වාතාශ්‍ර ක්‍රමය. සර්ම කලාපීය දේශ ගුණය සඳහා විදිලිය පංකා (ෆෑන්ස්) ආධාරකයෙන් හෝ අන් සමාන ලෙසකින්. |
| 9. පොදු | ... | වෑන් රථය, අමතර රෝදයකින්, ටයරයකින්, ටියුබයකින් හා ආයුධ හා අනිකුත් උපකරණවලින් ද සම්පූර්ණ විය යුතුය. අඟල් 15වේ රෝද සුදුසු වෙයි. උපකරණ වල විස්තර හා මිල ගණන් සඳහන් කළ යුතුය. |

ටෙන්ඩර්කරුවන් සෑම විෂය අංකයක් වෙනුවෙන්ම රුපියලක මෙරට වටිනාකම සහ විදේශ විනිමය වටිනාකම වෙන වෙනම සඳහන් කළ යුතු වන්නේය.

' ඒ ' සහ ' බී ' උපලේඛනවල සඳහන් වන වාහන මාර්ගයේ ගමන් කර විය හැකි තත්වයෙන්, කොළඹ 1, ගාලු මුවදොර මහා ලේකම් ගොඩ නැගිල්ලේ සෞ.සේ.අ. කාර්යාලයෙහි ප්‍රවාහන නිලධාරි වෙත, ඇනවුම් කළ දින සිට තෙමසක් ඇතුළත බාර දිය යුතුය. සෞ.සේ.අ. විසින් දක්වා ඇති පරිදි, දේශීය නියෝජිතයන් විසින් බාර දෙනු ලබන වාහනවල '' සෞඛ්‍ය දෙපාර්තමේන්තුව '' යන අකුරුවලින් යුතු පාඨය සිංහල, ඉංග්‍රීසි, දෙමළ යන භාෂා තුනෙන් ම සඳහන් විය යුතුය. මාර්ගයේ ගමන් කරවීමේ සුදුසු බවට වාහන පත් කිරීමට යන වියදම් වෙන වෙනම් දේශීය නියෝජිතයන් දක්විය යුතු වන්නේ ය.

ටෙන්ඩර්කරු ණයවර ලිපියක් විවෘත කරන්නට යයි රජයෙන් ඉල්ලා සිටින්නේ නම් මෙම සැපයීමේ මිල සහ කොළඹට ගෙන ඒමේ ගාස්තු සහිතව මිල නිෂ්පාදන රටේ මුදලින් හා ලංකා මුදලින් ද සඳහන් කළ යුතුය.

සඳහන් කර ගත යුතු.—අමතර කොටස් හා සතුටුදායක අළුත් වැඩියා කිරීම් පහසුකම් ප්‍රාදේශිකව ඇත්දැයි ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කළ යුතුය.

11-386—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—කොළඹ කොට්ඨාශය

### දෙහිවල, කළුබෝවිල දකුණු කොළඹ මහ රෝහලේ හෙදි නිවාසයට පිසන ලද ආහාර සැපයීම

සේවය සහ ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළහැකි අය.—දකුණු කොළඹ මහ රෝහලේ වෛද්‍ය අධිකාරි තැන විසින් 1965.12.1 වෙනි දින සිට 1966.11.30 දක්වා කාලය ඇතුලත එම රෝහලේ හෙදි නිවාසයට පිසන ලද ආහාර සහ වෙනත් දේවල් සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර ලාංකිකයන්ගෙන් හෝ ලාංකික වෙළඳ ආයතනවලින් කැඳවනු ලැබේ.

2. ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.—සෑම ටෙන්ඩර් පත්‍රයක් සඳහා රු. 25/-ක තැන්පත් මුදලක් මුදල් ඇනවුමකින් දකුණු කොළඹ මහ රෝහලේ වෛද්‍ය අධිකාරි නමින් තැන්පත් කළ යුතුය.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති, ලියා පදිංචි කරණ ලද සමුපකාර සමිති ඇතුලු විවිධ සේවා සමුපකාර සමිති හා සමාගම් ආදිය තැන්පත් මුදලක් නොමැතිව ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ හැකි අතර ඔවුන් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කරණ විට යථෝක්ත සමිතියේ ලියා පදිංචි අංකය සඳහන් කල යුතුය.

(II) ටෙන්ඩර් පත්‍ර.—ටෙන්ඩර් පත්‍ර භාරගන්නා දිනයට පෙර දින දහවල් 12 වනතෙක් දකුණු කොළඹ රෝහලේ වෛද්‍ය අධිකාරි කාර්යාලයෙන් ටෙන්ඩර් පත්‍ර ලබා ගත හැක. ටෙන්ඩර් පත්‍ර තැපැල් මගින් ඉල්ලුම් කරන විට එම ටෙන්ඩර් නියමිත දිනට ලැබිය හැකිවන පරිදි කල් වේලා ඇතුව ඉල්ලුම් කළ යුතුය.

3. වත්කම් පිළිබඳ විස්තර.—ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට පෙර සියලුම ටෙන්ඩර් කරුවන් විසින් තම තමන්ගේ වත්කම් පිළිබඳ විස්තරයක් මා වෙත ඉදිරිපත් කළ යුතුය. මේ සඳහා නියමිත පෝර්ම කොළ මාගේ කාර්යාලයෙන් ලබාගත හැක.

වත්කම් පිළිබඳ හෝ මුදල් තත්වය පිළිබඳ සාදක සැපයීමට අපොහොසත්වීමෙන් ටෙන්ඩර් සඳහා තැන්පත් කල මුදල රාජසන්තක විය හැක.

4. ද්‍රව්‍ය ප්‍රමාණය.—සැපයිය යුතු ද්‍රව්‍යවල දල ප්‍රමාණය මෙහි ඇති උප ලේඛනයේ 5 වෙනි තීරයේ දක්වා ඇත.

5. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළයුතු ආකාරය.—ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුක්තව කවරයක බහා දෙහිවල, කළුබෝවිල, දකුණු කොළඹ මහ රෝහලේ වෛද්‍ය අධිකාරි වෙත එවිය යුතුය. සිල් තබන ලද ටෙන්ඩර් පත්‍ර බහා ඇති කවරයේ වම් පස උඩ කෙළවරේ සේවය පිළිබඳ විස්තරයක්ද, වම් පස පහත කොටසේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය ද විය යුතුය. සිල් තබන ලද ටෙන්ඩර් පත් බහාලූ ලිපිය ලේඛන ගත තැපෑලෙන් හෝ මෙම කාර්යාලයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් ඉදිරිපත් කළ හැකිය. ලේකම් තැනට ද භාර දී ඔහුගෙන් ඒ සඳහා කුවිතාන්සියක් ලබා ගත හැක.

6. ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනය.—මෙහි ඇති උප ලේඛනයේ 4 වෙනි තීරයේ දක්වා ඇති දින පෙ.ව. 10ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් වුන වහාම එම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ.

7. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීම.—ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට එම ස්ථානයේ පෙනී සිටිය හැක. පැමිණ සිටින ටෙන්ඩර් කරුවන් ඉදිරියේ ටෙන්ඩර්කරුවන්ගේ නම සහ ගණන් විස්තර කියවනු ඇත. යම් ටෙන්ඩර්කරුවකුට කිසියම් ටෙන්ඩර් පත්‍රයක් පරීක්ෂා කිරීමට අවශ්‍ය වුවහොත් කලින් පිළියෙල කර ගෙන මා සමග හෝ මාගේ බලය ලත් නියෝජිතයෙකු සමග එකී ඉදිරිපත් කර ඇති ටෙන්ඩර් පත්‍රයේ අනුපිටපත පරික්ෂා කර බැලිය හැක.

8. ටෙන්ඩර් පත්‍ර පිළිබඳ තීරණය.—ටෙන්ඩර් පත්‍රවල සඳහන් කර ඇති ආහාරවල ගණන් විස්තර එකතු කොට ලැබෙන මුළු මුදල මත ටෙන්ඩර් භාර ගැනීමේ තීරනය කරණු ලැබේ.

ටෙන්ඩර් පත්‍රයේ ''බී'' උපලේඛනයේ ඇති අතිරේක ආහාර සඳහා ද ටෙන්ඩර් කරුවන් විසින් මිළ සඳහන් කළ යුතුය. මේ සඳහා ගෙවනු ලබන්නේ ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ හෝ එදිනෙද වෙළඳ පොලෙහි පවත්නා මිළ අතර දෙකෙන් අඩු මිළය. මිළ පාලන කර ඇති දෙයක් වෙනම් පාලනමිළ ගෙවනු ලැබේ.

9. ටෙන්ඩර් ගනන් බල පවත්නා කාල සීමාව.—ටෙන්ඩර් පත්‍රවල සඳහන් ගණන් මෙහි ඉහත 1 වෙනි පරිච්ඡේදයේ දක්වා ඇති කොන්ත්‍රාත් කාල පරිච්ඡේදය තුල බලපවත්නා අතර ගිවිසුම් පත්‍රයේ විශේෂයෙන් සඳහන් නොකර ඇතොත් කිසියම් හේතුවක් සඳහා එම ගණන් වෙනස් කළ නොහැක.

10. ඇප මුදල් තැන්පත් කිරීම.—මෙහි උප ලේඛනයේ 3 වෙනි තීරයේ සඳහන් කර ඇති අයුරු තෝරාගත් ටෙන්ඩර්කරු විසින් ඇප මුදල තැන්පත් කර ගිවිසුමක් අත්සන් කළ යුතුය.

11. ගබඩා පහසුකම්.—තෝරාගත් ටෙන්ඩර්කරුට ආයාතනයෙන් හෝ එහි භූමිය ඇතුලත ගබඩා පහසුකම සඳහා කාමරයක් සපයා දෙනු ලැබේ.

12. ටෙන්ඩර් කොන්දේසි.—ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු ටෙන්ඩර් කරුවන් ටෙන්ඩර් පත්‍රවල පිටුපස දක්වා ඇති කොන්දේසි හොඳින් කියවා එහි දක්වා ඇති උවමනාවන් ඉටු කළ යුතුය. ටෙන්ඩර් පත්‍රයේ ගිවිසුමෙහි දක්වා ඇති කොන්දේසි ටෙන්ඩර්කරුවන් විසින් සටහන් කර ගත යුතුය.

එල්. ආර්. ජේ. වොට්සන්,
සෞඛ්‍ය සේවා අධිකාරි, කොළඹ.

සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලය,
83, කින්සි පාර,
කොළඹ. 1965.11.3.

### උපලේඛනය

| (1) ආයතනය | (2) ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල රුපියල් | (3) ඇප මුදල රුපියල් | (4) ටෙන්ඩර භාර ගන්නා අවසාන දිනය සහ වේලාව | (5) ආහාර ප්‍රමාණය දළ වශයෙන් | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | මාළු | මස් | කරවල | බිත්තර | එළවළු |
| දෙහිවල, කළුබෝවිල, දකුණු කොළඹ රෝහලේ හෙදි නිවාසය | 25 0... | 500 0... | 1965.11.26 දින පෙ.ව. 10ට | 15,000 ... | 16,875 ... | 7,500 ... | 9,375 ... | 3,000 |

11-330—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ කොළඹ රෝහල් මණ්ඩලය

### සේවයට අයෝග්‍ය මෝටර් රථ මිලයට ගැනීම

කොළඹ රෝහල් මණ්ඩලයේ තිබෙන සේවයට අයෝග්‍ය පහත සඳහන් මෝටර් රථය මිලයට ගැනීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් 1965 දෙසැම්බර් මස 3 වැනි දින දහවල් 12 වන තෙක් කොළඹ රෝහල් මණ්ඩලයේ අධිකාරි විසින් භාරගනු ලැබේ. විකිණීමට තිබෙන මෝටර් රථය පහතින් දැක්වේ. එම මෝටර් රථය පහත දැක්වෙන ස්ථානයෙහි දැනට නවතා ඇත. කාර්‍යාල ඇර තබා ඇති කාලයන් තුලදී කොළඹ කාසල් වීදියේ කාන්තා රෝහලේ වෛද්‍ය අධිකාරීගේ අවසරය පිට එම රථය පරීක්ෂාකර බැලීමට පුළුවන :—

### (1) සීවී. 1697—කාසල් වීදියේ කාන්තා රෝහල

2. ටෙන්ඩර් පිටපත් දෙකකින් ඉදිරිපත් කළ යුතු අතර, රුපියල් 100 ක මුදලක් කොළඹ රෝහල් මණ්ඩලයේ අධිකාරි නමින් කච්චේරියක තැන්පත් කළ කුවිතාන්සියක් ඉදිරිපත් කර, 1965 නොවැම්බර් මස 30 වැනි දින දහවල් 12 ට පෙර ටෙන්ඩර් පෝර්ම කොළඹ රෝහල් මණ්ඩලයේ මුදල් පිළිබඳ කාර්යාලයෙන් ලබාගත හැක.

3. ටෙන්ඩර් ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම්පස උඩ කෙළවරේ "සේවයට අයෝග්‍ය මෝටර් රථ මිලයට ගැනීම සඳහා ටෙන්ඩර්" කියා සඳහන් කර කොළඹ රෝහල් මණ්ඩලයේ අධිකාරීගේ ලිපිනයට එවිය යුතුය. කවරයේ වම්පස පහත කෙලවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය සඳහන් කළ යුතුය.

4. ටෙන්ඩර්කරුවන්ට, ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී පැමිණ සිටීමට පුළුවන. පළමුවෙනි ඡේදයේ සඳහන් යටකී දිනයේ වේලාව පසුවූ වහාම, ටෙන්ඩර්පත්‍රකරුවන්ගේ නම් සහ ඉදිරිපත් කළ මිළ ගණන් ද කියවනු ලැබේ.

5. ටෙන්ඩර් විවෘත කළ පසු, දින තුනක් ඇතුලත සම්පූර්ණ මුදල ගෙවා රථවාහනය ගෙන ගිය යුතුය. එසේ ගෙන නොගිය හොත් ඔවුන්ගේ ඇප මුදල රාජසන්තක කරනු ලැබේ.

6. ටෙන්ඩර් පත්‍ර සියල්ලක්ම හෝ කොටසක් වශයෙන් භාර ගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය, කොළඹ රෝහල් මණ්ඩලයේ අධිකාරී වෙත තබාගනු ලැබේ.

බී. ඒ. ජයසිංහ,
අධිකාරී,
කොළඹ රෝහල් මණ්ඩලය.

කොළඹ රෝහල් මණ්ඩලයේ අධිකාරි කාර්‍යාලය,
මහාරෝග්‍යශාලාව,
කොළඹ,
1965 නොවැම්බර් මස 8 වෙනි දින.

11-425—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### පුත්තලම කොට්ඨාශය—කිරි නොමැති පිසූ ආහාර සැපයීම

ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයන් හා සේවා.—වර්ෂ 1966 ජනවාරි මස 1 වනදා සිට 1966 දෙසැම්බර් 31 වනදා දක්වා (දින දෙකම ඇතුලත්ව) කාලය තුළ මෙ සමඟ ඇති උප ලේඛනයෙහි පළමුවන තීරයෙහි සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකික යන්ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර පුත්තලමෙ පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරි කාර්‍යාලයේ දි සෞඛ්‍ය සේවා අධිකාරි තැන විසින් භාරගනු ලැබේ.

2. (i) ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම:—මෙහි උපලේඛනයේ දෙවන තීරයෙහි සඳහන් නියම කරන ලද මුදල මානමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම හා විවිධ සේවා සංගම් වලට අයිති සමිති වලටද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැකිය. කෙසේ හෝ එවා මෙවැනි ඉල්ලීම කරන විට ඒ ඒ සංගම්වල හෝ සමිතිවල ලියා පදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුයි.

(ii) ටෙන්ඩර් පත්‍ර.—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වන තුරු මෙම කාර්‍යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම්, රත්නපුරය සහ වවුනියා යන පලාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්‍යාල වලින් හෝ ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම පෝර්මයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම කිරීමේ දි මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුයි. ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසන් දිනට පෙර ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපෑලෙන් ඉල්ලුම කරන අය තම ඉල්ලුම් පත් කල්වේලා ඇතුව එවිය යුතුයි.

3. වත්කමෙ විස්තර.—සියළුම ටෙන්ඩර් කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම කිරීමේ දී ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට සැලකිය යුතු කාලයකට ප්‍රථම තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරින්ට හෝ දැන්විය යුතුයි. මේ සඳහා උවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡේදයේ (2) කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමෙ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දැන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. ප්‍රමාණයන්.—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැනගැනීමට මෙ සමග අමුනා ඇති උපලේඛනයෙහි 5 වන තීරය බලන්න.

5. ටෙන්ඩර් එවිය යුතු අන්දම.—සියළුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා "සෞඛ්‍ය සේවා අධිකාරි, පුත්තලම" කියා එවිය යුතුයි. සිල් කරන ලද ටෙන්ඩර් පත්‍ර බහා එවන ලද කවරයෙහි වම් පස උඩ කෙළවරෙහි එය කවර සේවාවක් සඳහාදැයි පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම් පස පහත කෙළවරේ ටෙන්ඩර් කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහාලන ලද ටෙන්ඩර් පත් මෙම කාර්‍යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියාපදිංචි කල තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව මට හෝ ගණකාධිකාරි/ලේකම් තැනට භාර දෙන්නේ නම් ටෙන්ඩර් පත්‍රිකා ලැබුණු බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබා ගත යුතුයි.

6. ටෙන්ඩර් පත්‍රිකා භාරගන්නා අවසාන දිනය.—මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 4 වන තීරයෙහි සඳහන් දිනයන්හි පෙරවරු 10 ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා මෙම කාර්‍යාලයේ දි විවෘත කරණු ලැබේ.

7. ටෙන්ඩර් පත් විවෘත කිරීම.—ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවට ටෙන්ඩර් කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර් කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන්ද පැමිණ සිටින ටෙන්ඩර් කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. යම්කිසි ඕනෑම ටෙන්ඩර් කරුවෙකු ඉදිරිපත් කරතලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමඟ කලින් පිළියෙළකර ගත් දිනෙක මවිසින් බලය පැවරූ මාගේ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. ටෙන්ඩරයන්හි තීරණය.—ටෙන්ඩර් පත් භාරගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර් කරුවන් විසින් පෝර්මයේ "බී" උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තු වන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම් වන මුළු මුදල අනුවය. එසේ වුවත් ටෙන්ඩර් පෝර්මයෙහි "සී" උපලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අයකිරීමට අදහස් කරන මිළ ගණන් සඳහන් කල යුතුයි. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම් කරන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් හෝ එවකට වෙළඳ පොළේ පවතින මිළ ගණන් හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිළක් පවතිනම් එම පාලන මිළ අනුව ගෙවීම් කරණු ලැබේ.

9. ටෙන්ඩරයෙහි සඳහන් මිළ ගණන් වලංගු කාලසීමාව.—ටෙන්ඩර් කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාලසීමාව ඉකුත් වන තුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කර නැත්නම් ටෙන්ඩර් පත්‍රයෙහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

10. තැන්පත් ඇප මුදල්.—තෝරා ගන්නා ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් ඇප මුදල තැන්පත් කිරී මෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කල යුතුයි.

11. බඩු බාහිරාදිය තබා ගැනීම.—තෝරාගත් ටෙන්ඩර් කරුවන්ගේ බඩු බාහිරාදිය ගබඩාකර තබාගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම තුල ඉඩ කඩ සලසා දෙනු නොලැබේ.

12. ටෙන්ඩර් පත්‍ර පිළිබඳ කොන්දේසි.—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇති. ටෙන්ඩර් කරුවෙකු වීමට බලා පොරොත්තු වන්නන් එහි අඩංගු කරුණු හොඳින් දැනගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතුද වන්නේය. ටෙන්ඩර් පත්‍රයේ තිබෙන ගිවිසුමේ කොන්දේසි ටෙන්ඩර් කරුවන් විසින් පිළිපැදිය යුතුය.

ඩී. ඒ. නාමෝතරම්,
සෞඛ්‍ය සේවා අධිකාරි, පුත්තලම්.

සෞඛ්‍ය සේවා අධිකාරි කාර්‍යාලයය,
පුත්තලම, 1965.11.2.

උපලේඛණය

| (1) ආයතනය | (2) ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල රු. | (3) ඇප මුදල රු. | (4) ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා වේලාව | (5) ආහාර ප්‍රමාණය දළ වශයෙන් — සේවකයින්ට | | | | — නොගෙවන රෝගීන්ට | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | මාළු | මස් | කරවල | එළවළු | මාළු | මස් | කරවල | එළවළු | කිරි ආහාර |
| කල්පිටිය ආරෝග්‍යශාලාව ... | 100... | 800 | | 500... | 500... | 500... | 2,000... | 1,000... | 1,000... | 1,000... | 4,200... | — |
| කොට්ටුකච්චිය ග්‍රාමීය ආරෝග්‍ය ශාලාව | 100... | 800 | 1965.11.30 | 250... | 250... | 250... | 1,000... | 650... | 600... | 650... | 2,500... | — |
| මහකුඹුක්කඩවල මාතෘ නිවාසය | 100... | 300 | දින පූ. භා. | 150... | — ... | 300... | 600... | 50... | — ... | 50... | 100... | — |
| මාම්පුරි මාතෘ නිවාසය ... | 100... | 300 | 10ට | 250... | 250... | 250... | 1,000... | 200... | 150... | 150... | 650... | — |
| නවගත්තේගම ග්‍රාමීය ආරෝග්‍ය ශාලාව | 100... | 600 | | 400... | — ... | 850... | 1,700... | 650... | — ... | 1,350... | 2,700... | — |
| මාදම්පේ මාතෘ නිවාසය ... | 100... | 300 | | 150... | 150... | 150... | 500... | 400... | 400... | 400... | 1,500... | — |

11-325—65.11.12 දින අංක 14,554 දරණ ගැසට් පත්‍රය

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

වශී 1965 දෙසැම්බර් මස 3 වෙනි දින පෙරවරු 10.30 වන තෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර නො. 58 සර් අර්නස්ට් ද , සිල්වා මාවත ,කොළඹ 3, අධ්‍යාපන අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ.

| පාසැලේ නම | | කළයුතු වැඩය |
|---|---|---|
| 1. කො/රාජකීය කණිෂ්ඨ පාසල | දෙමහල් තැනීම | ගොඩනැගිල්ලක් |
| 2. කො/හෝමාගම මහා විද්‍යාලය | දෙමහල් තැනීම | ගොඩනැගිල්ලක් |

සංලක්ෂ්‍යය.—කො/කොළඹ දිස්ත්‍රික්කය.

2. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකින් හෝ, කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන අධ්‍යක්ෂකගේ කාර්යාලයේ රු. 100 ක තැන්පත් මුදලක් සඳහා කුවිතාන්සියක් දකුණු කොළඹ අධ්‍යාපන නිලධාරි වෙත ඉදිරිපත් කිරීමේදී අධ්‍යාපන දෙපාතර්මේන්තුවේ රු. 1,10,000 ට හෝ ඊට වැඩි මුදලකට ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වූ අයට 1965 දෙසැම්බර් මස 2 දින පස්වරු 3.30 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. චෙක් පත් මුදල් ඕඩර්, තැපැල් ඕඩර් ආදිය භාරගනු නො ලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල් සඳහා මුදල් ගෙවීමේ කුවිතාන්සි කොළඹ 2, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අධ්‍යාපන අධ්‍යක්ෂක, පාසල් ගොඩනැගිලි අංශයෙන්, හෝ දකුණු කොළඹ අධ්‍යාපන නිලධාරි ග්‍රීන්පාත් කොළඹ 7 ගෙන් හෝ ලබා ගත යුතුය. ඉහත සඳහන් මුදල් ප්‍රමාණයන් සඳහා ලියා පදිංචි වූ බවට සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක් මුදල් ගෙවීමේ කුවිතාන්සි ලබාගත හැකි බව සිතට ගත යුතුය.

3. පූර්වෝක්ත 2 වැනි ඡේදයේ නියමිත වශයෙන් දැක්වෙන මුදල් ප්‍රමාණයන් සඳහා අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ ලියා පදිංචිවී තිබේ නම් මෙකී වැඩ සඳහා අනුමත කළ සමිතිවලට ද ටෙන්ඩර් පත් ඉදිරිපත් කළහැකි වේ. අනුමත කළ සමිතිවලට විශේෂ ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලබන බැවින් ඔවුන්ගේ ටෙන්ඩරය එකී ෆෝර්මයේ ලියා ඉල්ලුම් කළ යුතුය. ටෙන්ඩර් තැන්පත් මුදල් ගෙවීමෙන් අනුමත කරනු ලැබූ සමිති නිදහස් ය. යථෝක්ත 2 වෙනි ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයන් සඳහා ලියා පදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කිරීමෙන් පසු පමණක් ඒවාට විශේෂ ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ.

4. සියළුම විස්තර හා තොරතුරු ලබාගත හැකි වූද, ඔවුන්ගේ කාර්යාලයේදී සැලැස්ම බලාගත හැකි වූ ද දකුණු කොළඹ අධ්‍යාපන නිලධාරි ගෙන් පූර්වෝක්ත 2 හා 3 ඡේදයන්හි සඳහන් කර තිබෙන ටෙන්ඩර් පත්‍ර ලබාගෙන පිටපත් 2 කින් යුක්තව ලියාපදිංචි කළ තැපැලෙන් ඉදිරිපත් කළ යුතුය. තැපැල් මගින් එවනු ලබන ටෙන්ඩර් පත්‍ර කොළඹ 3 නො. 58 සර් අර්නස්ට් ද සිල්වා මාවතේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන වෙත ලියා පදිංචි කළ තැපැලෙන් එවිය යුතුය. ප්‍රාදේශිය ටෙන්ඩර් කරුවන් විසින් ලියාපදිංචි කළ තැපැලෙන් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට අකමැතිවන්නේ නම්, ටෙන්ඩර් කරුගේ සේවා විස්තර, නම, ලිපිනය කවරයේ දැක්වෙනසේ සීල් තැබූ ටෙන්ඩර් තමන් විසින් හෝ තමාගේ නියෝජිතයෙකු විසින් හෝ කොළඹ 3 නො. 58 සර් අර්නස්ට් ද සිල්වා මාවතේ අධ්‍යාපන අමාත්‍යාංශ කාර්‍යාලයේ කාර්යාල සහකාර තුමා වෙත පුද්ගලිකව ඉදිරිපත්කොට එතුමාගෙන් ටෙන්ඩරය භාරදුන් බවට ලියවිල්ලක් ලබාගත යුතුය.

5. 1965 දෙසැම්බර් මස 3 දින පෙරවරු 10.30 ට කොළඹ 3, සර් අර්නස්ට් ද සිල්වා මාවතේ අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමේදී ටෙන්ඩර් කරුවන්ට එහි පෙනී සිටීමට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලබන නිලධාරි තැන විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් සහ මිලගණන් ද පැමිණ සිටින ටෙන්ඩර් කරුවන් වෙත දැනුම් දෙනු ලැබේ.

6. ටෙන්ඩර් පත්‍ර අවසන් වන දින සිට සති 6 ක කාල පරිච්ඡේද යක් දක්වා තමන් ඉල්ලුම් කළ මිල ගණනට වැඩය භාර ගැනීමට ටෙන්ඩර්කරුවන් කැමති විය යුතුය.

7. තවදුරටත් අවශ්‍ය විස්තර, ටෙන්ඩර් ලියකියවිලි පරීක්ෂා කිරීම් පිණිස කොළඹ 7, ග්‍රීන්පාත්හි දකුණු කොළඹ, අධ්‍යාපන නිලධාරිගේ කාර්‍යාලයෙන් ලබාගත හැකි ය.

8. උළු සෙවිලි කළයුතු ගොඩනැගිලි වලට මෙරට උළු යෙදිය යුතුය. මෙම උළුවල තරාතිරම නියත වශයෙන් දැන ගැනීමට පරීක්ෂණ යක් අවශ්‍යය නම්, එය පැවැත් වීම සපයන්නාගේ වියදමෙන් විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ලංකා ආයතනය මගින් කරගත හැකි වේ.

ඊ. වී. අබයසේකර,
ස. අධ්‍යාපන අධ්‍යක්ෂ,
දකුණු කොළඹ.

අධ්‍යාපන කාර්යාලය, ග්‍රීන්පාත්,
1965 නොවැම්බර් මස 5 වන දින.

11-398—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

චීනයේ සිට කොටස් 162 යුත් දුම්රිය රථ තොගයක් ගෙන ඒම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර ප්‍රවාහණ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (ලිපිනය: 4 වෙනි මහල, සිලින්කෝ මන්දිරය, කොළඹ 1) 1965 දෙසැම්බර් මස 22 වැනි බදාදා පෙරවරු 11 වන තෙක් ආහාර දෙපාර්තමේන්තුවේ ලියා පදිංචිකර ඇති ලාංකික වාහන කුලී බ්‍රෝකර්වරුන්ගෙන් භාරගනු ලැබේ.

ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමට පෙර අවශ්‍ය වුවහොත්, ටෙන්ඩර්කරු විසින් ඉහත සඳහන් සේවාව භාර ගැනීමට සහ ගිවිසුම් කාර ඉටු කිරීමට තමාගේ මුදල් තත්ත්වය පිළිබඳ පුළුවන්කම ඔප්පු කිරීමට ඒ සම්බන්ධ ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය.

මරදානේ දුම්රිය ගබඩා අධිකාරිතැනගේ කාර්යාලයෙන් ලබාගත හැකි ෆෝර්ම කොළවල ටෙන්ඩරය ලියා, අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි.

ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රු. 100ක් මරදානේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරි තැනගේ කාර්යාලයෙහි හෝ කොළඹින් පිට නම්, ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට, 1965 දෙසැම්බර් මස 21 වැනි අඟහරුවාදා දහවල් 12 වනතෙක් ටෙන්ඩර් ෆෝර්ම කොළ නිකුත් කරනු ලැබේ.

1965 දෙසැම්බර් 23 වැනි බ්‍රහස්පතින්දා දින පෙරවරු 10ට ප්‍රවාහණ අමාත්‍යාංශ කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට පෙනී සිටීමට ඉඩදෙනු ලැබේ.

වැඩිපුර විස්තර දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන් ලබාගත හැක.

එම්. සරින්,
දුම්රිය සාමාන්‍යාධිකාරි වෙනුවට.

1965 නොවැම්බර් මස 5 වැනි දින,
තැ. පෙ. 1347, කොළඹ.

11-397—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

---

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු කාර්යාලිය "ටෙන්ඩර්" මණ්ඩලයේ සභාපති තැන විසින් ගාල්ලේ දුම්රිය ස්ථානාධිපතිට 3ඒ වර්ගයේ බංගලාවක් ඉදිකිරීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1965 දෙසැම්බර් මස 10 වැනි සිකුරාදා පස්වරු 2.30 දක්වා භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී ටෙන්ඩර් කරුවනට එයි පැමිණිය හැකිය.

2. කොළඹ මැක්ලම් පාරේ පිහිටි දුම්රිය දෙපාර්තමේන්තුවේ මාර්ග හා වැඩ පිළිබඳ අංශයේ ප්‍රධාන ඉංජිනේරු තැනගෙන් (තැ. පෙ. 370) මේ සඳහා ෆෝර්ම් කොළ ලබාගෙන සම්පූර්ණකොට, අනුපිටපතක්ද සමග එවිය යුතුයි. මේ සම්බන්ධයෙන් සියළු විස්තර මෙම නිලධාරි තැනගෙන් ලබා ගත හැකිය. සැලැස්මල්ද ඔහුගේ කාර්යාලයේදී බලාගැනීමට පුළුවන.

3. 1965 නොවැම්බර් 26 වැනි සිකුරාදා පස්වරු 4 දක්වා රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ වැඩ සඳහා රුපියල් 25,000 කට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ හෝ මෙම මුදලට වඩා වටිනාකම් ඇති කොන්ත්‍රාත් වැඩක් දුම්රිය දෙපාර්තමේන්තුවට සතුටුදායක අන්දමින් අවසන් කර ඇති කොන්ත්‍රාත්කරුවනට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැන වෙත (අ) තමාගේ ලියාපදිංචි කිරීම පිළිබඳ ලියකියවිලිද (ආ) ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදල වන රු. 25 සහ ටෙන්ඩර් ගාස්තු වශයෙන් රුපියල් 10 ක් ද තැන්පත්කර ලබාගත් රිසිට් පත්‍ර ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ෆෝර්ම ලබා ගත හැකිය.

මෙම මුදල් තැන්පත් කළ යුත්තේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරි තැනගේ කාර්යාලයේදීය.

එන්. ඒ. වෛත්‍යලිංගම්,
ප්‍රධාන ඉංජිනේරු තැන,
ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව.

1965 නොවැම්බර් මස 5 වැනි දින,
තැ. පෙ. 370, කොළඹ.

11-430—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

---

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

ප්‍රවාහණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 3බී වර්ගයේ බංගලා 2ක් ඉදිකිරීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1965 දෙසැම්බර් මස 7 වැනි අඟහරුවාදා පෙරවරු 11 දක්වා භාරගනු ලැබේ. එදිනට පස්වරු 2.30 ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවනට එහි පැමිණිය හැක.

2. කොළඹ මැක්ලම් පාරේ පිහිටි දුම්රිය දෙපාර්තමේන්තුවේ මාර්ග හා වැඩ අංශයේ ප්‍රධාන ඉංජිනේරු තැනගෙන් (තැ. පෙ. 370) මේ සඳහා ෆෝර්ම කොළ ලබාගෙන සම්පූර්ණකොට අනුපිටපතක්ද සමග එවිය යුතුයි. මේ සම්බන්ධයෙන් සියළු විස්තර මෙම නිලධාරි තැනගෙන් ලබාගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලාගැනීමට පුළුවන.

3. 1965 නොවැම්බර් මස 24 වැනි බදාදා පස්වරු 4 දක්වා රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ වැඩ සඳහා රුපියල් 50,000 කට නොඅඩු ගණනකට ලියාපදිංචිවූ හෝ මෙම මුදලට වඩා වටිනාකම් ඇති කොන්ත්‍රාත් වැඩක් දුම්රිය දෙපාර්තමේන්තුවට සතුටුදායක අන්දමින් අවසන් කර ඇති කොන්ත්‍රාත්කරුවනට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැන වෙත (අ) තමාගේ ලියාපදිංචි කිරීම පිළිබඳ ලියකියවිලිද (ආ) ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදල වන රු. 100 සහ ටෙන්ඩර් ගාස්තු වශයෙන් රුපියල් 10ක්ද තැන්පත් කර ලබාගත් රිසිට්පත්‍ර ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ෆෝර්ම ලබාගත හැකිය.

මෙම මුදල් තැන්පත් කළ යුත්තේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරි තැනගේ කාර්යාලයේදීය.

එන්. ඒ. වෛත්‍යලිංගම්,
ප්‍රධාන ඉංජිනේරු තැන.
ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව.

1965 නොවැම්බර් මස 5 වැනි දින,
තැ. පෙ. අංක 370, කොළඹ.

11-449—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

---

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් කොළඹ ආයතනයන්ට 1966.1.1 සිට 1966.6.30 දින දක්වා එළුමස් සැපයීම සඳහා ටෙන්ඩර් ඉල්ලුම් පත් කොළඹ 2, යුනියන් පෙදෙසේ පිහිටි කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1965 දෙසැම්බර් මස 3 වැනි දින අ. භා. 2.30 වනතුරු භාර ගනු ලැබේ. කොළඹ 1, චැතැම් වීදියේ, අංක 62 දරණ අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකට රු. 100 ක් බැඳ ලබ ගන්නා කුවිතාන්සිය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ විට 1965.12.3 දින දවල් 12 දක්වා ටෙන්ඩර් ෆෝර්ම ලබා ගත හැක. ටෙන්ඩර් ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි.

වැඩි විස්තර අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයෙන් දැන ගැනීමට පුළුවන.

පී. ජී. ජී. ධර්මසිරි,
අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1965 නොවැම්බර් මස 2 දින,
කොළඹ 1,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේදීය.

11-316—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් කොළඹ ආයතනයන්ට 1966.1.1 සිට 1966.6.30 දින දක්වා දර සහ පොල්කටු සැපයීම සඳහා ටෙන්ඩර් ඉල්ලුම් පත් කොළඹ 2, යුනියන් පෙදෙසේ පිහිටි කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1965 දෙසැම්බර් මස 3 වැනි දින අ. භා. 2.30 වනතුරු භාර ගනු ලැබේ. කොළඹ 1, වැතැම් වීදියේ, අංක 62 දරණ අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකට රු. 200ක් බැඳ ලබ ගන්නා කුවිතාන්සිය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ විට 1965.12.3 දින දවල් 12 දක්වා ටෙන්ඩර් පෝරම ලබා ගත හැක. ටෙන්ඩර් ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි.

වැඩි විස්තර අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයෙන් දැන ගැනීමට පුළුවන.

එස්. නඩරාජා,
අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1965 නොවැම්බර් මස 2 දින,
කොළඹ 1,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේදීය.

11–317—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

---

## ලංකා රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථාව

### මහර සිට වැඩපොළවලට, ගල් ප්‍රවාහණය කිරීම

පහත දැක්වෙන අන්දමට, රාගම, මහර පිහිටි ලංකා රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථාවේ ගල්වලෙන්, සක්කගල්, කලුගල් (2"—½") හා ගල්කුඩු, ප්‍රවාහණ කිරීම සඳහා මෙම කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල මිළ ගණන් කැඳවනු ලැබේ.

(අ) පහත සඳහන් වැඩ පොලවල් එකිනෙකට ගෙනගොස් බාරදීම සඳහා කියුබ් බැගින් ගාස්තු ප්‍රමාණය :—

1. කාර්මික වතුජනපද හා පෙරනිමි වැඩපොළවල්, ඒකල-ජාඇල.
2. ටයර් වැඩපොල, තුන්ගමුගොඩ, කැළණිය.
3. පිටි නිෂ්පාදන වැඩපොල, මෝදර, කොළඹ.
4. ජාතික නිවාස, කම්කරු මහා ලේකම් කාර්‍යාලය හා පෙරනිමි වැඩපොලවල්වල, නාරාහේන්පිට, කොළඹ.
5. වානේ වැඩපොල, ඔරුවල, අතුරුගිරිය.

(ආ) නියෝග කරන පරිදි, අන් වැඩපොලකට ප්‍රවාහනය සඳහා සැතපුමකට කියුබ් බැගින් ගාස්තු ප්‍රමාණය.

ප්‍රවාහනය බාර ගැනීමට හැකියාවක් තිබීම ගැන සංස්ථාවට ඒත්තු යන පිළිවෙලට බලාපොරොත්තුවෙන් සිටින ප්‍රවාහන කොන්ත්‍රාත්කරුවන්, කරුණු ඉදිරිපත් කළ යුතුය. ඔවුන් ලඟ තිබෙන භාණ්ඩ ගෙනයාමේ රථවාහන පිළිබඳව සාක්ෂිද ඉදිරිපත් කළ යුතුය. දිනකට කියුබ් 30 දක්වා, ද්‍රව්‍ය ගෙනගොස් බාරදීමට, කොන්ත්‍රාත්කරුවන්ට නියම කරන්නට පුළුවන. මිළ ගණන් පත්‍රවල සෙසු කොන්දේසි පළවනු ඇත.

1965.11.20 වැනි දින දහවල් 12 දක්වා හෝ ඊට පෙර ලේකම් වෙත මිළ ගණන් ඉදිරිපත් කළ යුතුය. සවකීය ලිපිනය සඳහන් වන මුද්දරයක් ඇලවූ කවරයක් බහා, තැපැලෙන් එවීමෙන් හෝ ලියත ලද අයදුම් පතක් පෞද්ගලිකව, විමසීම් කවුන්ටරයට බාරදීමෙන් හෝ මිළ ගණන් ආකෘති පත්‍ර හා වෙනත් අදාල කරුණු ලබාගත හැක.

මිළ ගණන් සඳහන් කර එවනු ලබන කවරයේ උඩ වම් කෙළවරේ "ගල් ප්‍රවාහනය සඳහා මිළ ගණන්" යනුවෙන් සඳහන් කළ යුතුය.

ලේකම්,
ලංකා රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථාව.

තැ. පෙ. 194,
48, ශ්‍රී ජිනරතන පාර,
කොළඹ 2,
1965 නොවැම්බර් මස 4 වනදා.

11–409—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

---

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

### යාපනයේ නගර සභා සීමාව තුළ කුරුනගර්හි කම්කරු නිවාස 48ක් ඉදිකිරීම

යාපනයේ, කුරුනගර්හි කම්කරු නිවාස 48ක් ඉදිකිරීම සඳහා ජාතික නිවාස දෙපාර්තමේන්තුවේ, ටෙන්ඩර් මණ්ඩලයේ, සභාපති විසින් 1965 නොවැම්බර් මස 26 වෙනි සිකුරාදා පෙරවරු 10.00 වන තුරු ටෙන්ඩර් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර එදින එකී වේලාවට විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටිය හැක.

පිටපත් දෙකකින් යුත් ටෙන්ඩර් පත්‍ර මෙම දෙපාර්තමේන්තුවේ අධිකාරි ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකිවාක් මෙන්ම වැඩි විස්තරද ඔහුගෙන් ලබාගත හැක.

ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ/වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ/රජයේ දෙපාර්තමේන්තුවල/රජයේ සංයුක්ත මණ්ඩලයන්හි වැඩ සඳහා රුපියල් 2,00,000 කට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචි කරන ලද කොන්ත්‍රාත්කරුවෝ පමණක් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට සුදුස්සෝවෙති. එම ලියාපදිංචි කරන ලද සහතිකය සහ මෙම දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත රුපියල් 200 ක තැන්පත් මුදලක් තැබූ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කරන කොන්ත්‍රාත්කරුවන්ට 1965 නොවැම්බර් මස 23 වෙනි දින දවල් 12.00 වන තුරු ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

ඊ. අයි. මුණසිංහ,
ජාතික නිවාස කොමසාරිස් තැන වෙනුවට.

ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
තැ. පෙ. අංක 544,
කොළඹ 2, 1965 ඔක්තෝම්බර් මස 27 වෙනි දින.

11–365—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

ඇඹිල්මීගම-දිවුලාගල-පේරාදෙණිය පාරේ 4 වැනි සහ 5 වැනි සැතපුම්වලට අඟල් 4, 2 සහ 3/4 ප්‍රමාණයේ ගල් සැපැයීම සඳහා වූ ගැනුම්පත්, මහනුවර, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ, මධ්‍ය කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු කාර්යාලයෙහි වූ ගැනුම්පත් මණ්ඩලයේ සභාපති විසින් වර්‍ෂ 1965 ක් වූ දෙසැම්බර මස 1 වැනි බදාදා, පෙරවරු 10.30 වන තෙක් බාරගනු ලැබේ. එදිනම පෙරවරු 10.30 ට එම කාර්යාලයේදී ගැනුම්පත් විවෘත කරන විට ඉල්ලුම්කරුවනට පෙනී සිටිය හැකි ය.

2. මහනුවර, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ, විධායක ඉංජිනේරු කාර්යාලයෙහි දී ගැනුම්පත් ලියවිලි පරීක්‍ෂා කළ හැකි ය. රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත පිහිටි ඕනෑම කච්චේරියක හෝ රුපියල් 25ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන්, මහනුවර විධායක ඉංජිනේරු ගෙන් මෙ සඳහා ඉල්ලුම්පත් ලබාගත හැකිය. මෙම තැන්පත් මුදල ආපසු ගෙවීම ගැනුම්පත් කොන්දේසි අනුව කරනු ඇත. 1965 නොවැම්බර මස 19 වැනි සිකුරාදා දහවල් 12 වන තෙක් මහනුවර විධායක ඉංජිනේරු විසින් මෙ සඳහා ඉල්ලුම්පත් නිකුත් කරනු ලැබේ.

3. මෙහි පහත සඳහන් ආයතනවලින් ඉහත දක්වන ලද තැන්පත් මුදල අනවශ්‍ය ය :—

(අ) සමුපකාර තොග වෙළෙඳ ආයතනය.
(ආ) වෙනත් ආණ්ඩුවල රාජ්‍ය වෙළෙඳ සංවිධාන : නිදර්ශන—චීන ජාතික යන්ත්‍රෝපකරණ ආනයන සංස්ථාව.
(ඉ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්‍ෂ විසින් අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති.
(උ) සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් විසින් ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති.

ජේ්‍රවී ජෝ. පෙරේරා,
මධ්‍ය කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු.

1965 නොවැම්බර මස 5 දින,
මහනුවර, ර. වැ. දෙ. කාර්යාලයයේ දී ය.

11–439—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

බොරලු, පස් හෝ වෙනත් අනුමත කරනු ලැබූ පිරවීම් ද්‍රව්‍යයක් සපයා පාරේ මට්ටමට පිරවීම සඳහා ද, වැලි සහ අඟල් 4, 2, හා ¾ යන ප්‍රමාණයන්ගි කලුගල් සැපයීම සඳහාද මිලගණන් පත් කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරයේ පිහිටි රජයේ වැඩ, තැපැල් හා විදුලි සංදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් වර්ෂ 1965 නොවැම්බර් මස 24 වැනි බුද දින උදේ 11 වන තෙක් බාරගනු ලැබේ.

මැඩය පිහිටා තිබෙනුයේ වෙරිංටන් චතුරශ්‍රයේ සහ ඒ අවට ප්‍රදේශයේ ය.

මේ සඳහා ටෙන්ඩර් යිරීමට කැමති අය කොළඹ 7 වෙරිංටන් චතුරශ්‍රයේ ර. වැ. දෙ. ප්‍රධාන නිර්මාණ ඉංජිනේරු තැන ගෙන් ඉල්ලුම් කළ යුතු ය.

වී. සී. ද සිල්වා,
රජයේ වැඩ අධ්‍යක්ෂයා.

රජයේ වැඩ දෙපාර්තමේන්තුව,
කොළඹ. 1—1965.11.5.

11-395—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ ලිපිකාර තැනගේ කාර්යාලයට වෙනස් කිරීම් සහ එකතු කිරීම් සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හි පිහිටි රජයේ වැඩ, තැපැල් හා විදුලි සන්දේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1965 දෙසැම්බර් මස 15 වෙනි බදාදා පෙරවරු 11 වන තෙක් භාරගනු ලැබේ.

2. කොළඹ 7, වෙරිංටන් චතුරශ්‍රයේ ර. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන නිර්මාණ ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලාගැනීමට පුළුවන.

3. වර්ෂ 1965 නොවැම්බර් මස 26 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ර. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 1,50,000 ට නො අඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 200 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ර. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
රජයේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

කොළඹ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය, 1965.11.6.

11-438—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

රත්මලානේ පාලම් පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු තැන ගේ අංගනයට අඟල් ¾ ගල් කියුබ් 400 ක් සහ හොඳ ගංගා වැලි කියුබ් 200 ක් සැපයීමට සහ ගෙනැවිත් බාර දීමට ටෙන්ඩර් පත් රජයේ වැඩ හා විදුලි සංදේශ තැපැල් අමාත්‍යාංශයෙහි ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1965 දෙසැම්බර් මස 8 වැනි බදාදා පෙරවරු 11 වන තෙක් බාර ගනු ලැබේ. එදිනම පස්වරු 2.30 ටැන්ඩර් මණ්ඩල කාර්යාලයේදී ටැන්ඩර් විවෘත කරන විට ටැන්ඩර් කරුවන්ට පෙනී සිටිය හැක.

2. රත්මලානේ පාලම් පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු තැන ගේ කාර්යාලයෙහි දී ටෙන්ඩර් ලියකියවිලි පරීක්ෂා කළ හැක. රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක, ටැන්ඩර් තැන්පත් මුදල වශයෙන් රු. 100 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කර පාලම් පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු තැන ගෙන් ඉල්ලුම් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් ලබාගත හැක. තැන්පත් කළ මුදල ආපසු ගෙවීම ටෙන්ඩර් කොන්දේසි අනුව කරනු ලැබේ.

මෙහි පහත සඳහන් ආයතන වලින් ටෙන්ඩර් තැන්පත් මුදල් අනවශ්‍යය.

(අ) සමූපකාර තොග වෙළඳ ආයතනය,

(ආ) වෙන ආණ්ඩුවල රාජ්‍ය වෙළඳ සංවිධාන, නිදර්ශන—චීන ජාතික යන්ත්‍රෝපකරණ ආනයන සංස්ථාව,

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ විසින් අනුමත කරණ ලද ග්‍රාම සංවර්ධන සමිති, සහ

(ඈ) සමූපකාර සමිති රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කළ සමූපකාර සමිති.

3. මෙහි ඉහත සඳහන් පරිදි ලබාගත හැකි ආකෘති පත් වල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. 1965 නොවැම්බර් මස 26 සිකුරාදා දවල් 12 වන තෙක් ටෙන්ඩර් ලියකියවිලි නිකුත් කරනු ලැබේ.

4. ටැන්ඩර් ඉදිරිපත් කිරීම ලාංකිකයන්ටද, ලාංකික වෙළඳ සමාගම් හා අනිකුත් ලාංකික සමාගම් වලට පමණක් සීමාකොට තිබේ.

එස්. සෙල්ලදුරෙයි,
රජයේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

රජයේ වැඩ දෙපාර්තමේන්තුව,
1965, නොවැම්බර් 6 දින,
කොළඹ 1.

11-455—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

# තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### 1965 ඔක්තෝබර් මාසයේ ටෙන්ඩර් පිළිබඳ තීරණ

| සේවය | ටෙන්ඩර් ගණන | සාර්ථකවූ ටෙන්ඩර් කරවන්නන් ගණන | පිළිගත් ගාස්තු | |
|---|---|---|---|---|
| 1. තමන්කඩුවෙ සත්ව ව්‍යාපාරයෙහි ගව මඩුව් තැනීම | 2 | ... ප්‍රතික්ෂෙප කරන ලදී | | |
| | | | ලොරි අංකය | රුපියල් |
| 2. සේවයට අයෝග්‍ය රථවාහන මිළදී ගැනීම සඳහා ටෙන්ඩර් | 21 | ... (අ) ඇස්. දේවදාසන් මහතා, 276/2ඒ, ස්කිනර් පාර (දකුණ), කොළඹ 10 | සී. ඇන්. 1415 | ... 59 |
| | | | (ජිජ්) ඊ. වයි. 4904 | ... 589 |
| | | | අයි. සී. 1997 | ...1,369 |
| | | | අයි. සී. 3592 | ...1,269 |
| | | | සී. ඇන්. 1452 | ...3,889 |
| | | | අයි. සී. 1154 | ...2,599 |
| | | | ලොරි අංකය | රුපියල් |
| | | (ආ) ඇක්ස්. සයිමන් මහතා, 290/3බී, ස්කිනර් පාර (දකුණ), කොළඹ 10 | අයි. සී. 1382 | ... 69 |
| | | | සී. වයි. 1175 | ... 89 |
| | | | අයි. සී. 3778 | ...1,269 |
| | | | අයි. සී. 1123 | ...2,669 |
| | | | අයි. සී. 1104 | ...2,299 |
| | | | අයි. සී. 1839 | ... 599 |

| සේවය | ටෙන්ඩර් ගණන | සාර්ථකවූ ටෙන්ඩර් කරවන්නන් ගණන | ලොරි අංකය | පිළිගත් ගාස්තු රුපියල් |
|---|---|---|---|---|
| | | (ඇ) ආර්. ඇස්. සිරිවර්ධන මහතා, 238/20 සංචිකාපත්ත පාර, කොළඹ ... | අයි. සී. 3575 | 100 |
| | | (ඈ) අයි. සාවියර් මහතා, 276/3, ස්කිනර් පාර (දකුණ), කොළඹ ... | අයි. සී. 1112 | ... 2,250 |
| | | | අයි. සී. 1131 | ... 1,550 |
| | | | අයි. සී. 1099 | ... 3,350 |
| | | (ඉ) ජයජෝති හාර්ඩ්වෙයාර් ස්ටෝර්ස්, 290/6, ස්කිනර් පාර (දකුණ), කොළඹ | අයි. සී. 1670 | ... 989 |
| | | (ඊ) අයි. සන්දානිස්වෙයි මහතා, 251/15 15, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10 | සී. ඇල්. 9843 | ... 55 |
| | | | අයි. සී. 1088 | ... 1,800 |
| | | | අයි. සී. 1987 | ... 1,300 |
| | | (උ) ඩී. යුසෙයිනාදන් මහතා, 276/1, ස්කිනර් පාර (දකුණ), කොළඹ ... | අයි. සී. 1995 | ... 1,905 |
| | | | අයි. සී. 1942 | ... 1,150 |

11-456—65.11.12 දින අංක 14,554 දරණ ගැසට් පත්‍රය

---

## බඩු භාණ්ඩාදිය විකිණීම

### වෙන්දේසියේ විකිණීමයි

පහත සඳහන් ප්‍රයෝජනයට ගත නොහැකි ද්‍රව්‍ය 1965 නොවැම්බර් මස 30 වැනි දින පෙරවරු 9.30 ට කොළඹ, ඩාසන්ස් පාරේ, රජයේ ගබඩා දෙපාර්තමේන්තුවේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ:—

ටින් තහඩු, වලයම් පටි, යකඩ කම්බි කැලි, මෝටර් කොට්ස් ටයර් 13ක්, ටියුබ් 2ක් බැටරි 6ක්, පරණ බයිසිකල් බඩු ආදිය.

මේවා බලාගැනීමට 65.11.29 වැනි දින පෙරවරු 9.30 සිට පස්වරු 3 දක්වා ඉඩ කඩ තිබේ.

ලබාගන්නා සෑම ද්‍රව්‍යයකටම මුදල් ගෙවා වෙන්දේසිය නිමවූ විගසම ඉවත් කළ යුතුයි.

ඇස්. ඒ. පී. රූපසිංහ,
ගබඩා අධිකාරි.

1965 නොවැම්බර් මස 5 දින,
රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේදීය.

11-429—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

---

### කුරුණෑගල රෝහලේදී මියගිය රෝගීන්ට අයිතිව තිබූ බඩුබාහිරාදිය

කුරුණෑගල රෝහලේ දී මියගිය රෝගීන්ට අයත්ව තිබූ බඩු බාහිරාදිය පිළිබඳව හිමිකම් කියන අයවලුන් විසින් මෙම දැන්වීම පළවූ දින සිට සති 3ක් ඇතුළත දී කුරුණෑගල රෝහලේ වෛද්‍ය අධිකාරි තැනගෙන් ඒවා ලබා ගැනීම පිණිස ඉල්ලුම් කළ යුතුයි. සති 3ක් ඇතුළත දී මෙකී බඩු බාහිරාදිය උදෙසා අයිතිවාසිකම් ඉදිරිපත් කිරීමට කිසිවකු ඉදිරිපත් නො වුවහොත් එම කාල සීමාවෙන් පසු ඒවා වෙන්දේසි කරනු ලැබේ. එම වෙන්දේසියෙන් ලැබෙන මුදල ආදායමට බැර කරන බව මෙයින් දන්වා සිටිමි.

විස්තර මෙසේයි—

| | නම | පදිංචිය | ඇතුල්වූ දිනය | මළ දිනය | බඩුවල විස්තර |
|---|---|---|---|---|---|
| 1. | ෂෙරිෆා උම්මා | ... පුත්තලම | ... 56. 6.23 | ... 56. 6.24 | ... අරුංගල් 6 යි, මුදු 2 යි, සුර 2 යි, කොණ්ඩ කූරු 1 යි, ප්ලාස්ටික් වළලු 5 යි |
| 2. | බෙබිනෝනා ... | ... නොදනී | ... 56.7.18 | ... 56.7.18 | ... ලෝහ 2 යි, අරංගල් 2 යි, කොන්ඩකූරු 1 යි, හවරි 1 යි |
| 3. | පොන්නම්මා ... | ... කුරුණෑගල | ... 56.11. 7 | ... 56.11.22 | ... ලෝහ 2 යි |
| 4. | ඇලිස් නෝනා | ... දියතුරේ | ... 57. 5.12 | ... 57. 5.13 | ... අරුංගල් 2 යි, මුදු 1 යි |
| 5. | විරසිංහ ... | ... කුරුණෑගල | ... 57. 6.24 | ... 57. 6.27 | ... කණ්නාඩි කුට්ටම 1 යි |
| 6. | ආර්. ඩී. එලිසා | ... ගොඩිගමුව | ... 57. 6.22 | ... 57. 6.24 | ... අරුංගල් 2 යි |
| 7. | ගරු සරණංකර ස්ථවිර | ... නොදනී | ... 57.11. 5 | ... 57.11. 5 | ... කුඩ 1 යි |
| 8. | ෂම්සුඩීන් ... | ... බඩල්කුඹුර | ... 60. 6.29 | ... 60. 6.29 | ... මුදලින් රු. 1.74 යි |
| 9. | පොඩ්ඩි ... | ... නොදනී | ... 60. 3. 8 | ... 60. 3. 8 | ... ලෝහ 3 යි, අරුංගල් 2 යි, මුදු 1 යි, ප්ලාස්ටික් වළලු 9 යි |
| 10. | බණ්ඩියා ... | ... මැදගම | ... 60. 8. 7 | ... 60. 9. 8 | ... මුදලින් රු. 3.25 යි |
| 11. | කුමරප්පු ... | ... වැල්ලව | ... 60.11. 4 | ... 60.11. 5 | ... මුදලින් රු. 6.50 යි |
| 12. | ලෙව්වමන් ... | ... වහවැව | ... 60.11. 8 | ... 60.11.14 | ... මුදු 2 යි, මුදලින් රු. 12 යි |
| 13. | කේ. අමරසිංහ ... | ... නොදනී | ... 61. 2.15 | ... 61. 2.15 | ... අරුංගල් 2 යි |
| 14. | රන්මැණිකා ... | ... වාරියපොල | ... 61. 7. 8 | ... 61. 7. 8 | ... ලෝහ 2 යි, අරුංගල් 2 යි, මාලපෙති 1 යි |
| 15. | පුංචි නයිදෙ ... | ... නොදනී | ... 62. 1.24 | ... 62. 2. 3 | ... මුදලින් රු. 39 යි |
| 16. | එච්. ඇම්. පියදස | ... පල්ලෙවෙල | ... 62. 4.17 | ... 62. 4.20 | ... මුදු1 යි, මුදලින් රු. 3.16 යි |
| 17. | පුංචිරිදී ... | ... අඹන්පොල | ... 62. 5. 5 | ... 62. 5 .5 | ... අරුංගල් 2 යි |

එච්. ඒ. ජේසුදසන්,
වෛද්‍ය අධිකාරි.

1965 ඔක්තෝබර් මස 21 වන ද,
කුරුණෑගල රජයේ මහ රෝහලේ දී ය.

11-323—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

## මහ රෝහල—කොළඹ

### ප්‍රසිඞ වෙන්දේසියක්

මෙතෙක් හිමිකම් නො දක්වන ලද රෝගීන් ගේ දේපොල යටතේ ගැනෙන පහත දක්වෙන භාණ්ඩ 1965 දෙසැම්බර් මස 3 වෙනි සිකුරාද පස්වරු 1.00 සිට කොළඹ මහරෝහලේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

2. ජයග්‍රාහක ලන්සුකරු විසින් වෙන්දේසිය අවසානයේදීම මුලු මුදලම ගෙවා රෝගීන්ගේ දේපොල ඉවතට ගෙන යා යුතුයි.

3. මෙම වෙන්දේසිය අවලංගු කිරීමට හෝ කල් දැමීමට හෝ ඕනෑම ලන්සුවක් ප්‍රතික්ෂෙප කිරීමට සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක තැනට බලය ඇත.

4. දේපල වලට හෝ මුදල්වලට හිමි කම් කියන්නවුන් ඇත්නම් මෙම ගැසට් නිවේදනය නිකුත්වී දින හත (7) ක් ඇතුළත හිමිකම් ඉදිරිපත් කළ යුතුයි. නැතහොත් හිමිකම් නොකියන මුදල් ආදායමට බැර කරන අතර හිමිකම් නොකියන දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

5. වැඩි විස්තර කොළඹ මහරෝහලේ වෛද්‍ය අධිකාරි තැනගෙන් දන ගැනීමට පුළුවන.

ඩී. ඒ. ජයසිංහ,
අධිකාරි, කොළඹ රෝහල් මංඩලය.

### රෝගීන් සතු මෙතෙක් ඉල්ලුම් කර නොමැති ද්‍රව්‍ය ලැයිස්තුව

| රෝගියාගේ නම | ඇතුලුවූ දිනය | දේපල අංකය | මුදල් රු. ශ. | ඉල්ලුම් කර නොමැති දේපල |
|---|---|---|---|---|
| නම නොදනී | 2. 1.57 | 632 | 5 38 | — |
| ජී. ඇම්. ප්‍රනාන්දු | 30.12.56 | 633 | 15 60 | — |
| ජුවානිස් අල්විස් | 6. 1.57 | 636 | 6 04 | පිහිය එකයි. සූර එකයි. |
| ඩේවිඩ් පෙරේරා | 6. 1.57 | 640 | 2 0 | — |
| ආනම්මා සොයිසා | 17. 7.56 | 647 | 23 40 | — |
| සී. සොයිදා පෙරේරා | 7. 2.57 | 651 | — | අරුන්ගල් කුට්ටම් එකයි. |
| නම නොදනී | 18. 2.57 | 654 | 3 0 | — |
| ජෝන් සිංඤෝ | 13. 2.57 | 658 | 2 0 | — |
| ඇම්. ලූසියන් පෙරේරා | 17. 2.57 | 663 | — | සූර එකයි. |
| ඩබලිව්. ඒ. ප්‍රේමදාස | 13. 3.57 | 668 | 30 0 | — |
| ජේ. පී. සර්නේලිස් සිංඤෝ | 27. 3.57 | 670 | 5 52 | — |
| කොර්නේලිස් අප්පු ඩයස් | 26. 3.57 | 671 | 361 0 | — |
| අයි. ඩී. ජයසිංහ | 6. 3.57 | 672 | — | සූර එකයි. |
| ඒ. ඒ. සියදෝරිස් | 8.11.56 | 675 | 5 22 | — |
| ඩී. කේ. ඩී. බන්දුසේන | 6. 5.57 | 682 | 80 | — |
| එච්. ඩී. ජිනදාස | 28. 5.57 | 683 | — | රත්රන් පාට මුදු එකයි. |
| පී. චාර්ලිස් අප්පුහාමි | 10. 4.57 | 684 | — | සූර එකයි. |
| මුත්තුසාමි | 6. 5.57 | 685 | 16 10 | — |
| සපාර් බක්මන් | 27. 3.57 | 697 | — | රත්රන් පාට මුදු එකයි. |
| ඇම්. සිල්වා | 5.12.57 | 698 | — | මුදු එකයි. කූරු එකයි. කූරුස |
| ඊ. පී. මේරි | 19.12.57 | 699 | — | අරුන්ගල් එකයි |
| බී රොසලින් පෙරේරා | 15. 4.57 | 700 | — | මුදු 3 යි. |
| තෝනා බිඩෙල් | 6. 2.56 | 701 | — | සූර 1 යි. අරුන්ගල් කුට්ටම |
| පී. පොඩිහාමි | 9. 8.56 | 702 | — | මුදු එකයි. |
| පී. ඩබලිව්. සිලවතී නෝනා | 30. 1.57 | 703 | — | සූර එකයි. |
| පී. ඩී. ඇන්. පියවතී | 20. 3.57 | 704 | — | මුදු දෙකයි. |
| ජී. පී. සෝමා | 28. 2.57 | 705 | — | කරාබු කුට්ටම් එකයි. |
| ඒ. බී. ප්‍රනාන්දු | 6. 4.56 | 706 | — | අරුන්ගල් කුට්ටම් එකයි. |
| පී. පී. ඇලිස් නෝනා | 16. 7.55 | 707 | — | සුදු මුදු දෙකයි. |
| පොඩි හාමි | 23. 3.56 | 708 | — | මුදු එකයි. |
| පොඩි හාමි | 23. 4.56 | 709 | 77 | — |
| ඒ. පොඩි සිංඤෝ | 12. 6.57 | 716 | 31 00 | — |
| ඊ. සුමනදාස | 21. 6.57 | 722 | 1 05 | — |
| කැතරින් | 1. 6.57 | 728 | — | සුදු මුදු දෙකයි. |
| ඔ. ඇස්. රෙයිටල් | 2. 3.57 | 729 | — | අරුන්ගල් කුට්ටම් එකයි. |
| ඇම්. මැගී | 23. 2.57 | 730 | — | අරුන්ගල් කුට්ටම් එකයි. |
| සුමනරාජ ස්ට්‍රිවිර | 17. 7.57 | 742 | 12 42 | — |
| චාර්ලිස් ප්‍රනාන්දු | 26. 7.57 | 749 | 3 65 | රිදී කාසි 14 යි. |
| අයේස්වරී | 18. 7.57 | 753 | 1 34 | පිත්තල මුදු දෙකයි. |
| ෂන්මුගම් | 12. 8.57 | 758 | 53 | — |
| කේ. සර්නේලිස් | 13. 8.57 | 761 | 1 33 | — |
| පී. ඇල්. පොඩිඅප්පුහාමි | 25. 7.57 | 766 | 15 0 | — |
| කේ. සයිමන් සිල්වා | 17. 7.57 | 772 | 11 98 | පොකැට්වු එකයි. උල්පත් පෑන් 1 යි. |
| රෙජිනා පීරිස් | 20. 7.57 | 776 | — | සූර 1 යි. අරුන්ගල් කුට්ටම් 1 යි. |
| එච්. ඇම්. ලීලාවතී | 27. 7.57 | 777 | — | වලලු කුට්ටම් 1, කරාබු කුට්ටම් 1 |
| ඇන්. කේ. රන්සොහාමි | 2. 8.57 | 778 | — | වලලු කුට්ටම් 1 යි. |
| සිට්ටි පරිඩා | 26. 6.57 | 779 | — | අරුන්ගල් කුට්ටම් 1 යි. |
| කේ. රාමසාමි | 15. 9.57 | 781 | 10 16 | — |
| කේ. ඩී. එන්ගොහාමි | 6.10.57 | 797 | 10 66 | — |
| මුත්තුලින්ගර් | 12.10.57 | 800 | 10 85 | — |
| වී. ටිකිරිබණ්ඩා | 7.11.57 | 806 | 30 0 | — |
| පොඩි හාමිනේ | 11.11.57 | 808 | 22 90 | — |
| එලියතම්බි | 12.11.57 | 812 | 7 0 | — |
| ඩබලිව්. සිබට | 24.11.57 | 819 | 13 20 | — |
| ගුරුසාමි | 1.12.57 | 824 | — | මුදු එකයි. |
| පී. ජෝසප් | 26.12.57 | 831 | 7 0 | — |
| ඇම්. එච්. පී. ප්‍රනාන්දු | 23.12.57 | 832 | 20 0 | — |
| රාජපක්ෂ | 31. 1.58 | 14 | 3 75 | — |

| රෝගියාගේ නම | ඇතුළුවූ දිනය | දේපල අංකය | මුදල් රු. ශ. | ඉල්ලුම්කර නොමැති දේපොල |
|---|---|---|---|---|
| ජෝර්ජ් රාජපක්ෂ | 12. 2.58 | 19 | — | ගිස් පොකැට්ටුවක්, රියදුරු බලපත්‍රයක්, පැවුල් කුපන් පොතක්, රක්පණ කාඩ් පතක්. |
| කේ. පී. පොඩි අප්පුහාමි | 3. 3.58 | 30 | 3 05 | — |
| ඩබ්ලිව්. චාර්ලිස් සිංඤෝ | 2. 3.58 | 31 | 25 73 | — |
| ජී. නාරායන් | 3. 3.58 | 33 | 8 0 | — |
| ඇල්. පී. ජයසූරිය | 8. 3.58 | 36 | 7 60 | — |
| ගේබ්‍රියෙල් | 4. 4.58 | 39 | 12 0 | — |
| ඩී. ජේ. වික්‍රමසිංහ | 5. 4.58 | 46 | 17 73 | — |
| ඇර්. සුප්පයියා | 20. 5.58 | 61 | 23 0 | — |
| ක්‍රිස්තියානා | 29. 6.58 | 71 | 11 07 | — |
| ඒ. අදුමෙ | 4. 7.58 | 72 | 1 33 | — |
| ආර්. ඒ. රන්මැණිකා | 30. 7.58 | 91 | — | වලලු දෙකයි, අරුන්ගල් දෙකයි. |
| එලියා ඩයස් | 20. 9.58 | 99 | 3 29 | — |
| වික්ටර් පෙරේරා | 30.10.58 | 103 | 5 0 | — |
| ඇල් තෝමස් | 10.11.58 | 107 | 5 0 | — |
| ජී. ඇර්. ජේම්ස් | 15.11.58 | 109 | 12 72 | — |
| ඇස්. එක්. සෙල්ලදොරේ | 29.11.58 | 113 | 2 0 | — |
| ඇන්. ජේම්ස් අප්පු | 13.10.58 | 126 | 7 19 | — |
| හෙන්ද්‍රික් අප්පු | 20. 2.59 | 134 | 20 0 | — |
| ඇර්. ඉබ්‍රාහිම් | 29. 5.59 | 145 | 12 59 | — |
| පී. සුප්පයියා | 10. 8.59 | 154 | 21 62 | — |
| ටී. ඇර්. මුතාලිප් | 18. 9.59 | 158 | — | කන්නාඩි කුට්ටම 1, කමිසබොත්තම 3. |
| හින්රිස් හාමි | 8. 9.59 | 159 | 203 53 | — |
| ඩී. ඇස්. ගලගෙදර | 22. 5.59 | 162 | 2 75 | — |
| ඇර්. ඇල්. ජේම්ස් අප්පු | 13. 5.59 | 163 | 26 | — |
| ඇර්. ඒ. කොර්නේලිස් අප්පු | 24. 5.59 | 164 | 3 75 | — |
| ටී. ඩබ්ලිව්. කේ. සුමනදාස | 13. 5.59 | 165 | 35 | — |
| ඇස්. කේ. ඩීඩින් අල්විස් | 4.11.59 | 166 | 15 0 | — |
| ඒ. මොහමඩ් | 31. 1.60 | 181 | 2 0 | — |
| ඇන්. එක්. රාජදොරේ | 27. 5.60 | 196 | 4 53 | අත් ඔරලෝසු 1, රෝසරි 1 යි. |
| මරියන් ප්‍රනාන්දු | 21. 5.60 | 198 | — | කරාබු කුට්ටම 1 යි. |
| මරියා පිංගේරා | 3. 3.60 | 199 | — | රිදී වලලු 2 යි, කරාබු 2 යි. |
| නම නොදනී | 11. 6.60 | 200 | 15 25 | — |
| සී. ප්‍රනාන්දු | 6. 7.60 | 202 | 25 0 | — |
| නම නොදනී | 5.11.60 | 223 | 2 45 | — |
| ඇස්. ඇස්. හමීඩ් | 7. 1.61 | 232 | 14 10 | — |
| ඇස්. ජේම්ස් | 15. 2.61 | 236 | 180 0 | — |
| නම නොදනී | 8. 2.61 | 237 | 15 0 | — |
| අන්තෝනි අප්පු | 18. 5.61 | 244 | 15 0 | — |
| ටී. කාලිදසන් | 22. 5.60 | 256 | 5 0 | පොකැට්ටු 1, සුරු 1 යි. |
| එච්. ජේම්ස් | 12. 2.62 | 265 | 5 09 | — |
| රිචඩ් | 4. 3.62 | 274 | 21 65 | — |
| ඒලියන් | 4. 3.62 | 282 | 2 11 | — |
| ජේ. ඒ. ධර්මසේන | 21.12.62 | 289 | 315 0 | — |
| ටී. ඇර්. ජයහේන්රිස් සිංඤෝ | 19.11.62 | 290 | 20 0 | — |
| ජේ. ඒ. ධර්මසේන | 21.12.62 | 291 | — | ඇනිකා අත් ඔරලෝසු එකයි. ගල් බැදි මුදු දෙකයි. |
| පී. ඇම්. ඇම්. ඉස්මායිල් | 25. 1.63 | 293 | 70 0 | බියුලර් අත් ඔරලෝසු එකයි. |
| පී. ඒ. වික්‍රමරත්න | 15. 2.63 | 295 | 103 0 | — |
| කරලිනා නෝනා | 7. 1.63 | 296 | 28 75 | — |
| ඇස්. ඒ. ඩී. ඊ. ජයතිලක | 12. 3.63 | 297 | 15 0 | — |
| ලෝරන්ස් | 4. 3.63 | 298 | 24 58 | — |
| අබ්දුල් හමීඩ් | 1. 8.63 | 302 | 23 55 | — |
| ඇස්. මදනි | 18.11.63 | 306 | 14 62 | — |
| පී. කුසුමදාස | 14. 5.64 | 316 | 7 0 | — |
| පී. ජෝසප් | 14. 5.64 | 317 | 1 34 | — |
| රාමසාමි | 14. 5.64 | 318 | — | සුදු චේන් එකයි. |
| වී. එඩ්වින් පෙරේරා | 2.10.64 | 329 | 45 0 | — |
| ඇර්. ඒ. ජෝන් පෙරේරා | 13.11.64 | 1 | 21 90 | — |

11-401—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

## අලි පැටවෙකු ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

1965 නොවැම්බර් මස 27 වැනි සෙනසුරාදා පෙරවරු 10 ට දෙහිවල සත්වෝද්‍යානයේදී අඩි 3 අඟල් 2 ක් උසැති අලි පැටවෙකු ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙම සතා කවර දිනකදී වුවත් පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා වූ කාලය තුල සත්වෝද්‍යානයේදී පරීක්ෂා කළ හැකිය.

වෙන්දේසිය අවසන් වූ වහාම සම්පූර්ණ මුදල් ගෙවා එම සතා සත්වෝද්‍යානයෙන් පිටතට ගෙන යා යුතුය.

ඩබ්. එල්. ඊ. ද අල්විස්,
අධ්‍යක්ෂ.

1965 නොවැම්බර් 6 දින,
සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව,
දෙහිවල.

11-434—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

## තොටුපල් රේන්ද විකිණීම—රත්නපුර දිස්ත්‍රික්කයේ නිරිවෑනකැටිය-අගලවත්ත ප්‍රසිද්ධ පාරේ කුකුලේගම ගමේ කුකුලේ ගඟ හරහා ඇති තොටුපල

රත්නපුර දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්තතුමා විසින් සියළුම තොටුපලවල් රේන්ද විකිණීමේ පොදු කොන්දේසි මාලාවට යටත්ව 1966 ජනවාරි මස 1 වෙනි දින පටන් 1966 දෙසැම්බර් මස 31 වෙනි දින තෙක්වූ කාල පරිච්ඡෙදය වෙනුවෙන් පූර්වෝක්ත රේන්දය විකිණීම සඳහා වූ ටෙන්ඩර් පත්‍ර 1965 දෙසැම්බර් 2 වෙනි දින පෙරවරු 11ට විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලබන වේලාවේදී, එනම් පෙරවරු 11.30ට ටෙන්ඩර් කරුවන්ටද එහි සිටීමට ඉඩ දෙනු ලැබේ.

2. කුකුළු කෝරළය තුළ පිහිටා ඇති පහත සඳහන් අයගෙන්ද ටෙන්ඩර් භාර ගන්නවා ඇත :—

(ඒ) සමුපකාර තොග වෙළඳ ආයතනයන්

(බී) වෙනත් රජයේ වෙළඳ සංස්ථාවන්ගෙන්

(සී) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂතුමා විසින් අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිතිවලින්

(ඩී) සමුපකාර රෙජිස්ට්‍රාර් විසින් ලේඛනගත කරන ලද විවිධ සේවා සමුපකාර සමිති සහ විවිධ සේවා සමුපකාර සංගම් ඇතුළු සමුපකාර සමිතිවලින්.

ඉහත සඳහන් සංස්ථාවන්ගෙන් ටෙන්ඩර් තැන්පත් මුදලක් අවශ්‍ය වන්නේ නැත.

3. පයින් ගමන් කරන මගීන් මෙන්ම බර වාහනාදියද ගෙන යාමට පාලම් පාරුවක් පිළිගත් ටෙන්ඩර්කරුට සපයනු ලැබේ. රේන්දය බල පැවැත්වෙන කාලය තුළදී මේ පාලම් පාරුව හොඳින් අළුත්වැඩියා කොට තබාගැනීම ගැන බදු කරු වග කිව යුතුය.

4. සියළුම ටෙන්ඩර් පත්‍ර ලියුම් කොඳුවල බහා සිල් තබා එවිය යුතුය. ලියුම් කොඳු මුදුනේ වම් කෙළවරෙහි "කුකුලේගම තොටුපල රේන්දය පිළිබඳ ටෙන්ඩරය" යන්න ලියා තිබිය යුතුය. ටෙන්ඩර් පත්‍ර නියමිත වේලාවේදී හෝ ඊට කලින් හෝ කච්චේරියේ ටෙන්ඩර් පෙට්ටියට දැමිය හැකිය.

5. එක් එක් ටෙන්ඩර පත්‍රය වෙනුවෙන් රුපියල් 100ක මුදලක් තැන්පත් කළ යුතුය. මේ මුදල ඕනෑම කච්චේරියක තැන්පත් කොට ඒ පිළිබඳ කුවිතාන්සිය ටෙන්ඩර් පත්‍රයට ඇමිණිය යුතුය. යම් කිසි ටෙන්ඩර කරුවකු නියමිත ඇපය බැඳීම ප්‍රතික්ෂේප කළ හොත් හෝ යම් කිසි ටෙන්ඩර කරුවකුට නියමිත ඇපය බැඳීමට නොහැකි වුවහොත් හෝ ටෙන්ඩර් පත්‍රය සඳහා ඔහු තැන්පත් කළ මුදල රජසන්තක කරනු ලැබේ. එසේම එවැනි කෙනෙකුට මතුවට ආණ්ඩුවේ කොන්ත්‍රාත් ගැනීමට ද ඉඩ දෙනු නොලැබේ. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් විකිණීම පිළිබඳ කොන්දේසි මාලාව අත්සන් කරනු ලැබූවාට පසු අනිත් ටෙන්ඩර් පත්‍ර සඳහා තැන්පත් කරන ලද සියළුම මුදල් ඒ ඒ අයට ආපසු දෙනු ලැබේ.

6. කාල පරිච්ඡෙදය සඳහා වූ ගැනුම් මිලෙන් දහයෙන් පංගුවක් වහාම මුදලෙන් තැන්පත් කරන ලෙස තෝරාගත් ටෙන්ඩර්කරුට නියම කරනු ලැබේ. ටෙන්ඩරය ආණ්ඩුව විසින් භාරගනු ලැබුවහොත් එකී වැඩිම ටෙන්ඩර්කරු වශයෙන් තමා රේන්දය ඉල්ලුම් කළේ යම් මුදලකටද, ඒ මුදල් ගණන නිති පතා ගෙවන බවට හා තමා ගිවිසුමේ සියළුම වගන්ති විධිවූ පරිදි ඉෂ්ට කරන බවට පොරොන්දු වීමේ කොන්දේසි ඇතුළත් බැඳුම්කරයකට ඔහු විසින් අත්සන් කළ යුතුය. එසේම එකී බඳුකරයට විරුද්ධව පවරනු ලබන යම් නඩුවක් වෙතොත් ඒ නඩුව පිළිබඳවූ විනිශ්චයට එකඟ වන බවට ස්වකීය ඇටෝර්නි බලයද නීතියෙන් අනුදත් ආකෘතියේ ප්‍රකාරයට ලියා අත්සන් කර දිය යුතුය. තමාගේ ටෙන්ඩරය භාර ගන්නා ලද බව තමාට දැනුම් දෙනු ලැබූ දිනයේ සිට සති දෙකක් ඇතුළතදී අනුමත කරනු ලබන දේපල ඇපයකින් නම් දොළොස් මාසය වෙනුවෙන් වූ ගැනුම් මිලෙන් හරි අඩක හෝ මුදලෙන් නම් එකී මිලෙන් තුනෙන් පංගුවක හෝ ඇපයක්ද ඔහු විසින් තැබිය යුතුය.

7. ඇප වශයෙන් ඉදිරිපත් කරනු ලබන අයිතිය ඔප්පු හෝ දේපල හෝ පරීක්ෂා කොට ඒ පිළිබඳ සවකීය අදහස ප්‍රකාශ කිරීමත් ඇප බැඳුම්කරය පරීක්ෂා කොට බේරුමක් කිරීමත් සඳහා ආණ්ඩුවේ නීතිඥයන් අය කරන ගස්තුවද, දේපල තක්සේරු කිරීම හා ඇප බැඳුම්කරය ලියාපදිංචි කිරීමට යන වියදම්ද 189 වැනි පරිච්ඡෙදය වන මුද්දර ආඥපනත යටතේ බැඳුම්කරවල මුද්දර ගාස්තුවද ඔහු විසින් ගෙවිය යුතු වන්නේය.

8. ඇප වශයෙන් ඉදිරිපත් කෙරෙන අයිතිය පිළිබඳ වූ සියළුම ඔප්පු සමග ඒ ඒ ඔප්පු අදාල වන ඉඩම් බැඳීම් ආදි අවහිරකම් වලින් තොර බවට ඉඩම් රෙජිස්ට්‍රාර් ගෙන් ලබාගත් සහතිකයක්ද එවිය යුතුය. මේ සහතිකය ලබාගත යුත්තේ ඇපය ඉදිරිපත් කරන පක්ෂයේ වියදමිනි.

9. තමාගේ හෝ තම සේවකයන්ගේ හෝ නොසැලකිල්ල නිසා පාලම් පාරුවට යම් යම් විශේෂ අළුත්වැඩියා කිරීමට අවශ්‍ය වුවහොත් ඊට යන වියදම තෝරා ගත් ටෙන්ඩර්කරු විසින් ගෙවිය යුතුය. එවැනි සියළුම අළුත්වැඩියා කිරීම සඳහා යන වියදම ගෙවන බවට ඇපයක් වශයෙන් ආණ්ඩුවේ ඒජන්ත නියම කරන යම් මුදලක් රේන්දය විකුණනු ලබන දිනයේදීම ඔහු විසින් ගෙවිය යුතුය.

ඩබ්ලිව්. ආර්. පී. තිලකරත්න,
රත්නපුර දිස්ත්‍රික්කයේ රජයේ දිසාපති.

1965 ඔක්තෝබර් 28 වෙනි දින,
රත්නපුර දිසාපති කාර්යාලයේදිය.

11-305—65.11.12 දින අංක 14,554 දරන ගැසට් පත්‍රය

---

සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට සැකසෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට පූර්ව පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති වෙත ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට පුළුවන් නම්).

ගැසට් පත්‍රය ලබාගැනීම් සඳහා දායක මුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී අතට කෙළින්ම ගෙවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායක මුදල් භාරගනු නොලැබේ.

---

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි.